# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

ISSN 1391 - 1031
2011 දෙසැම්බර්
17 වෙළුම 09 කලාපය

ආධාරය රු 30/=

''විප්ලව යනු ඉතිහාසයේ ඇන්ජින් යන්ත්‍ර වෙතියි මාක්ස් කීවේය. විප්ලවය යනු පීඩිත හා සූරාකනු ලබන උන්ගේ ප්‍රීති උත්සව වෙති. නව සමාජ ක්‍රමයක නිර්මාණකයන් වශයෙන් ක්‍රියාශීලී ලෙස ඉදිරියට ඒමට පොදු ජනතාවන්ට විප්ලව කාලයේ තරම් අවස්ථාවට ලැබෙන වෙනත් කාලයක් නොමැත. ක්‍රමිකභාවයේ සීමාසහිත අමන මිනුම් දණ්ඩ අනුව බලනකල, එවැනි කාලවලදී ජනතාව ප්‍රාතිහාර්ය පෑමෙහි සමත් වෙති.''

ලෙනින්
තෝරා ගත් කෘති
3 වෙළුම - පිටුව 120


3 **ධනවාදයේ අර්බුදය**



ධනවාදය බරපතළ ආකාරයෙන් අර්බුදයට යද්දී, ඒ තුළ ධනපති ආණ්ඩුව අර්බුදයට යද්දී එය විවිධ සමාජ බලවේගවලට ...

4 **තරුණ**




ජීවිත සුරක්ෂිත කරන, තරුණ ජවයට, හැකියාවන්ට ඉඩකඩ සලසන මානව හිතවාදී සැබෑ පාලනයක් දිනා ගැනීම උදෙසා ලාංකේය තරුණ පරපුර....

5 **සංවාදය**



පෞද්ගලික විශ්ව විද්‍යාල බිහිවීම වළක්වන්න නම් මේ ආර්ථික ප්‍රතිපත්තිය කරපින්නාගෙන යන ආණ්ඩු පැරදවිය යුතු බව අපේ රටේ ජනතාව...

7 **ඉතිහාසය**




සමාජය විග්‍රහ කිරීමෙන් නොනැවතී එය වෙනස් කිරීම මාක්ස්වාදීන්ගේ කාර්යභාරයයි. එහෙත් එය කළ හැක්කේ ඉතිහාසය ගොඩනැගෙන්නා වූ ආකාරය නිවැරදිව ...

8 **ජ.වි.පෙ. යළි ගමන් අරඹයි**



‍තුරා විසින් විනාශ කිරීමට ‍ත්සාහ කළ ජ.වි.පෙ. යළි ගොඩනැගිය යුතුව...

9 **දෙවැනි ඉනිමට**



එසේ අය කිරීමේ ශාස්තු ඉහළ දමා ආණ්ඩුව ආදායමක් උපයා ගත්තද විදේශගතව රැකියා කරන ලක්ෂ....

දැනුම ....................10
කාලීන ....................11
කාන්තා....................12
ජාත්‍යන්තර.............13
විශේෂ.....................14


## ඔබ සිහිනය ඉටුවෙන හෙට පැහැබරය...



හදවත් පුරවාගත් හැඟුමන් සහිතව දහස් සංඛ්‍යාත මිනිසුන් රොද බැඳීමට සැලැස්වීම පහසු දෙයක් නොවේ. විශේෂයෙන් ජීවිතයෙන් සමුගැනීමෙන් වසර 22ක් ගතවද්දීත් මිනිසුන් ඒ මරණයන් පිළිබඳ සිහිපත් කරලීමට, මියගියවුන්ගේ අරමුණු හඹා යාමට පෙළඹවීමට හැකිනම් ඒ මරණයන් හිමි මිනිසුන් සැබෑ විප්ලවවාදීන්ම විය යුතුය.

ඒ, ඉල් මහ විරුවන් හැරෙන්නට අන් කිසිවෙක් නොවෙති. ඔවුන් තම මරණය අබියසදී පවා දුටු රතු ලොවක් පිළිබඳ සිහිනය සැබෑ කරවන ලාංකේය නිර්ධන පංති ව්‍යාපාරය වන ජනතා විමුක්ති පෙරමුණ නොවැම්බර් 13වැනි දින කොළඹ විහාරමහාදේවි රංගපීඨයේදී පවත්වන ලද විරු සමරුවට රොද බැඳි ජන ගඟ මෙලෙස දිස්විය.

# රටේ ප්‍රජාතන්ත්‍රවාදය අනතුරේ!

**මහින්ද රාජපක්ෂ පාලනය තුළ ආණ්ඩුවේ නව ලිබරල්වාදී ආර්ථික පිළිවෙතට එරෙහිව නැඟී සිටින ජනබලය මර්දනය කිරීමත් දේශපාලන විරුද්ධවාදීන්ගෙන් පළිගැනීමේ උත්සාහයත් ආණ්ඩුවේ දුබලතා හා අත්තනෝමතිකත්වය හෙළිදරව් කරන ජනමාධ්‍ය හා මාධ්‍යවේදීන් මර්දනයත් උතුරේ ජනතාව මත පවත්වාගෙන මර්දනයත් හේතුවෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම බරපතළ අභියෝගයකට ලක් වී තිබේ.**

හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතා දේශපාලන සිරකරුවෙකු ලෙස දිගින් දිගටම අත්අඩංගුවේ තබා ගැනීම, හිටපු අගවිනිසුරු සරත් එන් සිල්වා මහතාට එරෙහිව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කිරීම ඇතුළු දේශපාලන විරුද්ධවාදීන්ගෙන් පළිගැනීම් ආණ්ඩුව විසින් ඉදිරියට ගනු ලැබ ඇත.

මාධ්‍යවේදී එක්නැලිගොඩ අතුරුදහන් වී ඇති අතර තවත් මාධ්‍යවේදීහු පිරිසක් ජීවිතාරක්ෂාව පතා රට හැර ගොස් සිටිති. මාධ්‍ය ආයතනවලට ආණ්ඩුවේ ප්‍රධානීන්ගෙන් බලපෑම් එල්ලවෙමින් ඇති අතර ආණ්ඩු විරෝධී පුවත් පළකළ වෙබ් අඩවි 05ක්ද ශ්‍රී ලංකාව තුළ තහනම් කරනු ලැබ තිබේ.

යුද්ධය අවසන් වී වසර 2 1/2ක් කට වැඩි කාලයක් ගතවී තිබුණද උතුරේ ජනතාව පීඩාවට පත්වන පරිසරය ඉවත්වී නොමැත. මාධ්‍යවේදීන්, ශිෂ්‍ය ක්‍රියාකාරීන් මහදවාලේ මැර ප්‍රහාරවලට ලක්වන අතර ඒ පිළිබඳව වගකිව යුත්තන් හඳුනා ගැනෙන්නේ නැත. දහස් සංඛ්‍යාත සිවිල් වැසියන්ගේ ජීවිත යථා තත්වයට ගෙන ඒමට ආණ්ඩුව අපොහොසත් වී ඇත. අත්අඩංගුවට පත් වූවන් හෝ අතුරුදහන් වූවන් පිළිබඳ විස්තර ලබාදීමට ආණ්ඩුව කටයුතු කර නැති අතර අනිවාර්ය ලියාපදිංචිය, සිවිල් කටයුතු සඳහා හමුදා මැදිහත්වීම් වැනි හිතුවක්කාරී ක්‍රියා හේතුවෙන් උතුරේ ජනජීවිතය අවිනිශ්චිතභාවයට ඇද දමා තිබේ.

ආණ්ඩුවේ නව ලිබරල්වාදී ප්‍රතිපත්ති සමඟ ගැටෙන බලවේගවලට එරෙහිව මර්දනය කැඳවීමේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගයේ අලුත්ම ගොදුර වූයේ, පසුගිය 30 වැනි දින රැකියා ඉල්ලා වීදි බැසි සමාජවාදී තරුණ සංගමයේ විරෝධතා පා ගමනයි. ආණ්ඩුව ඊට පොලිසිය යොදා පහර දුන් අතර කඳුළු ගෑස්, අධිපීඩන ජල ප්‍රහාර හා පොලු ප්‍රහාර හේතුවෙන් විශාල පිරිසක් තුවාල ලබා තිබිණි.

ආණ්ඩුවේ මෙම ගමන පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දුන් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී දේශපාලනය පැරදවීම සඳහා පුළුල් ජනතා බලවේග ඒකරාශී කිරීමට ජ.වි.පෙ. කටයුතු කරන බවත් ඒ සඳහා ජ.වි.පෙ. මූලිකත්වයෙන් පිහිටුවා ඇති ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජනතා ව්‍යාපාරයෙන් ඉදිරියේ වැඩකටයුතු රැසක් දියත් කිරීමට අපේක්ෂිත බවත් කියා සිටියේය. ''ප්‍රජාතන්ත්‍රවිරෝධීව ජනතාව මර්දනය කරමින් ගිය ආණ්ඩුවලට උරුම වූයේ ඉතිහාසයෙ කුණු බක්කියයි'' ඔහු අවධාරණය කළේය.

# වැඩ බිම



## සුවසේවා සංගමයේ 14 වන සමුළුව මුළුදෙයි




සමස්ත ලංකා සුවසේවා සංගමයේ 14 වන වාර්ෂික සමුළුව දෙසැම්බර් 01වැනි දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.
'වැඩකරන ජනතා බලයක් ගොඩනැගීමට, අයිතීන් දිනාග ැනීමට එක්ව සටන් වදිමු' යන තේමාව යටතේ මුළුදුන් මෙම වාර්ෂික නියෝජිත සමුළුවේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති, ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත  සහෝදරයා සහභාගි විය. කඩාකප්පල්කාරීන් කිහිප දෙනෙක් මෙම සමුළුව අඩාල කිරීම සඳහා උත්සාහ දරා තිබුණද ඒ සියලු ප්‍රයත්න නිෂ්ප්‍රභා කිරීමට හැකි වූ බව සුව සේවා සංගමයේ නියෝජිතයෙකු නියමුවා වෙත පැවසීය.

## වරායේ ජ.වි.පෙ. 'අපේ කණ්ඩායමට' විශිෂ්ට ජයක්




පසුගිය නොවැ. 22 දින පැවති වරාය සේවක සුභසාධන සමූපකාර සමිතියේ මහා සභා නිලවරණයෙන් ජ.වි.පෙ. ට සම්බන්ධ වරාය වෘත්තීය සමිතිය වන සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමය ඉදිරිපත් කළ 'අපේ කණ්ඩායමට' විශිෂ්ට ජයක් හිමිව තිබේ.

වරාය තුළ විවිධ කොට්ඨාස නියෝජනය කරමින් නියෝජිතයින් පත්කරන මෙම සභා නිලවරණයේදී ජ.වි.පෙ. ට සම්බන්ධ වෘත්තීය සමිතිය විසින් නියෝජිතයින් 81 ක් ඉදිරිපත් කර තිබූ අතර ඉන් 72 ක්ම තේරී පත්ව සිටිති.

ඒ අනුව එම සුභසාධන සංගමයේ සම්පූර්ණ බලය ජ.වි.පෙ. ට සම්බන්ධ 'අපේ කණ්ඩායමට' හිමිව තිබේ.

ආණ්ඩුවට සම්බන්ධ වෘත්තීය සමිතිවල කණ්ඩායම්ද මෙම නිලවරණයට ඉදිරිපත්ව සිටි අතර ආණ්ඩුවේ ප්‍රබල දේශපාලඥයින්ගේ අනුග්‍රහය ලබමින් ඔවුන් විසින් ජ.වි.පෙ. කණ්ඩායමට එරෙහිව දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් අරඹා තිබූ අතර ජ.වි.පෙ. 'අපේ කණ්ඩායම' පරාජය කිරීම සඳහා විවිධාකාරයේ බාධා කිරීම්, බිය ගැන්වීම් හා අවලාද ව්‍යාපාරයක්ද දියත්කොට තිබුණි. එහෙත් මේ සියලු අභියෝග මැද 'අපේ කණ්ඩායම' දිනවීම සඳහා ධෛර්යයෙන් යුතුව ඡන්දය දුන් සුභසාධන සංගමයේ සියලුම සාමාජික සාමාජිකාවන්ට තම උණුසුම් ප්‍රණාමය පුද කර සිටින බව සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයේ සභාපති චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා ප්‍රකාශ කර සිටියි.

## බලහත්කාර විශ්‍රාමය නවතනු! ඉංජිනේරු සංස්ථා සේවක උද්ඝෝෂණ




තවදුරටත් සේවය කිරීමට හැකියාව තිබියදී ඉංජිනේරු සංස්ථා බලධාරීන් විසින් මේ වන විට සංස්ථාවේ පැරණි හා පළපුරුදුම සේවක කොට්ඨාසය වන අවුරුදු 57 සම්පූර්ණ වූ සේවකයින් බලහත්කාරයෙන් විශ්‍රාම ගැන්වීමට කටයුතු කරමින් සිටින බවට චෝදනා කරන ඉංජිනේරු සංස්ථා සේවක වෘත්තීය සමිතිය  බලධාරීන්ගේ මෙම තීරණයට විරෝධය දැක්වීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂණ ව්‍යාපාර අරඹා ඇති බව වාර්තා වේ.

සේවක ප්‍රතිපාදනයට පරිබාහිරව සීමාවකින් තොරව සංස්ථාව වෙත පිරිස් බඳවා ගැනීමට එරෙහිවත්, විවිධ වරදාන ලබාදෙමින් අයථා ලෙස බඳවා ගත් එහෙත් මෙතෙක් සංස්ථාවේ කිසිදු වැඩබිමක හෝ කාර්යාලයක සේවයේ නොයෙදෙන 50 කට අධික පිරිසක් වෙත වසරකට අධික කාලයක් තිස්සේ සංස්ථාව විසින් වැටුප් හා දීමනා ගෙවීමට විරෝධය දැක්වීම සඳහාත් සංස්ථා මුදල් හා දේපළ පටු අරමුණු වෙනුවෙන් යෙදවීම සහ දේශපාලන හිතවතුන්ගේ පරිහරණය සඳහා ලබාදී ඇති සංස්ථා වාහන හා සංස්ථාව වෙත කුලී පදනම මත ලබාගත් 15 කට අධික වාහන  ප්‍රමාණය සංස්ථාව වෙත නැවත ලබාගන්නා ලෙසත් ඉහළ යන ජීවන වියදමට සාපේක්ෂව සංස්ථා සේවකයින් ගේ වැටුප් වැඩිකරන ලෙසත් බලකරමින් කෑම පැයේ උද්ඝෝෂණ පැවැත්වීමට එම වෘත්තීය සමිති එකමුතුව කටයුතු යොදා ඇත.

## වතු කම්කරු ජනතාව නොසලකාහැරි ආණ්ඩුවට වතු කම්කරු සංගමයේ  විරෝධය

මූලික මිනිස් අයිතිවාසිකම් පවා ලබා නොදී අවුරුදු 180 ක් සූරාකෑමට ලක්කළ වතු කම්කරු ජනතාව පිළිබඳ මෙවර අයවැයෙන් කිසිදු අවධානයක් යොමු නොකිරීම පිළිබඳ අපේ දැඩි විරෝධය ආණ්ඩුවට පළ කරමු යැයි සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා විසින් නිකුත් කළ නිවේදනයක සඳහන්ය.

එම නිවේදනයේ මෙසේද සඳහන්ය.

පසුගිය අයවැයෙන් වතු කම්කරුවන් පිළිබඳව සඳහන් කිරීමට හෝ උත්සාහ කළද මෙම අයවැය ලේඛනයෙන් එම බොරුව හෝ නොකිරීමට තරම් වතු කම්කරු ජනතාව නොසලකා හැර ඇත. මැතිවරණ සමයේදී සිංහල හා දෙමළ ධනපති නායකයන් ඡන්ද ගැනීමට පමණක් වතු කම්කරුවන් සොයායෑම පුරුද්දක් කරගෙන සිටිති.ගෙවී ගිය වසර 63 පුරාම මෙම කටුක අත්දැකීමට වතු කම්කරු ජනතාව මුහුණ දුන්හ. වතු කම්කරු ජනතාව අතරට පැමිණි වෙනත් කිසිදු ජන නායකයෙකු නොකළ ආකාරයට ඔවුන්ගේ දරුවන් අතගා සංවේදී නායකයෙකු බව පෙන්වීමට වත්මන් ජනාධිපතිවරයා ක්‍රියාකළ අයුරු අපට මතකය.

එහෙත් බලය ලබාගැනිමෙන් පසු පළමුවෙන්ම පාන්පිටි මිළ රු 40 කින් පමණ වැඩිකර ඔවුන්ගේ මූලික ආහාරය ලබාගැනීම පවා බරපතළ දුෂ්කරතාවයකට ඇද දැමීය. 2011 මාර්තු මාසයෙන් පසු පිටි කිලෝවක් රු 12.50 කින් හා භූමිතෙල් ලීටරයක් රු 20 කින් ඉහළ දැමු අතර අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ මිළද ඉහල දැමූ ආණ්ඩුව වතු කම්කරු ජනතාවට මරු පහරක් එල්ල කළේය.

වතු ජනතාවගේ සෞඛ්‍ය පහසුකම්, ප්‍රවාහන පහසුකම් සහ අධ්‍යාපනය වැනි කිසිදු සුභසාධනයක් සැලසීම අතහැර දමා ඇත. එවැනි පසුබිමක අධිවේගයෙන් ඉහළ නගින ජීවන වියදම නිසා දැඩි පීඩනයකට පත්ව සිටින වතු කම්කරු ජනතාව තවදුරටත් පීඩාවට පත්කර දමා නිහඬව සිටීමට ආණ්ඩුවට අයිතියක් නැති බව අවධාරණයෙන් මතක් කරමු. මේ වනවිට පවුලක මාසික වියදම රුපියල් 42,000 ක් ඉක්මවා තිබියදී දින 30 ක්ම වැඩ කළද වතු කම්කරුවන්ට ලැබෙන්නේ රුපියල් 11,500 ක් වැනි මාසික ආදායමකි. මේ මුදලෙන් පවුලක් නඩත්තු කරන්නේ කෙසේදැයි ආණ්ඩුවෙන් ප්‍රශ්න කිරීමට සිදුවී තිබේ. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව දක්වන නිහැඩියාව අප සංගමයේ දැඩි පිළිකුලට හා හෙළාදැකීමට හේතුවී ඇත.

වතු කම්කරුවන් මුහුණපා සිටින කිසිම ප්‍රශ්නයකට අවම හෝ විසඳුම් ලබාදීමට කටයුතු කර නැති මේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගවලට එරෙහිව දැඩි වෘත්තිය ක්‍රියාමාර්ග ගැනීමට පසුබට නොවන බවද අනතුරු හඟවමු. එමෙන්ම ආණ්ඩුව විසින් අයවැයෙන් නොසලකාහැරි වතු කම්කරු ජනතාව, නැවත නැවත රවටමින් ඔවුන්ගේ ශ්‍රමය තුට්ටුදෙකට කොල්ලකමින් සිටීම හා ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන්  සඳහාවත් අවධානය යොමුනොකර සිටීම පිළිබඳව සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ  විරෝධය ප්‍රකාශකර කර සිටින අතර වහාම වතු කම්කරුවන් සම්බන්ධයෙන් අවධානය යොමුකර ඔවුන් හට සහන ලබාදීමට කටයුතු කරන ලෙස බලකර සිටිමු.

## සාමකාමී පාගමනට එල්ල කරන ලද ආණ්ඩුවේ අමානුෂික ප්‍රහාරය හෙළාදකිමු.

**සමාජවාදී තරුණ සංගමය**

රැකියා ඉල්ලා උද්ඝෝෂණය කළ තරුණ කරුණියන්ට ආණ්ඩුව විසින් පහරදීම  හෙළා දකිමින් සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා විසින් දෙසැම්බර් 01වැනි දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය.

එය සම්පූර්ණයෙන් මෙසේය.

අයවැය මගින් රැකියා විරහිත තරුණ තරුණියන්ගේ ගැටලු නොවිසඳීමට එරෙහිව සමාජවාදී තරුණ සංගමය විසින් ඊයේ (30) කොළඹදී සංවිධානය කරන ලද සාමකාමී පාගමනට ආණ්ඩුව විසින් පොලීසිය ලවා අමානුෂික ලෙස පහර දෙන ලදී. සමාජවාදී තරුණ සංගමය ලෙස අපි ආණ්ඩුවේ මෙම ම්ලේච්ඡ පොලිස් ප්‍රහාරය දැඩිව හෙළා දකිමු.

රැකියා විරහිත උපාධිධාරීන්, රැකියා විරහිතයින් හා වසාදමන ලද කර්මාන්ත ශාලාවලින් පාරට වැටුනු කම්කරුවන් ඇතුළු තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවක් මෙම සාමකාමි විරෝධතා පාගමනට එක්ව සිටියහ. සාමකාමි විරෝධතාවකට පවා ඉඩනොදෙන ආණ්ඩුව, තම දුක්ගැනවිල්ල මුදල් අමාත්‍යංශයට ඉදිරිපත් කිරීමට ඉඩ නොදී, අතරමගදී ඔවුනට අමානුෂික ලෙස පහර දීමට කටයුතු කළේය. මෙම ප්‍රහාරයෙන් පහළොස්දෙනෙකුට වැඩි පිරිසක් තුවාල ලබා ඇත.

මෙම තරුණයින් වීදිබැස හඬ නැගුවේ, මාසයකටත් වැඩි කාලයක් තිස්සේ ආණ්ඩුවට තමන්ගේ ප්‍රශ්න ඉදිරිපත්කිරීමෙන් අනතුරුව ඒවාට කිසිඳු විසඳුමක් ලබාදීමට ආණ්ඩුව කටයුතු නොකළ නිසාය. රැකියා ලබාදෙන බවට 2011 අයවැය මගින් ද පොරොන්දු වී එය නොසලකා හැර තිබූ අතර 2012 අයවැය මගින් හෝ මෙම ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන ලෙසට ඉල්ලා තිබිණි. එහෙත් ආණ්ඩුව 2012 අයවැය මගින් රැකියා ලබා දීම පිළිබඳව වචනයක් හෝ සඳහන් නොකර මගහැරියේය.

ලක්ෂ සංඛ්‍යාත තරුණ පිරිසක් ජීවත්වීමේ මාර්ගයක් ඉල්ලා හඬනගද්දී එය නෑසූ කන්ව සිටීමට තරම් ආණ්ඩුව තක්කඩි ලෙස බිහිරිබවක් පෙන්වා තිබේ. එතැනින් නොනැවතුණු ආණ්ඩුව සාමකාමී විරෝධතා පාගමනක නිරතවූ තරුණ තරුණියන්ට පහරදී තමන්ගේ ම්ලේච්ඡත්වයද ප්‍රදර්ශනය කර ඇත.

සමාජවාදී තරුණ සංගමය ලෙස අප ආණ්ඩුවට අවධාරණය කරන්නේ, මෙලෙස මර්දනයෙන් තරුණයන්ගේ ප්‍රශ්න යටපත්කර දැමීමට හැකි යැයි සිතන්නේනම් එය බරපතළ මුලාවක් පමණක් වන බවය. තරුණ තරුණියන්ගේ ප්‍රශ්න නොසලකන ආණ්ඩුවේ තක්කඩි හැසිරීමටත් ජනතා මර්දනයටත් එරෙහිව සටන්වැදීමට අප සමග අත්වැල් බැඳගන්නා ලෙස රටේ සමස්ත ප්‍රගතිශීලී ජනතාවගෙන් අප මහත් ඕනෑකමින් ඉල්ලා සිටිමු.

## කඩදාසි කම්හල තුට්ටු දෙකට විකිණීම ජාතික අපරාධයකි

**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

ඇඹිලිපිටිය කර්මාණ්ත ශාලාව ඕස්ට්‍රේලියාවේ සමාගමක් වෙත නොවටිනා මුදලකට විකුණා දැමීම පිළිබඳව මහින්ද රාජපක්ෂ ආණ්ඩුවම ලැජ්ජා විය යුතුව ඇතැයි ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා පසුගිය 15වැනිදා මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් චෝදනා කළේය.

එහි නිවේදනයේ මෙසේද සඳහන්ය.

ජාතික කඩදාසි සංස්ථාවට අයත් ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව ආණ්ඩුව විසින් ඕස්ට්‍රේලියාවේ පර්ත් ඉංජිනියරින් සමාගම වෙත 30 අවුරුදු කාලයක් සඳහා බදු දෙනු ලැබ තිබේ. රාජ්‍ය ව්‍යවසාය හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය දයාශ්‍රිත තිසේරා මහතා අද (15) මාධ්‍ය වෙත මහත් ආඩම්බරයෙන් යුතුව පවරා දැමූ බව කියා සිටින නමුත් රටට අයත් අමිල සම්පතක් මිලියන 600ක් තරම් සුළු මුදලකට විදෙස් සමාගමකට පවරා දීම පිළිබඳව මහින්ද රාජපක්ෂ ආණ්ඩුවම ලැජ්ජා විය යුතු බව අපගේ විශ්වාසයයි.

ඉහළම තත්වයේ ගුණාත්මකභාවයකින් යුත් කඩදාසි නිෂ්පාදන හැකියාවක් සහිත යන්ත්‍රසූත්‍ර පද්ධතියකින් යුත් මෙම සමාගමත් අක්කර 250කට වැඩි භූමියත් තුට්ටු දෙකක මුදලකට විකුණා දැමීම මගින් ආණ්ඩුව ආණ්ඩුව තමන් අනුගමනය කරමින් සිටින කොල්ලකාරී ආර්ථික පිළිවෙත නැවත වරක් ප්‍රදර්ශනය කර තිබේ. එසේම එම සමාගමේ සේවය කළ සියලු සේවක සේවිකාවන් දොට්ට දැමීමට පියවර ගැනීමෙන් ආණ්ඩුව තමන්ගේ කම්කරුවිරෝධී පිළිවෙත ද ප්‍රකට කර තිබේ. රුපියල් මිලියන 600ක පැවරීමේ ගිවිසුමෙන් ආණ්ඩුවට දැනට ලැබෙන්නේ, රුපියල් මිලියන 400ක් පමණි. එනම් කෝටි 40ක මුදලකි. එහෙත් ගාල්ල කොට්ටාව අධිවේගී මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදි කිරීම වෙනුවෙන් රටට වැය වී ඇති මුදල කෝටි 77කි. එසේ වී තිබියදී කඩදාසි කම්හලේ අයිතිය 30 අවුරුද්දකට පවරා කෝටි 40ක් ලබාගැනීමේ ජාතික අපරාධය පිළිබඳ පුරසාරම් දෙඩීම කෙතරම් ව්‍යාජයක් ද යන්න ජනතාව විසින් ගැඹුරින් සලකා බැලිය යුතුව තිබේ. අනෙක් අතට රාජපක්ෂ ආණ්ඩුව අනුගමනය කරමින් තිබෙන නව ලිබරල්වාදී උපාය මාර්ගය තුළ ආණ්ඩුව මැතිවරණයේදී ජනතාවට අලෙවි කළ ඊනියා ජාතික ආර්ථික පිළිවෙත හා දේශප්‍රේමය සරදමට ලක්වී ඇති ආකාරය පැහැදිලිය. සියලු සළු උනා දමා විදෙස් ජාවාරම්කරුවන්ට රටේ සම්පත් තුට්ටු දෙකට විකුණා දැමීම තමන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය බවට පත්කරගෙන සිටින ආණ්ඩුව තම එදිනෙදා යැපීම සඳහා මිල කළ හැකි සියල්ල විකිණීමට සූදානම් බව දැනටමත් ප්‍රකාශයට පත් කොට තිබේ. අගනුවර වටිනා ඉඩම්වල සිට අනුරාධපුරයේ වැව් ජලය සහ නැගෙනහිර වෙරළේ වටිනා ඉඩම් දක්වා පමණක් ආණ්ඩුවේ වෙන්දේසි කිරීම් සීමා වී නැත. අද ඇඹිලිපිටිය විකුණා දමන ආණ්ඩුව හෙට කන්තලේ සීනි කම්හලත් කන්කසන්තුරේ සිමෙන්ති කම්හලත් ඒවාට අයත් විශාල ඉඩම් ප්‍රමාණයත් විකුණා දැමීමට ගැණුම්කරුවන් සොයමින් සිටී. එසේ කරනු ලබන්නේ පාඩු ලබන පෞද්ගලික ව්‍යාපාර රජයට පවරා ගන්නා බවට වන ඊනියා ජාතික වාදී සටන්පාඨ අලෙවිකරමින් සිටින අතරතුර වීම උපදවන්නේ හාස්‍යයක් මිස අන් යමක් නොවේ.

ආණ්ඩුව තමන්ගේ සැබෑ ආර්ථික පිළිවෙත තවදුරටත් සැඟවීමකින් තොරව කටයුතු කිරීම පිළිබඳව එක් අතකින් සතුටුවිය හැකි නමුදු රටේ මිල කළ නොහැකි සම්පත් ජනතාවට අහිමි කරමින් විදේශීය සමාගම් වෙත තුට්ටු දෙකට පවරාදීම අතිශය බරපතළය. මේ අවදානම තේරුම් ගනිමින් ආණ්ඩුවේ මෙම කොල්ලකාරී ආර්ථික ගමන පරාජය කොට රටේ සම්පත්වල සැබෑ හිමිකරුවන්ට ඒවායේ ප්‍රතිලාභ අත්පත් කර ගත හැකි සමාජ ක්‍රමයක් වෙතට මාරුවීම සඳහා වහ වහා පෙළ ගැසෙන ලෙස සියලු ලාංකේය ජනතාවගෙන් මහත් ඕනෑකමින් ඉල්ලා සිටිමු.



# ධනවාදයේ අර්බුදය හා අවස්ථාවාදයේ රංචු ගැසීම

2008 සැප්තැම්බරයේ ඇමරිකා එක්සත් ජනපදයේ මූල්‍ය සමාගම් බැංකු හා කර්මාන්ත බිඳවට්ටමින් ආරම්භ වූ දැවැන්ත ආර්ථික අවපාතය බලගතු ධනපති රටවල නායකයන්ගේ, ආර්ථික විශේෂඥයින්ගේ සියලු බලාපොරොත්තු බිඳ දමමින් සියලු අනාවැකි බොරු කරමින් තවදුරටත් හමා යමින් තිබේ. එකී ආර්ථික අවපාතයේ කුණාටුවට හසුවී ප්‍රබල ධනපති රටවල පාලනයන් දෙදරා යද්දී මිලියන ගණන් ජනයාට වීදිවලට බැසීමට, අරගල කිරීමට බලකරනු ලැබ තිබේ. යුරෝපය පුරා මේ දිනවල සිදුවන උද්ඝෝෂණ, පෙළපාලි හා විරෝධතා මගින් පෙන්නුම් කරනුයේ, අධිරාජ්‍යවාදය නව ලිබරල් ආර්ථික ක්‍රමය තුළ මුහුණදී ඇති අර්බුදයේ බරපතළකමයි.

ධනවාදය මුහුණ දෙන ආර්ථික අර්බුදයන් ගැන කතාකරන විට පසුගිය කාලයක් තිස්සේ අපේ රට තුළ කතාබහට ලක්වූ ප්‍රසිද්ධ කියමනක් තිබේ. ඒ ''ඇමරිකාවට එංගලන්තයට හෙම්බිරිස්සාව හැදෙනවිට අපේ රටවලට නිව්මෝනියාව හැදෙන්නේය'' යන්නය. එහි සත්‍යයක් තිබේ. දියුණු ධනපති රටවල ආර්ථිකයේ කිසියම් අර්බුදයක් හටගන්නා විට එම රටවල්වලට පරාධීනව පවතින පරිධියේ රටවලට එය වැඩි ප්‍රමාණයකින් දැනේ. මේ මොහොත වන විට බලගතු ධනපති රටවලට 'නිව්මෝනියාව' වැළඳී තිබේ. ඒ අනුව ලංකාව වැනි රටවල ආර්ථිකය 'මරණ මංචකයට' ඇදවැටීම වැළැක්විය නොහැක.

මේ වනවිට සමාජ ක්‍රමයක් ලෙස ලංකාවේ ධනපති ක්‍රමය පවතින්නේ ඉතාම බරපතළ අර්බුදයකය. කලක් බෙදුම්වාදයට එරෙහි යුද්ධය යොදාගනිමින්ද පසුව යුද්ධය නිමාවීමේ වාසිය යොදාගනිමින්ද සමාජ ආර්ථික ප්‍රශ්න යටපත් කොට තබාගැනීමට රාජපක්ෂ ආණ්ඩුව සමත්වුවද මේ වනවිට සමාජ ආර්ථික ප්‍රශ්න මතුවෙමින් ඒවාට පිළිතුරු නොමැති බව තහවුරු මේන් පවතී. ඒ අනුව ධනපති ක්‍රමය මෙන්ම රාජපක්ෂ පාලනයද අර්බුදයට පත්වෙමින් තිබේ. දැන් ලංකාවේ ආර්ථිකය පවතින්නේ ඉතා බරපතළ අර්බුදකාරී තත්වයකය. ලංකාවේ රාජ්‍ය ආදායමෙන් 80% වඩා බදු මත හා දඩ මත පැවතීම විසින් එහි බරපතළකම පෙන්නුම් කෙරේ. එසේම රට මත ගොඩගැසී ඇති ණය කන්දරාවද අතිවිශාලය. ආණ්ඩුව දැන් ණය ගනු ලබන්නේ කලින් ගත් ණයවල වාරික හා පොලී ගෙවීම සඳහාය. එසේ තිබියදී ඉදිරි වසර සඳහාද රුපියල් කෝටි එක්ලක්ෂ පහළොස් දහසක ණය ගැනීමට, අයවැය විසර්ජන කෙටුම්පත මගින් ආණ්ඩුව යෝජනාකර තිබීමෙන් අර්බුදයේ තරම වටහා ගත හැක.

වැඩි පොලියට ලබාගත් ණය මුදල් නාස්ති කිරීම හා ආදායම් නැති සුදු අලි වැනි ව්‍යාපෘතිවලට යෙදවීම නිසා ණය ගෙවීමට නොහැකි අර්බුදයකටද ආණ්ඩුව පත්ව තිබේ. ඒ අනුව ඊට විසඳුම් ලෙස දැන් මුදල් අමාත්‍යාංශයේ පැත්තෙන් යෝජනාවක්ද ඉදිරිපත්වී තිබෙන බව දැන ගන්නට තිබේ. එම යෝජනාවට අනුව විදේශ රටවලින් ණය ගෙන ගොඩනැගූ ව්‍යාපෘතිවල ණය ගෙවීම වෙනුවට එම ණය අදාල ව්‍යාපෘතිය සඳහා වූ ආයෝජනයක් බවට හැරවීම සඳහා අදාල රටවල් සමඟ එකඟතා ඇතිකර ගත යුතුවේ. තවමත් ප්‍රසිද්ධ කර නැති මෙම යෝජනාව ක්‍රියාත්මක වුවහොත් උදාහරණයක් ලෙස හම්බන්තොට වරාය සඳහා චීනයෙන් ලබාගත් ණය එම වරායේ ආයෝජන බවට පත් කෙරේ. එවිට වරායේ අයිතිය චීනයට පැවරේ. නොරොච්චෝලේ විදුලි බලාගාරය සම්බන්ධයෙන් දැනටම මෙවැනි යෝජනාවක් ඉදිරිපත් වී තිබේ. මෙය ක්‍රියාත්මක වූවද නොවූවද මෙවැනි යෝජනාවක් ගෙන ඒමට සිදුවීම විසින්ම පෙන්නුම් කරනුයේ, ආණ්ඩුව මුහුණ පා ඇති මූල්‍ය අර්බුදයේ ප්‍රමාණයයි.

රටේ ආර්ථික අර්බුදයේ බරපතළකම මෙවර අයවැය තුළද දැකිය හැක. බදුවලින් හා ණයවලින් ලබාගන්නා මුදල් ටික අමාත්‍යාංශවල වියදම් සඳහා බෙදාදීම හැරුණු විට අන් යමක් මෙම අයවැය තුළ නැත. ජනතාවට සහන හෝ ආර්ථික සංවර්ධනය සඳහා යෝජනා කිසිවක් නොවීම විසින් රටේ ආර්ථික ගමන්මග හා අනාගතය පිළිබඳ අදහසක් ලබා ගැනීම පහසුවනු ඇත. දුප්පත්කම, විරැකියාව, ප්‍රමාණවත් ආදායම් නොලැබීම, ජීවනබර අධිකවීම, සහන අහෝසි වීම මගින් පොදු ජනයා තුළ බරපතළ පීඩාවක් පැටවෙමින් තිබේ. එම පීඩාව කාලයක් තිස්සේ ජනතාවට දැනෙමින් තිබෙ. එය ධනවාදයේ පීඩාව ලෙස ජනතාවගේ බහුතරය තවම තේරුම්ගෙන නැතත් පීඩාවක් තිබෙන බව ඔවුනට බරපතළ ලෙස දැනී තිබේ. එපමණක් නොව එම පීඩාව හුදකලා හා අහම්බ සිදුවීම් මගින් පුපුරා යමින්ද තිබේ.

මෙම තත්වය තුළ ඕනෑම ධනපති ආණ්ඩුවක මෙන්ම රාජපක්ෂ ආණ්ඩුවද විරුද්ධ මත දරන්නන් මර්දනය කිරීමේ, ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කිරීමේ හිතුවක්කාරී මර්දනකාරී ගමනක් අරඹා තිබේ. සරත් ෆොන්සේකාට යළි සිර දඬුවම් ලබාදීම, හිටපු අගවිනිසුරු සරත් නන්ද සිල්වා මහතාට එරෙහි පරීක්ෂණ කොමිෂන් පත්කිරීමට තීරණය කිරීම, මාධ්‍ය මර්දනය, පාඩු ලබන ව්‍යාපාර පවරා ගැනීමේ පනත ආදිය මගින් මෙය ප්‍රකාශයට පත් වෙමින් තිබේ. වත්මන් ආණ්ඩුවේ සංයුතිය හා චින්තන සම්ප්‍රදායික ධනේශ්වර එකකට වඩා පාදඩකරණයට ලක්වූ එකකි. මෙය ධනපති පංතියේ පාලනයකට වඩා ධනපති ක්‍රමය වෙනුවෙන් පාලනය ගෙනයන මාෆියා කල්ලියක, ලුම්පන් කල්ලියක ලක්ෂණ පෙන්වා තිබේ. මේ නිසා ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීමේ ප්‍රශ්නය ඉතා බරපතළ වී තිබේ.

මෙලෙස ධනවාදය බරපතළ ආකාරයෙන් අර්බුදයට යද්දී, ඒ තුළ ධනපති ආණ්ඩුව අර්බුදයට යද්දී එය විවිධ සමාජ බලවේගවලට දැනීමද ඒ අනුව තම තමන්ගේ පංති අරමුණු සඳහා කටයුතු කිරීමට ඔවුන් ඉක්මන් වීමද දැකිය හැක.

> ධනවාදය බරපතළ ආකාරයෙන් අර්බුදයට යද්දී, ඒ තුළ ධනපති ආණ්ඩුව අර්බුදයට යද්දී එය විවිධ සමාජ බලවේගවලට දැනීමද ඒ අනුව තම තමන්ගේ පංති අරමුණු සඳහා කටයුතු කිරීමට ඔවුන් ඉක්මන් වීමද දැකිය හැක.


පොදුවේ ගත්කල ධනවාදයේ අර්බුදය විසින් මග තනන්නේ සමාජ පරිවර්තනය දෙසටය. එය සමාජවාදී සමාජ පරිවර්තනය බවට පත්කර ගැනීම වමේ ව්‍යාපාරයේ වගකීම හා කාර්යභාරය වේ. එහෙත් ධනවාදයේ පැවැත්ම වෙනුවෙන් සෘජුව හා වක්‍රව පෙනී සිටින බලවේගත් දැනුවත් හෝ නොදැනුවත් කටයුතු කරන බලවේගත් මෙවැනි අර්බුදකාරී වටපිටාවක් තුළ විවිධ වර්ගයේ ක්‍රියාමාර්ගයන්ට එළඹේ. ධනවාදයේ අර්බුදය නිර්ධන පංති ව්‍යාපාරයේ ජයග්‍රහණය සඳහා පාදකවීම වැළැක්වීමට අධිරාජ්‍යවාදීන්ද ධනපති පංතියද අවස්ථාවාදීන්ද ඔවුන් සතු සියලු මෙවලම් හා උපකරණ යොදා ගනිමින් ක්‍රියාත්මක වේ. ඒ සඳහා විවිධ දේශපාලන පෙරමුණ, සංවිධාන හා හවුල් පිහිටුවනු ලැබේ. ලොව පුරාම ඇති අත්දැකීම එයයි.

වර්තමානයේ ලංකාවේ දේශපාලන කරළිය දෙස බලන විටද එවැනි තත්වයක් මතුවෙමින් එන බව පෙනේ. විවිධ කල්ලි ගැසීම් හා රංචු ගැසීම් සඳහා වන උත්සාහයන් දැකිය හැකිව තිබේ. දිගු කලක් තිස්සේ විපක්ෂයේ සිටින, ලාංකේය ධනවාදය පවත්වාගෙන යාමේ එක් පක්ෂයක් වන, අභ්‍යන්තර අර්බුද නිසා දුර්වලව පවතින එ.ජා.ප.ය වර්තමාන අර්බුදය තමන් වෙත බලය ලබා ගැනීමේ අවස්ථාවක් බවට පත්කර ගැනීමට උත්සාහ දරන බව පෙනේ. ඒ වෙනුවෙන් එක්කළ හැකි විවිධ කොටස් එකතුකර ගනිමින් තාවකාලික හවුලක් හැදීමට කටයුතු කරමින් සිටී. එ.ජා.ප.යේ ඇත්ත වුවමනාවත් ඇත්ත මුහුණත් සඟවමින් ගොඩනගන එම හවුල් පෙනුමෙන් ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීමේ, ආර්ථිකය සංවර්ධනය කිරීමේ, යහපත් සමාජයක් ගොඩනැගීමේ සටන්පාඨ සහිතව පෙනී සිටියද හරයෙන් ලාංකේය ධනවාදය පවත්වාගෙන යාමේත් එ.ජා.ප.යට බලය ගැනීමේ වුවමනාව හා බැඳී තිබේ. එවැනි ප්‍රතිගාමී හවුල් සඳහා වර්තමාන දේශපාලන තත්වය තුළ ඉඩක් නිර්මාණය වී තිබුණද ඒවා සමාජයට කරන්නේ බරපතළ හානියකි.

ධනපති කඳවුර විවිධ අවස්ථාවාදී කොටස් හා පුද්ගලයින් එකතුකර ගනිමින්, පොදු මධ්‍යස්ථාන පිහිටුවමින් රංචු ගැසෙද්දී ප්‍රතිවිප්ලවකාරී අවස්ථාවාදී කණ්ඩායම්ද මේ අර්බුදය තුළ රංචු ගැසේ. ලාංකේය දේශපාලනය තුළ මේ දිනවල එවැනි රංචු ගැසීමක් පිළිබඳ යෝජනාවක්ද මතුවී තිබේ. ඒ ජ.වි.පෙ.න් ඉවත්ව දේශපාලන වශයෙන් අතරමංව සිටින අයගෙනි. ඔවුන්ගේ යෝජනාව වී ඇත්තේ, (ඔවුන් පුවත්පත්වලට පැවසූ ආකාරයටම) ''වමේ මධ්‍යස්ථානයක්''ගොඩ නැගීමය. එම වමේ මධ්‍යස්ථානය රෝහණ විජේවීර සහෝදරයාගේ දේශපාලනය හා එකඟ නැති අයටද සම්බන්ධ විය හැකි එකක් ලෙසද හඳුන්වා තිබේ. ඒ අනුව මේ ගොඩනැගීමට යන්නේ ජ.වි.පෙ. විරෝධීන්ගේ මධ්‍යස්ථානයකි. එනම් අවස්ථාවාදීන්ගේ රංචු ගැසීමකි.

ලංකාවේ ධනවාදය පවත්වාගෙන යාමේ, සුක්කානම තමන් අතට ගනිමින් අධිරාජ්‍යවාදයේ වුවමනාවන්ට අනුව ලාංකේය ධනවාදය පවත්වාගෙන යාම අරමුණු කරගනිමින් ගොඩනගන රනිල් වික්‍රමසිංහගේ ඊනියා පොදු මධ්‍යස්ථාන මෙන්ම වමේ ලේබලය යටතේ සියලු ද්‍රෝහීන්, අවස්ථාවාදීන් හා කුමන්ත්‍රණකාරින් එක්කරගනිමින් ගොඩනගන ඊනියා වමේ මධ්‍යස්ථානද ප්‍රතිවිප්ලවය වෙනුවෙන් දායක වනවා මිස අන් යමක් කරන්නේ නැත. ධනවාදය අර්බුදයට යන විට එය රැකීමට ඉදිරිපත් වන්නේ ධනපති පංතිය පමණක් නොවේ. ධනපති පංතියේ සහායක බල ඇණි ලෙස කටයුතු කරන වෙස්වළාගෙන සිටින අවස්ථාවාදීහු හා ප්‍රතිවිප්ලවකාරීහු ඒ සඳහා දායක වෙති. ධනපති පංතිය විසින් මෙම සහායක බලඇණි ඉතා සියුම් ලෙස දායක කරගනු ලැබේ. ලෝක වමේ ඉතිහාසය පුරාම මේ අත්දැකීම තිබේ.

15වැනි පිටුවට



''මිනිසුන් තමන් සහ අවට පරිසරය මැඩගෙන මෙතෙක් නොවූ විරූ යමක් නිර්මාණය කිරීමට මෙන් ඉදිරිපත්වන මොහොතේදී, මෙන්න මෙවැනි, විප්ලවීය අර්බුද සහිත යුගවලදී, අතීතයේ මළගිය ආත්ම තමන්ගේ ආධාර පිණිස අඬගැසීමේ මන්ත්‍ර බියසුළු ලෙස ජප කරමින්, පැරණි වෙස්මුහුණු බැඳගෙන, පැරණි ණයට ගත් බසින් කතා කරමින් සමස්ත ලෝක ඉතිහාසයේ නව ජවනිකාවක් රඟපෑම සඳහා, ඔවුන්ගේ නම්ද, යුද්දමය සටන් පාඨද, ඇඳුම්ද ලබා ගනිති. මෙලෙස ලූතර්, පාවුලු අපෝස්තුලුවරයාගේ ලෝගුව ලාගත්තේය.''

**එංගල්ස් (මාක්ස්-එංගල්ස් තෝරාගත් කෘති: 1වෙළුම, 128 පිටුව)**



# කිලිනොච්චියේ සිටවූ පැළය

වෙලාව රාත්‍රී 9 පසුවී තිබුණි. අපි සින්නතම්බි සහෝදරයාගේ නිවස බලා යමින් සිටියෙමු. කිලිනොච්චියේ සිට පරන්තන් මාර්ගයේ කිලෝමීටර් කිහිපයක් ගොස් වමට හැරී ගියපසු සින්නතම්බි සහෝදරයාගේ නිවස පිහිටා ඇති ගම්මානයට යන ගුරු පාර හමුවේ. ඒ9 මාර්ගයේදී හමුවන කිසිවක් මේ ගුරුපාරේදී පමණක් නොව පරන්තන් මාර්ගයේදී අපට හමු නොවුණි. සබෝපභෝගී වාහනද, බස්රථද, විදුලි වේගයන් යනු ලබන VIP ලා රැගත් වාහන පේළිද මෙහි නැත. වාහනයක් ලයිට් එළියක් තබා නිවසක විදුලි එළියක් හෝ නැත. වෙනදා වලගොඩැලි මතක් කර පහසුවෙන් යා හැකි සින්නතම්බි සහෝදරයාගේ නිවසට යාම අතිදුෂ්කර කටයුත්තක් වී ඇතිසෙයකි.

වන්නියට වැටෙන මහවැස්ස ගැන කුඩාකල සිට අසා තිබුනද එය මෙතරම් සරුසාර, මෙතරම් ප්‍රබල, මෙතරම් බලවේගයක් බව අත්දැක තිබුණේ නැත. මාර්ගය කිසිසේත් සොයාගත නොහැකි තරමටම ජලකඳ ගලා යන්නේ පරක්කු වූ ගමනක් යන්නාක් මෙනි. අප සිව් දෙනෙකි. ගමන යා නොහැකි තරම් දුෂ්කර අභියෝගාත්මක එකක් වෙමින් තිබේ. කුමන උත්සාහයකින් ගියද සින්නතම්බි සහෝදරයාගේ ගෙදරට රාත්‍රී 12ට පෙර යා නොහැකි බව සක්සුදක් සේ පැහැදිලිය. ''සහෝදරයා, අපිට දැන්ම ගමන නතර කරන්න වෙයි වගේ. සින්නතම්බි සහෝදරයා හෙට සම්බන්ධ කරගනිමු'' යි එක් සගයෙක් යෝජනා කරයි. ''බැහැ සහෝදරයා, අපි සින්නතම්බි සහෝදරයා නැතුව මේක කරන්න බැහැ. අපි කොහොම හරි එයාගේ ගෙදරට යමු!'' ඒ රාජේන්ද්‍ර සහෝදරයාගේ හඬය. සටන්කාමීත්වයත් දරාගැනීමත් සංයමයත් සහිත ඒ හඬ ඔහු-ගේය. යළිත් අපි ගමනේ යෙදෙමු.

වන්නියට ඇදහැලෙන ඊසානදිග මෝසම් වර්ෂාවට අමතරව මීටර් සීයෙන් සීයට තවත් බාධකයක් අප මාවත තුළ වේ. අඳුරු අහුමුළුවල සිටිමින් එකවරම විදුලි පන්දම් එළි රැගෙන මාර්ගයට එන මෙම බාධකය ශ්‍රී ලංකා හමුදාවේ සෙබළුන්ය. මීටර් සීයෙන් සීයට ඔවුහු සිටිති. හැඳුනුම්පත් ගැන. අපේ විස්තර ගැන. හමුවීමට යන කෙනා ගැන පමණක් නොව හමුවීමට යන කාරණයද ඔවුන්ට දැන්විය යුතුය. යුද්ධයෙන් වසර 2 1/2කට පසු බඹඹූ සංවිධානය යුදමය වශයෙන් හා සංවිධානාත්මක වශයෙන් නොපවතින තත්වයක් යටතේත්, බඹඹූ යේ හිටපු ප්‍රාදේශීය නායකයන් සැලකිය යුතු ප්‍රමාණයක් ශ්‍රී ලංකා ආණ්ඩුව හා හමුදාව සමග විවිධ ව්‍යාපාර හා ගනුදෙනු කරද්දී මේ සියලු අතුරු මාර්ගවල හා සියලු ලඳු දෙණි හා කැළෑවල මීටර් සීයෙන් සීයට ආරක්ෂක හමුදා රඳවා ඇත්තේ කුමන වුවමනාවකටද යන්න පැහැදිලිය. එහි අරමුණ නම් උතුරේ ජනයාගේ කිසිදු දේශපාලන කටයුත්තකට කිසිදු සිවිල් මිනිස් ක්‍රියාකාරිත්වයකට හෝ ඉඩ නොදීමය. සමාජවාදී තරුණ සංගමය විසින් පසු ගිය අගෝ 02දා පැවැත්වූ සහෝදරත්වයේ දින -එක්ව අපි පියාඹමු ක්‍රිකට් තරගයට හමුදාව යොදවා බාධා කළේත් එහි සංවිධායක සහෝදරයා එදින උදේම හමුදා කඳවුරට කැඳෙව්වේත් 'උඹලාට ක්‍රිකට් ගහන්නත් අපේ අනුමැතිය අවශ්‍යය' කියන බලපෑම කිරීමටය.

දැන් රාත්‍රී 10ද පසුවී තිබේ. සින්නතම්බි සහෝදරයාගේ නිවස පේනතෙක් මානයක නැතත් ධාරාණිපාත වර්ෂාව සමග අරගල කරන්නත් එය සමග පවතින්නත් අපි පුරුදු වී සිටියෙමු. හරියට යුද්ධය සමග කළාක් මෙනි. දිගුකාලීන යුද්ධයේ ප්‍රහාරයන්ට ඔරොත්තු දී තිබූ යුද්ධයෙන් පමණක් නොව සක්‍රීය දේශපාලනයේද පන්නරය ලබා තිබූ නිසාවෙන්ම 'කතාව ගමනට දෝලාවයි' යන්න පසක්කරමින් යුද්ධයේ දේශපාලනයේ තිත්ත ඇත්ත පිළිබඳ උදාහරණ හැම මුවකින්ම දෝරේ ගලා යන්නට විය. ''සහෝදරය, අපිට ඕන දෙමළ ජේ.වී.පී. එකක් නෙවෙයි, සිංහල ජේ.වී.පී. එකකුත් නෙවෙයි.'' ඒ රාජේන්ද්‍ර සහෝදරයාගේ හඬය. කෙටි සරල මේ වාක්‍ය අපේ හදවත හා මනස කපාගෙන බැස්සේය. ''ජේ.වී.පී. එක ජාතිවාදී කියලා අද හදිසියේ අපිට ඇවිල්ල කියන අය හිතන්නේ අපි දේශපාලනයේ අතදරුවෝ කියල. ජේ.වී.පී, එක ජාතිවාදී කියල අපිට හිතුණ නම් හිතෙන්න තිබුණේ යුද්දෙ දරුණුවට ගිය කාලේ. ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණේ සමහර ක්‍රියාමාර්ග තේරුම් ගන්න බැරි වුණත් සමහර ඒවට එකග වෙන්න බැරි වුණත් ජනතා විමුක්ති පෙරමුණේ පදනම ජාතිවාදී නැහැ කියල හැමදාම අපි තෙරුම් අරන් හිටියා. ඒ නිසා දැන් අපිට ඕන දෙමළ ජේ.වීපී. එකක් හදාගන්න නෙමෙයි, ලංකාවේ සිංහල දෙමල මුස්ලිම් කාටත් අයිති කාටත් ඉන්න පුළුවන් ජේ.වී.පී. එකක්. දෙමළ ජේ.වී.පී. එකක් හදලා දෙමළ ජනතාව දිනාග න්නවා කියන්නේ මාක්ස්වාදය නෙමෙයි.''

ඔහුගේ කෙටි නමුත් මේ උදාර අදහස ගැන හිතමින්ම අපි ගමන් කරමින් සිටියෙමු. එක් අතුරු පාරෙන් අනෙකටද, ඒකෙන් තවත් එකකටද හැරෙමින් අපි ගමන් කළෙමු. පාරවල්වල විවිධ නම් කියමින් අපට මඟ පෙන්වන සහෝදරයා කළුවරත් හමුදා බාධකත් වර්ෂාවත් වල

15වැනි පිටුවට

## පලස්තීනයට ජීවත්වීමට ඉඩ දෙනු !




නොවැම්බර් මස 29 දිනට යෙදෙන පලස්තීන සහයෝගීතා දිනය නිමිති කොට ගෙන මෙවරත් සමාජවාදී තරුණ සංගමය විසින් -පලස්තීනයට ජීවත්වීමට ඉඩ දෙනු" තේමාව යටතේ වැඩසටහන් රැසක් සංවිධානය කොට ඇත. දිස්ත්‍රික්ක සියල්ලම ආවරණය වන පරිදි ප්‍රධාන නගර ඉලක්කකොට ගෙන මෙම වැඩසටහන් සංවිධානය කොට ඇත. පලස්තීන සහයෝගීතා බැනර් අත්සන් කිරීම, පෙත්සම් අත්සන් කිරීම, පත්‍රිකා බෙදාහැරීම සහ චිත්‍රපට වැඩසටහන් ප්‍රදර්ශනය කිරීම යන කටයුතු මෙම වැඩසටහන් වලට අයත් වේ. එසේම මහජනතාව දැනුවත් කරන සම්මන්ත්‍රණයක් දෙසැම්බර් 06 සවස 3.00ට කොළඹ මහජන පුස්තකාලයේදී පැවැත්වීමටද කටයුතු යොදා ඇත.

## සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක 18 වැනි WFDY සමුළුව අමතයි




ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ 18 වැනි සමුළුව පසුගිය නොවැම්බර් මස 08 සිට 12 දක්වා පැවති පෘතුගාලයේ දී පැවැත්විණි. මේ සඳහා සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් එයට සහභාගි වූ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා එම සමුළුව ඇමතීය. මේ සඳහා අප්‍රිකානු, ආසියා ෆැසිපික්, ලතින් ඇමරිකානු සහ මැද පෙරදිග යන කලාපවල රටවල් 52 ක් පමණ සහභාගි වූ අතර මෙම සමුළුවෙන් නව නිලධාරී මණ්ඩලයක් පත්කර ගන්නා ලදි.

## මල් පිපෙන හෙටක් වෙනුවෙන්

භාරත ලක්ෂමන් ඝාතනය, වෙඩි වැදුණු දුමින්ද සිල්වා විදේශගත කිරීම, කුඩු වෙළඳපොළේ කුඩු හිඟය, පාතාල නායකයින් අතුරුදහන් වීම, නාඳුනන මළ සිරුරු හමුවීම, උතුරේ මිල්ටරි බලහත්කාරකම්, කොන්ත්‍රාත් මගින් සිදුවන මිනීමැරුම්, පාර්ලිමේන්තුවේ ගුටිකෙළි, පමණක් නොව හත්ලක්ෂය ඉක්මවන සංචාරකයාත් ලංකාවට පැමිණීම, පිටිදූවේ සිරිධම්ම හිමි උග්‍රඵල ලැබීම, දක්ෂිණ අධිවේගී මාර්ගයේ





කෙටසක් විවෘත කිරීම ආදී තවත් බොහෝ සිදුවීම් ක්‍රියාවලියක් අසන්නට ලැබෙන අතරතුර 2012 වසර සඳහා වූ 'ආශ්චර්යමත් ජන සහභාගීත්ව' අයවැයක් ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇත.

මේ වන විට තරුණ විරැකියාව ලක්ෂ 15ක් තරම් ඉහළ අගයක්ව තිබියදී රැකියා ලබා දීම පිළිබඳ කිසිවක් නොකියන අයවැයක් ඉදිරිපත් කිරීමම එක අතකින් ආශ්චර්යයක්මය. අවම වශයෙන් රැකියා විරහිත උපාධිධාරීන්ටවත් රැකියා ලබාදීම මෙවර අයවැය අමතක කර තිබේ.

පසුගිය වසරේ ආණ්ඩුව ප්‍රකාශ කළේ රැකියා විරහිත උපාධිධාරීන්ට මීළඟ අයවැයෙන් රැකියා ලබාදෙන බවත් ඒ සඳහා ජනසභා ලේකම් තනතුරු 14,000කුත්, සංවර්ධන සහකාර තනතුරු 3,000කුත් ඇතිකරන බවය. නමුත් ඒ කිසිවක් ඉටුවී නොමැත.

රටේ අයවැය සංවාදය යන අතරතුර දැවැන්ත ප්‍රචාරක වියදමක් දරමින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ බාගෙට ඉදිකළ කොටස විවෘත කිරීමද සිදුවිය. මෙහි එක් කිලෝමීටරයක ඉදිකිරීම් වියදම රුපියල් කෝටි 55කි. අයවැය හිඟය ජාතික ආදායමට සමාන වී ඇති රටකට මෙවැනි වියදම් ඔරොත්තු දෙන්නේද යන්න වෙනම විසා බැලිය යුත්තකි.

කෙසේ වුවද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ අයවැයේ සුන්දර වදන්වලින්ද, විවෘත කෙරෙන බාග අධිවේගී මාර්ගවලින්ද සමාජය යම් මෝහනයක ගිල්වීමට රාජපක්ෂ පාලනය උත්සාහ දරමින් සිටී. සංචාරකයින්ගේ පැමිණීම පිළිබඳ සංඛ්‍යා ලේඛනයන්ද, ආණ්ඩුව කියන පරිදි ආර්ථික වර්ධනයේ සංඛ්‍යා දත්තයන්ද ආදී තවත් නොයෙකුත් පම්පෝරි ඒ සඳහා ඉදිරිපත්වෙමින් තිබේ. ලොව පුරා දියුණු යයි සම්මත ධනවාදී රටවල බරපතළ අර්බුද ඇතිවී ඇති බවත් එහෙත් ලංකාව මේ සියලු තත්වයන් මැද නැගී සිටින බවත් පෙන්වීමට ව්‍යාජ ප්‍රයත්නයන් දරනු පෙනේ.

මෙහි ඇත්ත නැත්ත කුමක් දැයි අප වටහා ගත යුතුව තිබේ. එහෙත් එය මතුපිටින් පෙනෙන තරම් සරල නොවේ. 1977 පටන් ඇරඹි ජේ.ආර්. ජයවර්ධන පාලන සමය 'විවෘත ආර්ථිකය' නමින් මෙරට මත පැටවූ ආර්ථික මොඩලය ලොව පුරා ඒ වන විට පැතිරෙමින් තිබූ අධිරාජ්‍යවාදී ප්‍රාග්ධන ව්‍යාප්තියේ ලාංකේය ප්‍රකාශනය විය. ඒ සඳහා අවශ්‍ය 'තත්වයන්' කදිමට පෙළ ගැසී තිබුණි. 5/6 ක පාර්ලිමේන්තු බලය, විධායක ජනාධිපති බලතල, විරුද්ධ පක්ෂ දුබල කිරීම, ආදී පියවර රැසක් මගින් වැඩපිළිවෙළ සැකසුණි. 'මහවැලිය' වැනි ව්‍යාපෘති මගින් යටිතල පහසුකම් ඇති කෙරුණි. නිදහස් වෙළඳ කලාප අරඹමින්, රාජ්‍ය දේපළ හා සම්පත් විකුණමින් ගමන ඇරඹුණි. එහෙත් රට තුළ මතුවූ දේශප්‍රේමී අරගලය නිසාවෙන් වැඩිකල් මෙම ඉනිමේ ක්‍රීඩා කිරීමට නොහැකි වී ජේ.ආර්.ටත් වේදිකාටවන් බැස යාමට සිදුවිය.

ඉන් පසුව බලයට පත් ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග හා චන්ද්‍රිකා පාලන සමයන් තුළ යළි එවැනි වටපිටාවක් නිමවා ගත නොහැකි විය. 2002 ආණ්ඩු බලය දිනා එජාප පාලනය ඒ සඳහා වේගවත් සැලැස්මක් ඉදිරිපත් කළද වසර දෙකක කෙටි කාලයකින්ම එම පාලනය නිමා වීමෙන් එම ගමන අඩාල විය. චන්ද්‍රිකා පාලනය නිමා වී රාජපක්ෂ යුගය එළඹියද පැවති බරපතළ යුද වටපිටාව තුළ සියල්ල ගිලී තිබුණි.

එහෙත් යුද්ධය නිමා වීමෙන් පසු රාජපක්ෂ පාලනය මැතිවරණ මගින් පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරයද තවත් විධායක බලතලද තහවුරු කරගත් පසු කලින් කී ආර්ථික මොඩලය සඳහා ගැලපෙන නව තත්වයක් ඇති විය.

ඒ සමග සියලු අධිරාජ්‍යවාදී බූවල්ලෝ වේගයෙන් තම අඬු මේ බිම වෙත දිගු කරමින් සිටිති. ඊටම සරිලන රාජපක්ෂ පාලනය ඒ සඳහා අවශ්‍ය සියලු සහය දීමට සැදී පැහැදී සිටියි. එබැවින් අප මේ ගෙවා දමනුයේ එකී මොඩලයේ දෙවන ඉනිමය.

අධිරාජ්‍යවාදීන්ගේ මනදොළ පිනවන දැවැන්ත කොල්ලයකට රට සූදානම් කරවන්නේ, මේ තත්වය යටතේය. ඒ සඳහා අධිවේගී මාර්ගයන්ද, වරායවල්ද, ගුවන්තොටුපළවල්ද අවශ්‍ය වේ. ප්‍රාග්ධන ගිණුම විවෘත කළ යුතුය. ආයෝජන සඳහා වන නීති රීති තව තවත් ලිහිල් කළ යුතුය. නාගරික ඉඩම්, ගම්බද ඉඩම්, සාරවත් ඉඩම්, වනාන්තර, ජාන සම්පත්, ඛනිජ සම්පත්, ඇතුළු සියල්ල කොල්ල කා ගත යුතුය. මානව සම්පතද කොල්ල කා ගත යුත්තේය.

ඉදින් රාජපක්ෂ ජනාධිපතිවරයා 'අයවැය වට්ටෝරුව' ඉදිරිපත් කරනුයේ, ඒ වෙනුවෙන් මිස අන් කවරක් උදෙසාද? රුපියල අවප්‍රමාණ කරමින් ජාවාරම්කරුවන්ට තව තවත් සහන දෙමින් පොදුජන සුභසාධන කප්පාදු කරමින් මේ සිදුකර ඇත්තේ එයයි.

එබැවින් මේ බෙලහීන ධනවාදී පාලනයෙන් රැකියා ඉල්ලීම ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලීමකට සමානය. එබැවින් ''හෙටක් සහිත රටක් දියව්'' කියා ඉල්ලා පාගමන් යන්නේ ඇයිදැයි යමෙකුට ප්‍රශ්නයක් මතුවිය හැකිය. රැකියාව යනු ජීවත්වීමට අදාල මූලිකම කොන්දේසියක් ව පවතින සමාජයක රැකියාවක් ඉල්ලීම යනු 'ජීවත්වීමට ඉල්ලීම' වීම නොවැළැක්විය හැකිය. එබැවින් සෑම මිනිසකුටම ''ජීවත්වීමට ඉඩ දියව්" කීමට ශුද්ධ වූ අයිතියක් ඇත. එහෙත් ඒ ''කුමක් හෝ රැකියාවක් දියව්" කීමට නොවේ. නමුත් මේ බෙලහීන පාලනයට එයවත් ඉටුකළ නොහැකි වී ඇත. අප ඉල්ලන්නේ, සියලු තරුණයන්ට සුදුසු රැකියා ලබා දෙන ලෙසය. එනම් ජීවිතය සුරක්ෂිත වන වැඩපිළිවෙළක් වෙනුවෙනි. එවන් වැඩපිළිවෙළක් ලබාදීමට පවතින ධනවාදී පාලනය අසමත් වන්නේ නම් එවැනි, ජීවිත සුරක්ෂිත කරන, තරුණ ජවයට, හැකියාවන්ට ඉඩකඩ සලසන මානව හිතවාදී සැබෑ පාලනයක් දිනා ගැනීම උදෙසා ලාංකේය තරුණ පරපුර පෙළගැස්සවීම වෙනුවෙනි. සැබවින්ම තරුණ සිත්තුළ මල් පිපෙනුයේ එවැනි හෙටක් දිනා ගැනීමෙන්මය.



# නිදහස් අධ්‍යාපනය රැකගත හැක්කේ සමාජවාදය තුළ පමණයි!

## සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක - නලින්ද ජයතිස්ස සහෝදරයා

***නියමුවා:***
***සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් ඔබ ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ මහ සමුළුවට සහභාගි වුණා. ඊට අවස්ථාව නිර්මාණය වෙන්නේ කොහොමද?***

***නලින්ද සහෝදරයා***
ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය (WFDY) කියන්නේ මේ වනවිට ලොව පවතින විශාලතම හා පුළුල්ම අධිරාජ්‍ය විරෝධී තරුණ, ශිෂ්‍ය සංවිධානවල එකතුව. දෙවන ලෝක යුද්ධය නිමාවත් සමග අධිරාජ්‍යවාදයට හා ෆැසිස්ට්වාදයට එරෙහිව, සමාජවාදී රාජ්‍ය පද්ධතියේ පූර්ණ අනුග්‍රහය ඇතිව 1945 දී එය ආරම්භ වුණා. මේ වන විට ලෝකයේ තරුණ හා ශිෂ්‍ය සංවිධාන 180 ක් පමණ එහි සාමාජිකත්වය දරනවා.

WFDY හි මහ සමුළු සෑම වසර හතරකට වරක්ම පවත්වා එහි විධායක සභාව සහ නිලධාරී මණ්ඩලය තෝරා පත්කර ගන්නවා. ඒ අනුව පෘතුගාලයේ ලිස්බන් නගරයේ නොවැම්බර් 8-12 අතර පැවතියේ උත්‍ගශ 18 වන මහ සමුළුවයි. ජනතා විමුක්ති පෙරමුණ උක්‍ගශ කටයුතු සඳහා මුලින්ම සම්බන්ධ වන්නේ 1978 දීයි. ඒ කියුබාවේ හවානා නුවර පැවති 11 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට රෝහණ විජේවීර සහෝදරයා, සෝමවංස අමරසිංහ සහෝදරයා ඇතුළු පක්ෂයේ නියෝජිත පිරිසක් සහභාගි වීමෙන්. ජනතා විමුක්ති පෙරමුණේ ශිෂ්‍ය අංශය ලෙස සමාජවාදී ශිෂ්‍ය සංගමයට WFDY පූර්ණ සාමාජිකත්වය ලැබුණේ 2001 වසරේදීයි.

WFDY සංවිධානයට නායකත්වය දෙනු ලබන්නේ සාමාජික සංවිධාන 35 කින් සමන්විත විධායක සභාවයි. ලෝකය කලාප පහකට බෙදා ඒ එක් එක් කලාපවලින් සංවිධාන හත බැගින් විධායක සභාවට තෝරා ගන්නවා. සමාජවාදී ශිෂ්‍ය සංගමය මුලින්ම විධායක සභාවට තේරුණේ 2003 වසරේදී. ඉන් පසු 2007 වියට්නාමයේ පැවති මහ සමුළුවේදීත්, 2011 මෙවර පැවති මහ සමුළුවේදීත් පිට පිට තුන්වන වතාවටත් අපව විධායක සභාවට තෝරා ගැනුණා. ඊට අමතරව මෙවර ආසියා පැසිපික් කලාපය නියෝජනය කරමින් විධායක සභාවට තෝරා ගැනුණේ වියට්නාමයේ හෝ චි මිං තරුණ සංවිධානය (HCMCYU), උතුරු කොරියාවේ කිම් ඉල් සුං සමාජවාදී තරුණ සංගමය (KISSYL), ඉන්දියාවේ සමස්ත ඉන්දීය තරුණ සම්මේලනය (AIYF), නේපාල තරුණ සම්මේලනය (NYF), බංග්ලාදේශ තරුණ සංගමය (BYU) හා ජපාන සමාජවාදී තරුණ සංගමය (JLSY) යන සංවිධානයි. සමාජවාදී ශිෂ්‍ය සංගමයට අමතරව සමාජවාදී තරුණ සංගමයටත් 2007 වසරේදී WFDY හි පූර්ණ සාමාජිකත්වය ලැබුණා.

ඊළග වසර හතර සඳහා WFDY සභාපති ධූරයට සයිප්‍රස් AKEL පක්ෂයේ තරුණ අංශය වන EDON සංවිධානයත්, මහ ලේකම් ධූරයට කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ තරුණ අංශය වන UJC සංවිධානයත් නිතරගයෙන් තේරී පත්වුණා. සමාජවාදී ශිෂ්‍ය සංගමය නැවත වතාවක් WFDY නායකත්ව මණ්ඩලයට නිතරගයෙන් පත්වීම කියන්නෙ ලාංකේය ප්‍රගතිශීලී ජනතාවත් ශිෂ්‍ය ව්‍යාපාරයත් ලැබූ ජයග්‍රහණයක්. ඒ වගේම එයින් පෙන්නුම් කරන්නේ, ලෝකයේ ප්‍රගතිශීලී තරුණ හා ශිෂ්‍ය ව්‍යාපාර විසින් ආසියා පැසිපික් කලාපය තුළ අධිරාජ්‍ය විරෝධී අරගලයේ නියමු කාර්යභාරයක් ජනතා විමුක්ති පෙරමුණේ ශිෂ්‍ය අංශයට - සමාජවාදී ශිෂ්‍ය සංගමයට - පවරා ඇති බවයි.

***නියමුවා***
***මෙවර WFDY මහ සමුළුවේ සහ පොදුවේ සංචාරයේ ප්‍රගතිය පිළිබඳ සඳහන් කළොත්?***

***නලින්ද සහෝදරයා***
පෘතුගාලයේ මෙවර පැවති 18 වන මහ සමුළුවට රටවල් 54 ක සංවිධාන 87 ක් නියෝජනය කරමින් 140 ක පමණ පිරිසක් සහභාගි වී සිටියා. පසුගිය දශක දෙකක කාලය තුළ පැවති විශාලම සහභාගිත්වය සහිත මහ සමුළුව බවට එය පත්වුණා. සමාජවාදී ශිෂ්‍ය සංගමය WFDY කටයුතුවලට අඛණ්ඩව හා සක්‍රීයව මැදිහත්වන නිසා බොහෝ ශිෂ්‍ය හා තරුණ සංවිධාන සමග පවතින සම්බන්ධතාවයන් තහවුරු කරගැනීමට මෙවර අවස්ථාව කරගත්තා. විශේෂයෙන් ආසියා පැසිපික්, යුරෝපා හා මැදපෙරදිග කලාප සමග අප නිරන්තර දේශපාලන ක්‍රියාකාරකම්වල යෙදීම මෙහිදී අපට වාසියක් වුණා. ලතින් ඇමරිකානු හා අප්‍රිකානු කලාපවල සංවිධාන සමග නව සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීමටත් අවස්ථාව උදා වුණා. පෘතුගාල කොමියුනිස්ට් පක්ෂයේ තරුණ අංශය වන JCP සංවිධානය මෙවර සමුළුවේ සත්කාරක සංවිධානය වීම නිසා ඔවුන් සමග වැඩිපුර ක්‍රියාකාරීවීමටත්, සමීප සම්බන්ධතා ගොඩ නගා ගැනීමටත් හැකි වුණා. පෘතුගාල කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ජෙරනිමෝ ඩි සූසා සහෝදරයා මුණගැසීමටත් එම පක්ෂය සමග විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමටත් හැකිවීම ජනතා විමුක්ති පෙරමුණේ ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කරගැනීමට හේතු වුණා. ඒ වගේම වර්ධනය වන ලෝක ආර්ථික අර්බුදය විසින් සහන අහිමි කළ රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන් 1,80,000 ක් පමණ සහභාගි වූ අති විශාල විරෝධතා පෙළපාලියකට සහභාගි වීමටත් ඉඩ ලැබුණා. එය සංවිධානය කර තිබුණේ පෘතුගාල කොමියුනිස්ට් පක්ෂයට අනුබද්ධ වෘත්තීය සමිතියි.

WFDY මහ සමුළුවට සහභාගි වීමට අමතරව මමත් බිමල් රත්නායක සහෝදරයාත් පක්ෂයේ ප්‍රංශ කමිටුව විසින් සංවිධානය කළ 22 වන ඉල් මහ විරු සමරුවට සහභාගි වුණා. ඒ වගේම බෙල්ජියමේ පක්ෂ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා මැදිහත් වීමක්ද මේ සංචාරයේදි සිදු කළා. ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂය, ප්‍රංශ කො.ප යේ තරුණ සංවිධානය, ප්‍රංශයේ ස්වාධීන කම්කරු පක්ෂය (POI) හා බෙල්ජියමේ වැඩ කරන ජනතා පක්ෂය සමග ද්වීපාර්ශවීය සාකච්ඡා පවත්වා ජ.වි.පෙ. හා එම පක්ෂ අතර සබඳතා ශක්තිමත් කිරීමට හැකියාව ලැබුණා.

***නියමුවා***
***මේ වනවිට ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බරපතළ ගැටලු රැසක් පැන නැගී තිබෙනවා. මේ ගැටලුවල මූලය කොතනද?***

***නලින්ද සහෝදරයා***
1977 දී ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන අපේ රට නව ලිබරල් ධනවාදී ආර්ථිකයට විවෘත කළා. එතැන් පටන් බලයට ආපු හැම ආණ්ඩුවක්ම - එ.ජා.ප, ශ්‍රීල.නි.ප දෙකම - කළේ මේ ආර්ථික ප්‍රතිපත්තිය කර පින්නාගෙන ඉදිරියට ගිය එකයි. ජනාධිපති මහින්ද රාජපක්ෂත් බොරු දේශප්‍රේමයේ, ජාතිකවාදයේ, දේශීයත්වයේ සළු පොරවාගෙන යන්නේත් ඒ පාරෙම තමයි. ජනාධිපති ජේ.ආර්. නව ලිබරල් ධනවාදයේ පළමු ඉනිම ආරම්භ කළත් ඔහුට පස්සෙ පිටියට ආපු පිතිකරුවන්ට, පිතිකාරියන්ට ආරම්භය වගේ ඉදිරියට යන්න බැරිවුණා. යුද්ධය ඊට සැහෙන බාධාවක් කළා. දැන් ජනාධිපති එම්.ආර්. ට එහි දෙවැනි ඉනිම සෙල්ලම් කරන්න අවස්ථාව ලැබී තිබෙනවා. අද අපි දකිමින් සිටින්නේ ඒ යථාර්ථය.

ජනාධිපති ජේ.ආර්. නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය ආරම්භ කළේම ලෝක බැංකුවට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට රිසිසේ අපේ ආර්ථිකය හසුරුවන්න ඉඩ කඩ හදල දීලා. මේ අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවල උපදෙස්



> මේ සියලු ගැටලුවලට මූලය අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවල ප්‍රතිපත්ති අනුව හැසිරෙන නව ලිබරල් ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියයි. පෞද්ගලික විශ්වවිද්‍යාල බිහිවීම වළක්වන්න නම් මේ ආර්ථික ප්‍රතිපත්තිය කරපින්නාගෙන යන ආණ්ඩු පැරදවිය යුතු බව අපේ රටේ ජනතාව තේරුම් ගත යුතුයි.

අනුව රටේ සම්පත්, රාජ්‍ය ආයතන හා සේවා විකිණීමට ජේ.ආර්. අත ගැහුවා. 1978 දී නව ලිබරල් පළමු ඉනිම අරඹා වසර දෙකක් යන කොටම ඔහු අධ්‍යාපනය විකුණන්න පටන් ගත්ත. ඒ 1981 දී අධ්‍යාපන ධවල පත්‍රිකාවක් ගෙනල්ලා. ඒ වගේම උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අරඹන්නත් කටයුතු කළා. 1978 විශ්ව විද්‍යාල පනතෙන් හොරෙන් රිංගල. ඒ වගේම උපාධි විකුණන කඩවලට බිස්නස් හැදෙන්න නම් රාජ්‍ය විශ්වවිද්‍යාල දුබල කරන්න ඕනෑ බව ජේ.ආර්. තේරුම් ගත්තා. ඒ නිසා 1979 වන විට අධ්‍යාපනයට වෙන් කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට දෙකට අඩු කළා.

මේවනවිට පර්සි මහේන්ද්‍ර ජනාධිපතිවරයා නව ලිබරල් වාදයේ දෙවෙනි ඉනිම සෙල්ලම් කරන්න පිට්ටනියට බැහැලා ඉන්නෙ. එම්.ආර්. , ජේ.ආර්. වගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව එක්ක එකඟතා ගිවිසුම් ගැහුවා. ඒවායේ උපදෙස් පිට අධ්‍යාපනය විකුණන්න අතගහලා තියෙනවා. ඒ අනුව මේ වන විටත් රුපියල් ලක්ෂ 85 කට වෛද්‍ය උපාධිය විකුණන ආයතනයක් රජයේ පූර්ණ අනුග්‍රහය සහිතව මාලඹේ ප්‍රදේශයේ පවත්වාගෙන යනවා. මීට අමතරව වෙනත් උපාධි විකුණන ආයතන පහළොවක් පමණ රටපුරා තියෙනවා. ජේ.ආර්. එදා විශ්වවිද්‍යාල පනතින් හොරෙන් රිංගල ගිහින් පෞද්ගලික විශ්වවිද්‍යාල හැදුවට, මෙදා එම්.ආර්. ඊටත් වඩා ඉදිරියට ගිහින්. පෞද්ගලික උපාධි කඩවලට නීත්‍යානුකූලභාවය ලබා දෙන්න ''පෞද්ගලික විශ්වවිද්‍යාල පනත'' දැනටමත් කෙටුම්පත් කරල ඉවරයි. ඒ කෙටුම්පතට අනුව පෞද්ගලික විශ්වවිද්‍යාල කියන්නෙ සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි වන, තමන් විසින්ම ආදායම් උපදවා ගතයුතු ආයතන. ඒ කියන්නෙ උපාධිය කියන වෙළඳ භාණ්ඩය විකුණලා ලාභ උපයන ව්‍යාපාරික ආයතන. මේ පනත ලබන ජනවාරියේ පාර්ලිමේන්තුවට ගේන්න තමයි ආණ්ඩුවේ සැලැස්ම.

15වැනි පිටුවට



අපගේ අධ්‍යාපන ප්‍රතිපත්තිය අධ්‍යාපනයක් ලබන හැම එක්කෙනාටම චරිත ශක්තියෙන්, බුද්ධියෙන් සහ කායික වශයෙන් වර්ධනය වී සමාජවාදී අවබෝධයත් සංස්කෘතියත් යන දෙකම ඇති වැඩ කරන්නකු වන්නට හැකි කළ යුතුයි.

**මාවෝ සේතුං - උද්ධෘතපාඨ 191 පිටුව**

ආවර්ජනා

# ''සිහින ඇති - සහන නැති අයවැය පරදවමු'' පත්‍රිකා බෙදීම

නූතන සන්නිවේදන මාධ්‍යයන්ගේ විශ්මිත ජයග්‍රහණ සමග සසඳනවිට පත්‍රිකාවක් බෙදීම ප්‍රාථමික සන්නිවේදන ක්‍රියාමාර්ගයක් බව බැලූ බැල්මට හැඟීයා හැකිය. එහෙත් නූතන සන්නිවේදන තාක්ෂණය කොතරම් ප්‍රබල වුවද මුද්‍රිත අකුරුවලට තිබෙන්නේ සුවිශේෂී බලයකි. 2012 අයවැය ප්‍රෝඩාව ගැන ජනතාව දැනුවත් කිරීමට මෙම පත්‍රිකා බෙදීමේ ව්‍යාපාරයක් පසුගිය 24 වෙනිදා ජනතා විමුක්ති පෙරමණේ නායක සහෝදරවරුන්ගේ මූලිකත්වයෙන් සිදුකෙරිණ. මෙම පත්‍රිකා බෙදීම කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටින් ආරම්භවූ අතර පක්ෂ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඇතුළු දේශපාලන මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රධානත්වයෙන් එය සාර්ථකව සිදුවිය. ඊට සමගාමීව රටේ විවිධ ප්‍රදේශවලද පත්‍රිකා බෙදීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක විය. ජනතාව එතරම් තැකීමක් කර නැති ප්‍රශ්නයක් අවධාරණය කර තිබිණි. එනම් එම බලය ක්‍රියාත්මක වනුයේ ඒ අකුරු කියවා අවධාරණය කර ගත් මිනිස් මොළ මගිනි. ''මේ වනවිට එක්



පුද්ගලයෙකු රු:-235,000/-ක පමණ ණය කන්දකට යට කිරීමට ආණ්ඩුව කටයුතු කර ඇති බවය. අධ්‍යාපනයට, සෞඛ්‍යයට වෙන් කරන මුදල් විශාල ලෙස කප්පාදු කිරීම පිළිබඳ'' ජනතාවට එක එල්ලේම නොදැනෙන කටුක යථාර්ථයද හෙළිකර තිබිණ.

# 22 වැනි ඉල්මහ සමරුව



ලෙනින් - ෆිදෙල් කැස්ත්‍රෝ, චේ, හෝචිමිං, මාඕ සේතුන් වැනි පූර්වගාමී විප්ලවකාරී නායකයින් ලාංකේය වමේ ව්‍යාපාරයට ඉතා ඈතින් ස්ථාන ගත කර තිබූ වටපිටාවක් පවතින නමුත් 1960 දශකය අවසන් භාගයට පිවිසෙන්නේ ජාත්‍යන්තර වාමාංශික ව්‍යාපාරයේ එම නායකයින් ලාංකේය වමේ සටන්කරුවන්ගේ සෙල තුළ වැඩෙන්නට පටන් ගනිමින්ය. එය ඉබේ සිදුවූවා නොවේ. රෝහණ විජේවීර නම් ලාංකේය විප්ලවවාදියාගේ පසුනොබස්නා අධිෂ්ඨානය සහ අනන්ත අප්‍රමාණ කැපකිරීම්වලින් උපන් ජීවමය තත්වයකි.

දශක දෙකහමාරක් ලාංකේය දේශපාලන මහපොළොව අලුත්කළ අසහාය මිනිසා ඔහුමය. අග්‍රගන්‍ය සංවිධායකයෙක්, අග්‍රගන්‍ය ප්‍රචාරකයෙක්, අග්‍රගන්‍ය සටන්කරුවෙක් ලෙස මේ දේශපාලන මහ පොළව අලුත් කරද්දී සතුරන්ගේ අසීමිත වෛරයට පාත්‍ර වීමම මේ අලුත් මිනිසාගේ සාර්ථකත්වයට සාක්ෂි දැරීය.

''ධනේෂ්වර පංතිය විසින් ජනතා විමුක්ති පෙරමුණට අවලාද නැගීම සඳහා එමගින් ජනතා විමුක්ති පෙරමුණ කෙරෙහි ජනතාවගේ ඇති විශ්වාසය පළුදු කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාමාර්ග ප්‍රතිපත්ති දර්ශනය හා වැඩපිළිවෙළ කෙරෙහි ජනතාව අතර ඇති බලාපොරොත්තු සුන් කිරීම සඳහා හා ජනතා විමුක්ති පෙරමුණේ සැබෑ විප්ලවවාදීන් කෙරෙහි ජනතාවගේ ඇති ආදරය හා විශ්වාසය අහෝසි කිරීම සඳහා විප්ලවවාදීන් නමින් පෙනී සිටින ධනේෂ්වර පංති ඒජන්තවරුන් සහ ද්‍රෝහීන් ප්‍රයෝජනයට ගනු ලබන්නේය.'' යනුවෙන් ඔහු තම අත්දැකීම් සටහන් කර තිබිනි. විප්ලවවාදීන් නමින් පෙනීසිටි ඒජන්තයන් පක්ෂය තුළ මතුවූයේ වරක් දෙවරක් නොවේ. ඒ කුමන අවස්ථාවකදී වුවද තේරුම් බේරුම්කර ගැනීමට කොතරම් අසීරු සංකීර්ණ තත්වයන් යටතේ වුවද ජනතා විමුක්ති පෙරමුණ වටා විප්ලවවාදීහු රොදබැඳගත්හ. හිතවතුන්ද ඒ වටා එක්රොක් වූහ.

22 වන ඉල් මහ සමරුව ඒ බව යලි යලිත් සනාථකළ අති ප්‍රබල සාක්ෂියකි. නොවැම්බර් 13 දා සවස්භාගය කොළඹ විහාරමහාදේවී එළිමහන් රංග භූමිය එකම හිස් ගොඩක් බවට පත්වී තිබිණ. ජීවයෙන් පොබවූ දෑස් එකම අරමුණක් වෙනුවෙන් දිවි දෙවැනි කොට දැල්වී තිබිණ. ලාංකේය ධනේශ්වරය අන්තයටම දිරායමින් තිබෙන මේ මොහොතේ එක්වූ ජීවී දෑස් සමාජවාදී අනාගතය විනිවිද දුටුවේය. 'අත්දැකීම් කිහිපයක්' නම් රෝහණ විජෙවීර සහෝදරයාගේ ඓතිහාසික ලියවිල්ල තරුණ පරම්පරාව අතට පත්කිරීම මෙහිදී සිදුකළ විශේෂ කටයුත්තකි.

ජනතා විමුක්ති පෙරමුණේ ජාත්‍යන්තර අංශයේ හැකියාව හා ශක්තිය විදහා පාමින් ඉල්මහ විරු සමරුව රටවල් ගණනාවකදී සංවිධානය කර තිබූ අතර ප්‍රංශ, ඉතාලියේ රෝමය සහ මිලානෝ නගර, කටාර් රාජ්‍යය, කුවේටය, බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර ආදී ස්ථානයන් හි පවත්වන ලදී. ප්‍රංශයේ සමරු උළෙලට බිමල් රත්නායක හා නලින්ද ජයතිස්ස සහෝදරවරුද, ඉතාලියේ රෝමය, මිලානෝ නගරවලට ප්‍රධානලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, සුනිල් හඳුන්නෙත්ති වසන්ත සමරසිංහ සහෝදරයා, නායක සෝමවංශ අමරසිංහ යන සහෝදරවරු ඒවායේ පැවති දේශන පැවැත්වූහ.

# වැටුප් සටනට නවජීවය

මහින්ද රාජපක්ෂ පාලනය යටතේ වැඩකරන ජනතාව ඇතුළු සමස්ත මහජනතාව අසීමිත පීඩනයකට පත්කර අවසන්ය. එය දින දින වඩාත් තීව්‍ර කරන අතර ආණ්ඩුව ජනතාව රවටමින් කිසිම සහනයක් නොදී මගහැර යාමට හැකි සියලුදේ කරමින් සිටී. එහෙත් එම මග හැරයාමට සමානුපාතිකව වැඩකරන ජනතාවගේ අරගලය තව තවත් මුවහත්වන බව ධනපති පාලකයෝ නොදනිති. නොවැම්බර් 16 වෙනිදා කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිට පැවැති වැඩකරන ජනතාවගේ උද්ඝෝෂණයට මහ වැසි පරයා මහ සෙනඟක් එක්වූයේ තම සාධාරණ අරගලය පන්නරය ලබන්නේ කෙසේදැයි මොනවට කියාපාමිනි. වැඩිවන ජීවන වියදමට සරිලන සේ රාජ්‍ය සේවක වැටුප රු10000/- කින් සහ පෞද්ගලික අංශයේ





සියලුම සේවකයන්ගේ වැටුප 40% කින් ඉහළ දමන ලෙස බලකළ සටන් පාඨවලින් කොළඹ අහස ගිගුම් දුණි. අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් එය පැවැත්විණි.

මේ වන විට සිවුදෙනෙකුගෙන් යුත් පවුලක මාසික වියදම රුපියල් 42,500/- දක්වා වැඩි වී ඇතත් රාජ්‍ය සේවකයන්ගේ අවම වැටුප රුපියල් 11,730/- වී තිබේ. පෞද්ගලික අංශයේ එය රුපියල් 7,500/-කි. මේ තත්වය හමුවේ ධනපති පාලනයක් ඉදිරියේ දණින් වැටී නිවටයන් වෙනවා වෙනුවට අරගලයෙන් ඉල්ලීම් දිනාගැනීමේ කලාව ලාංකේය වැඩකරන ජනතාව ප්‍රගුණ කරමින් සිටී. එය හුදෙක් වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීමේ අරගලයක් පමණක් නොව. සමාජවාදී සමාජයක් බිහිකර මිනිසා විසින් මිනිසාව සූරාකෑමෙන් මුදවන සමාජවාදී සමාජ ක්‍රමයක් ස්ථාපිත කිරීම දක්වා ගෙන යා යුතු බවට වාදයක් නැත.

# අයවැයට එරෙහිව මැද මුලනෙත් උද්ඝෝෂණ



ලංකාවේ පහළ වනවා යැයි රාජපක්ෂවරු කියන ආශ්චර්යයේ කේන්ද්‍රස්ථානය මැදමුලන කරගෙන අවසන්ය. ඒත් මැදමුලන තිබෙන්නෙත් ලංකාවෙම බව රාජපක්ෂවරුන්ට අමතකය. ජනතා විමුක්ති පෙරමුණ අයවැය ප්‍රෝඩාවට එරෙහිව සංවිධානය කළ ජනතා විරෝධය නොවැම්බර් 28 වෙනිදා අම්බලංතොට නගරයේදී පවත්වන ලදී. අනුර දිසානායක සහෝදරයාගේත්, නිහාල් ගලප්පත්ති සහෝදරයාගේත් නායකත්වය ඊට ලැබිණි.

රාජපක්ෂවරු වචනවලින් මවන සුන්දර සුරංගනා ලෝකය හම්බන්තොට නැති බව විරෝධතාවයට එක්වූ අතිවිශාල ජනතාව ඉතාම පැහැදිලිව මෙම විරෝධතාවයෙන් පෙන්වාදුන්නේය.

මෙහිදී අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා, ''භාරලක්ෂයකට අධික තරුණ තරුණියන් පිරිසකට රැකියා නැහැ. ඔවුන් ගැන කිසිම සඳහනක්වත් මේ අයවැයේ නැහැ. ජීවිතයක් නොවෙයි. අත්හිටුවා තිබෙන ගොවි විශ්‍රාම වැටුප මේ අයවැයෙන් වත් ලබා දෙයි කියල ඒ ගොවි අම්ම තාත්ත බලාපොරොත්තු වුණා. ඒ බලාපොරොත්තුවත් දැන් සුන්වෙලා. රුපියලේ අගය අඩුකිරීමෙන් අමතර විශාල ජීවන බරකුත් ජනතාව මත පටවා අවසන්'' යැයි කියා තිබිණි.

# සහන නැති - සිහින ඇති අයවැයට අපුරදී විරෝධතා

අනුරාධපුර නගරය 24 වැනිදා දහවල් වෙනස් ආකාරයකට පරිවර්තනය වී තිබිණ. මහවැසි නොතකා ඒකරාශීවූ මිනිසුන් විරෝධතාවයේ නිරතවිය. සහන නැති, සහින ඇති අයවැයට විරෝධය පළකරමින් ජනතා විමුක්ති පෙරමුණ ආරම්භ කළ මහජන විරෝධතා ව්‍යාපාරය ප්‍රාදේශීය නගර දක්වා ව්‍යාප්ත කිරීමේ මුල්පියවර එය විය. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයාගේ මූලිකත්වයෙන් එය පැවැත්විණි. ආසියාවේ ආශ්චර්යය පහළ කරන බවට පුරසාරම් දොඩමින් පාර්ලිමේන්තුවට ගෙන ආ 2012 අයවැය හිස් වචන ගොඩක් සහ සිහින පමණක් බව ජනතාව අවබෝධ කරගනිමින් සිටිති.

''දැයට කිරුළ බොරු සෝබන එපා - ජනතාවගේ ගැටලු විසඳනු''

''රජරට ජනතාවට මරු කැඳවන - වකුගඩු රෝගයට - වහා විසඳුම් ලබා දෙනු'' ''10% සොච්චම් දීමනා රැවටිල්ල නවත්වනු - රු:- 10,000/-කි න් වැටුප් වැඩි කරනු'' ආදී සටන්පාඨ රැගත් පුවරු එහි දී ප්‍රදර්ශනය කෙරිණි. රජරට ප්‍රදේශයේ ජනතාවට මරු කැඳවන වකුගඩු රෝගයට ආණ්ඩුවට විසඳුම් නොමැතිවීම ප්‍රශ්න කිරීමද උද්ඝෝෂණයේ විශේෂත්වයකි.

'අපි දන්නවා මේ ධනපති පාලනයට ජනතාවගේ ප්‍රශ්නවලට සැබෑ උත්තර දෙන්න බැරි බව. ලෝකය පුරාමත් එය ඔප්පු කරමින් තිබෙනවා. ධනවාදීන්ගේ රන් දෙවොලෙත් දැන් ජනතා සටන් ඇවිලෙනවා. අපේ රටෙත් මේ ධනපති සමාජ ආර්ථික දේශපාලනයට මෙතනින් අඟලක්වත් ඉස්සරහට යන්න බැහැ. අපි මේ අරගලය සමාජවාදී සමාජයක් බිහිකිරීම දක්වා පෙරට ගෙනයනවා'' ලාල් කාන්ත සහෝදරයා අදහස් දක්වමින් කියාසිටියේය.

# නිදහස් අධ්‍යාපනය තහවුරු කර ගැනීමට ශිෂ්‍ය අරගලත් පෙරටම

අධ්‍යාපනයත් පෞද්ගලීකරණය කිරීමට රාජපක්ෂ ආණ්ඩුව ගෙන යන සියලු ත්සාහය ක්‍රියාමාර්ග පිළිබඳව ජනතාව දැනුවත්කිරීමේ පත්‍රිකා බෙදීමත් 24 වැනි දා කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී සිදුකෙරිණ. පොලීසියේ බාධාකිරීම් මැද මෙය සාර්ථකව පවත්වන ලදී. එයට සමගාමීව විවිධ නගරවල පත්‍රිකා බෙදාහැරීම සිදුකෙරිණ. මේවන විට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ක්‍රමයෙන් බිඳවට්මින් තිබෙන අතර තවත් පැත්තකින් පාසල් 1590ක් ලබන වසර තුළ වසාදැමීමට නියමිතය. එමෙන්ම රාජ්‍ය විශ්වවිද්‍යාල ක්‍රමානුකූලව අඩපණ කරමින් පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවීම දක්වා ගෙනයාමට අවශ්‍ය නීතිමය පියවර ගැනීමටත් ආණ්ඩුව සූදානමින් සිටී පෞද්ගලික විශ්වවිද්‍යාල සඳහා මේ දක්වා නොතිබූ නීතිමය ආවරණනය ලබාදීමට පෞද්ගලික විශ්වවිද්‍යාල පනත මේවන විට හොර රහසේ කෙටුම්පත් කරමින් පවතී. ඒ නිසා අත ළඟට ඇවිත් තිබෙන නිදහස් අධ්‍යාපනයට මීනීවල කැපීමේ කටයුත්ත පරාජය කිරීමට සියලු දේ කරන්නට ශිෂ්‍ය ව්‍යාපාරය කැපවී අවසන්ය.



# ඉතිහාසයේ ගතිකත්වය තේරුම් ගැනීම

මේ දිනවල අලුත් දේ බිහිවීම පිළිබඳ, යල් පැනයාම් පිළිබඳ, ඉතිහාසය ගොඩනැගීම පිළිබඳ සාකච්ඡාවක් දෛනික දේශපාලනය තුළ මතුවී තිබේ. එවැනි සාකච්ඡාවක් මතුවීම ඉතා හොඳය. එහෙත් එකී සාකච්ඡා තුළ ඉතිහාසයේ සංවර්ධනය, ඉතිහාසයේ ගමන් මග, පැරණි යල්පැන ගිය දේ වෙනුවට අලුත් දියුණු දේ තහවුරු වීම පිළිබඳ අවිද්‍යාත්මක හා වැරදි මතයන් තහවුරු කිරීමට උත්සාහයක් පවතින බවත් එමගින් එකිනෙකාගේ පටු වුවමනාවන් සාධාරණීකරණය කර ගැනීමට තැත් දරන බවත් පෙනේ.

එහිදී බොහෝ දෙනෙක් එක් හෝ තවත් අන්තයක සිට ඉතිහාසයේ ගමන් මග තේරුම් කිරීමට උත්සාහ දරන බව පෙනේ.

සාමාන්‍ය ව්‍යවහරයේ දී ඉතිහාසය ලෙස සලකනු ලබන්නේ, ලිඛිත ඉතිහාසයටය. එහෙත් එය නිවැරදි නොවේ. ඉතිහාසය යනු මිනිසා බිහිවීමෙන් පසු අතීතයට එක් වූ සියලු දේය.

**''ඉතිහාසය යනු ස්වකීය අරමුණු මුදුන් පත්කර ගැනීම සඳහා මාධ්‍යයක් වශයෙන් මිනිසා උපයෝගී කර ගන්නා පිටස්තර විශේෂ පෞද්ගලිකත්වයක් නොවේ. ඉතිහාසය යනු අන් කිසිවක් නොව, ස්වකීය අරමුණු ලුහුබැඳ යන මිනිසාගේ ක්‍රියාකාරිත්වයයි''**

**-මාක්ස්/එංගල්ස් - කෘති එකතුව 2 වෙළුම 102 පිටුව-**

ප්‍රකෘතියේ පවතින සියලු දේ කාලය හා අවකාශය තුළ චලිතයේ පවතී. එය සිදුවන්නේ, ප්‍රමාණාත්මක එකතුවීම් ගුණාත්මක පරිවර්තනයන් බවට පත් වීමෙනි. පවත්නා දේ යල් පනිමින් පැරණි යල්පැන ගිය දේ වෙනුවට අලුත් දියුණු දේ තහවුරු වීම මගිනි. එය සංවර්ධනීය ක්‍රියාවලියකි.


ඉතිහාසය ගොඩ නැගෙන්නේද එලෙසිනි. එය එක තැනක ඝනීභූතව නොපවතී. එය වර්ධනය වේ. ඓතිහාසික වර්ධනය යනු පැරණි සමාජ අලුත් හා උසස් ඒවා විසින් ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබීමකි. එනම් ප්‍රාථමික සාමූහික සමාජය වහල්හිමි සමාජය හෝ ආසියාතික සමාජය විසින්ද වහල්හිමි සමාජය වැඩවසම් සමාජය විසින්ද වැඩවසම් සමාජය ධනවාදී සමාජය විසින්ද ප්‍රතිෂ්ඨාපනය කෙරුණි. එසේම ධනවාදී සමාජය කොමියුනිස්ට් සමාජය විසින් ප්‍රතිෂ්ඨාපනය කරනු ඇත.

මෙම සංවර්ධන ක්‍රියාදාමය නැතිනම් අලුත් දෙයෙහි බිහිවීම යනු හුදෙක් පැරණි දෙය ඉවත ලෑමක් හෝ පැරණි දෙය නිරපේක්ෂ ලෙස විනාශ කිරීමක් හෝ නොවේ. එය පැරණි දෙයෙහි අභ්‍යන්තර සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවන අලුත් දෙයකි. එනිසාම පැරණි දෙයෙහි වූ සාධනීය හා යහපත් ගුණාංග ආරක්ෂා කර ගනිමින් ඒවා අලුත් සහ වඩාත් උසස් තත්වයක් ලෙස නව දෙයෙහි අඩංගු කර ගනී.

මෙම සංවර්ධන ක්‍රියාදාමය නැතහොත් අලුත් දෙයෙහි බිහිවීම සමාජයට මෙන්ම රජය, දේශපාලන පක්ෂ, මතවාද, සංස්කෘතිය ආදී සමාජමය ප්‍රපංචයන්ට ද ආදළ වේ. ඒ අනුව නව මතවාදයක් වශයෙන් මාක්ස්වාදයේ බිහිවීමටද එය අදාලය.

**''විප්ලවකාරී නිර්ධන පංතියේ දෘෂ්ටි වශයෙන් මාක්ස්වාදය සමස්ත ලෝක ඓතිහාසික වැදගත්කමක් හිමිකර ගත්තේ එය ධනවාදී යුගයේ වටිනා ජයග්‍රහණ කිසිසේත් ඉවත නොදමා, වර්ෂ දෙදහස් ගණනකටත් වඩා පැරණි මානව චින්තන සහ සංස්කෘතික වර්ධනයෙන් ලද වටිනා සියල්ලම හිමිකර ගෙන සකස් කරගත් හෙයිනි. ''**

**-ලෙනින්- සම්පූර්ණ කෘති - 41 වෙළුම 337 පිටුව-**



එබැවින් මාක්ස්වාදීන් අලුත් දෙයෙහි බිහිවීම, ඉතිහාසයේ ගමන් මග තේරුම් ගන්නේ ඒ ආකාරයෙනි. එහෙත් ඉතිහාසයේ සහ සමාජ ප්‍රපංචවල සංවර්ධනය සහ ගමන් මග යාන්ත්‍රිකව වටහා ගන්නා ඇතැම්හු නව දෙයෙහි බිහිවීම පිළිබඳ වැරදි නිගමනවලට එළඹෙති.

ඇතැමෙක් නව දෙයෙහි බිහිවීම ප්‍රතික්ෂේප කරමින් අතීතය අගය කිරීමේ, ඉතිහාසය අගය කිරීමේ යෙදෙන අතර අනෙකෙක් ඉතිහාසමය සම්බන්ධතාව ප්‍රතික්ෂේප කරමින් නව දෙයෙහි බිහිවීම ඔපපාතික කරති. ඉතිහාසයේ ගමන්මග තේරුම් ගැනීමේ මේ ආකාරයන් දෙකම වැරදිය. ඇත්තෙන්ම ඉතිහාසය ගොඩනැගෙන්නේ ඒ ආකාරයෙන් නොවේ.

පළමු කී ලෙස ඉතිහාසය තේරුම් ගන්නෝ පැරණි දෙය නිරපේක්ෂ ලෙස අගය කිරීමේ යෙදෙති. ඉපැරණි සෞභාග්‍යය යළි ගොඩනැගීම පිළිබඳ බලාපොරොත්තු දල්වති. ඔවුන්ට අනුව සෞභාග්‍යමත්ම, සශ්‍රීකම කාලය ඉතිහාසයට අයත් දෙයකි. සමාජය ගමන් කරමින් සිටින්නේ පරිහානියටයි. සෞභාග්‍යය උදා කරලීමට නම් අප අතීතයට යා යුතුය.

අතීතය උත්කර්ශයට නංවන මෙවැනි මත සාවද්‍යය. එමගින් ඉතිහාසයේ ගමන් මග නිවැරදිව පැහැදිලි නොකරන අතර ප්‍රතිගාමීත්වයට මග පාදයි. මූලධර්මවාදී මතයන්ට සරුපසක් සාදයි.

ඉතිහාසයේ ගමන් මග අනෙක් අන්තයේ සිට විග්‍රහ කරන්නෝ නව දෙයෙහි ඉතිහාසමය සම්බන්ධතාව නොසලකා හරිමින් නව දෙය ඔපපාතික කරති. පැරණි දෙය ඉවත ලෑමක්, පැරණි දෙය නිරපේක්ෂ ලෙස විනාශ කිරීමක් ලෙසට එය අර්ථ ගන්වති. ඒ අනුව සමාජ ප්‍රපංචයන් යාන්ත්‍රික ලෙස, කෘත්‍රිම ලෙස වෙනස් කිරීමට, ගොඩ නැංවීමට උත්සාහ දරති. ආසියාතික අගතීන් ප්‍රතික්ෂේප කරමින් පිරිසිදු, පරම, පවිත්‍ර නිර්ධන පංති සංස්කෘතියක් ගොඩනැගීම පිළිබඳ සාකච්ඡා කරති. නව ජීවන විලාසයක් හඳුන්වාදීමට උත්සාහ දරති.

සෝවියට් රුසියාවේ විප්ලවයෙන් පසු මුල් කාලයේදී ''ප්‍රොලිත් කුල්ත්'' (නිර්ධන පංති සංස්කෘතිය) නමැති සුළු ධනපති ප්‍රවණතාවයේ නියෝජිතවරුන් ධනවාදී සමයේදී නිර්මාණය කළ සෑම දෙයක්ම සම්පූර්ණයෙන්ම ඉවත්කොට, සම්පූර්ණයෙන්ම පාලු හිස් බිමක නිර්ධන පංති සංස්කෘතිය ගොඩනැගිය යුතුයැයි කීහ. ලෙනින් ප්‍රොලිත් කුල්ත්වරුන්ගේ එම මතවාදය දැඩි ලෙස විවේචනය කළේය.

**''නිදසුනක් වශයෙන්, අප නිර්ධන පංති සංස්කෘතිය ගැන කථා කරන විට, මෙය සිහියේ තබා ගතයුතුය. මිනිස් සංහතියේ මුළුමහත් වර්ධනය බිහි කරන ලද සංස්කෘතිය පිළිබඳව නිවැරදි දැකීමකින් සහ පරිණාමයකින් පමණක් නිර්ධන පංති සංස්කෘතියක් නිර්මාණය කළ හැකිය. නැතිනම් අපට මෙම ගැටලුව විසඳාලිය නොහැකිය යන්න ගැන අප පැහැදිලි ලෙසම දැනගෙන සිටිය යුතුය. නිර්ධන පංති සංස්කෘතිය අදිසි තත්වයකින් බිහිවූවක් නොවේ. එය නිර්ධන පංතික සංස්කෘතිය පිළිබඳව විශේෂඥයින් යැයි කියා ගන්නා මිනිසුන් විසින් නිපදවන ලද දෙයක්ද නොවේ. මේවා සියල්ල විකාර කතාය. නිර්ධන පංති සංස්කෘතිය ධනවාදී ඉඩම් හිමි සහ නිලධාරීවාදී සමාජයේ වියගහට යටවී සිටි මිනිස් සංහතිය ඒකරාශී කරගත් දැනුම් සම්භාරයේ තාර්කික වර්ධනය විය යුතුය. මාක්ස් විසින් යළි හැඩ ගන්වන ලද දේශපාලන ආර්ථිකය මතින් සමාජය පැමිණිය යුත්තේ කොතැනටදැයි පෙන්වූ පරිදි, පංති සටන්වලටද, නිර්ධන පංති විප්ලවයේ ආරම්භයටද මග පෙන්වූ පරිදි මේ සියලු මාර්ග ඉදිරියට යමින් නිර්ධන පංති සංස්කෘතියට මග හෙළි කරනු ඇත.''**

**-ලෙනින්- තරුණ සමිතිවල කාර්යභාරයන් 1920 ඔක්තෝබර් 02**

සමාජය විග්‍රහ කිරීමෙන් නොනැවතී එය වෙනස් කිරීම මාක්ස්වාදීන්ගේ කාර්යභාරයයි. එහෙත් එය කළ හැක්කේ ඉතිහාසය ගොඩනැගෙන්නා වූ ආකාරය නිවැරදිව වටහා ගතහොත් පමණි. එසේ නොවුණ කල ඔවුන්ට සමාජය වෙනස් කළ නොහැකි වන අතරම හුදු විප්ලවවාදී වාග් පාඨ දොඩවන්නන් බවට පත්වීමට සිදුවේ.

ඕනෑම ප්‍රපංචයක් වර්ධනය වන්නේ, එහි අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන්ගේ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසය. එම ප්‍රපංචය වෙනස් කිරීමට නම් අප එකී ප්‍රපංචයේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් හඳුනාගත යුතු අතර වෙනසකට අවශ්‍ය මැදිහත් වීමේ ආකාරය තීරණය කළ යුත්තේ ඊට අනුකූලවය. වෙනස් කිරීමේ වුවමනාව පමණක්, වෙනසක් කිරීමට ඇති හදිසියට පමණක් ප්‍රපංචයන්ගේ වෙනස්කම් සිදුකළ නොහැකිය. එසේම එකී ප්‍රපංචයේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් හඳුනා ගනිමින් ඊට අනුකූල මැදිහත් වීම අප විසින් සිදු කරනු ලබන්නේ නම් එහි බාහිර පෙනුමේ වෙනස්කම් කිරීම පිළිබඳ අප කලබල වියයුතු නොවේ. මක් නිසාද යත් අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන්ගේ අරගලය විසඳන ආකාරය විසින් පෙනුමේ වෙනස්කම් අනිවාරණීය ලෙස සිදු කරන බැවිනි.

ඇතැමෙක් සමාජ විඥානයේ ඇතැම් පසුගාමී ලක්ෂණ වෙනස් කිරීම පිළිබඳව මහත් උනන්දුවකින්, මහත් ප්‍රමුඛතාවයකින් කථා කරති. ආගම විසින් පාලකයන් ශක්තිමත් කරමින්, ජනතා අරගලය මොට කරන බැවින් ආගම්වලට එරෙහිව කටයුතු කළ යුතු යැයි යමෙකුට යෝජනා කිරීමට පුළුවන. බැලූ බැල්මට එය සාධාරණ යැයිද අයෙකුට පෙනී යාහැකිය. එහෙත් සමාජ විඥානයේ එකී පසුගාමී ලක්ෂණ උරුම වූයේ කෙසේද?, එනම් එහි ඓතිහාසික සංවර්ධනයේ පියවරයන් මොනවාදැයි ඔවුහු අමතක කරති. ඒවා වෙනස් කිරීමට නම් පළමුව සමාජ සත්තාව වෙනස් කළ යුතු බවද අමතක කරති.

දේශපාලන ක්‍රියාකාරිත්වයේදී ආගමික ප්‍රශ්නවලට මුල්තැන දීම ගැන අදහස් දක්වන ලෙනින් 'සමාජවාදය සහ ආගම' නමැති සිය ලිපියේදී මෙසේ කියා තිබේ.

**''එහෙත් කිසිම අවස්ථාවකදී හෝ ආගමික ප්‍රශ්නය හුදු වියුක්ත විඥානවාදී හැඩයකට, පංති සටන්වලට සම්බන්ධ නොවූ, 'බුද්ධිමය' ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කිරීමේ වරදට අපහසු නොවිය යුතුය. ධනපතීන් අතර සිටින රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදීහු මෙවැනි දෑ නිතර පාහේ කරති. ඉමක් නැති පැශීම් හා නින්දා අපහාසවලට කම්කරු පංතිය භාජනය කිරීම පදනම වී ඇති සමාජයක ආගම පිළිබඳ අගතිගාමී හැඟීම්, හුදු ප්‍රචාරක ක්‍රමවලින් පමණක් දුරුකරලිය හැකියැයි සිතීම මෝඩ අදහසකි. මිනිස් සංහතිය මත පටවා ඇති ආගම නමැති වියගහ සමාජය තුළ තිබෙන ආර්ථික වධ බන්ධන නමැති විය ගහේම ප්‍රතිබිම්භයක් බව අමතක කිරීම ධනවාදී පටු බුද්ධියක් වනු ඇත. නිර්ධන පංතිය ධනවාදයේ පාපතර බලවේගයන්ට විරුද්ධව සටන් කොට, ලෝකාවබෝධයක් ලබාගෙන නැත්නම්, කොතෙක් පොත් පිංචවල් මුද්‍රණය කළත් කොතෙක් දේශනා කළත් එයට ලෝකාවබෝධය ලබාගත නොහැකිය. මිහිපිට පාරාදීසයක් බිහි කිරීම සඳහා පැගෙන පංතීන්ගේ මේ සැබෑ විප්ලවවාදී අරගලයේදී සමගිය ගොඩ නැගීම, ස්වර්ගයේ පාරාදීසය පිළිබඳ නිර්ධන පංති මතයේ එක්සත්කමට වඩා අපට වැදගත් වන්නේය.''**

**-ලෙනින් - සම්පූර්ණ කෘති - වෙළුම 12 පිටුව 142-147**


ඉතිහාසය ගොඩ නැගෙන්නේ කෙසේද යන්න නිවැරදිව වටහා ගැනීමට අපොහොසත් වන්නෝ බොහෝ විට ඓතිහාසික කරුණු විග්‍රහ කර ගැනීමේදී ද වරද්දා ගනිති; පාර්ශ්වික වෙති; විවිධ අභිලාෂයන්ගේ ගොදුරු බවට පත්වෙති.

මේ පිළිබඳව අදහස් දක්වන රෝහණ විජේවීර සහෝදරයා අත්දැකීම් කිහිපයක් නම් සිය ලේඛනයේදී මෙසේ කියා තිබේ.

**''සෑම සිදුවීමක්ම ද්විඝටනාත්මක ලෙස සලකා බලන විට අන්තර් බැඳීම් වලින් යුක්තව පවතී. සෑම දෙයක්ම හැදෑරිය යුත්තේ, ඒ ඓතිහාසික තත්වයන් තුළය. මාක්ස්වාදී ද්විඝටනය ලෝකය හැදෑරිමේදීත්, විශ්ලේෂණය කිරීමේදීත් පිළිගන්නා ක්‍රමය එයයි. මෙය වැරදි සම්බන්ධයෙන්ද පොදුය. වැරැද්ද අන් ඕනෑම දෙයක් මෙන්ම හැදෑරිය යුත්තේත් විශ්ලේෂණය කළ යුත්තේත්, තේරුම්ගත යුත්තේත් ඒවා සිදු වූයේ යැයි සැලකෙන ඓතිහාසික තත්වයන් තුළය. ඓතිහාසික තත්වයන් මගහැර අන්තර් සම්බන්ධතාවයන් කපා දමා යම් විෂය වස්තුවක් හැදෑරීමට ගියහොත් එහිදී බැස-ගන්නා නිගමන මනෝමූල හා සාවද්‍ය වන බව මාක්ස් ලෙනින් චින්තාව අපට අවධාරණයෙන් උගන්වයි''**

**-රෝහණ විජේවීර- අත්දැකීම් කිහිපයක්-පිටුව 8**


දේශපාලන පක්ෂයක් විසින් ගත් ක්‍රියාමාර්ග අගය කිරීමේදී එකී ක්‍රියාමාර්ග යන් ගැනීමට බල කරනු ලැබූ වටපිටාව අමතක නොකළ යුතුය. අදාල වටපිටාවේදී එකී ක්‍රියාමාර්ගය නිවැරදි දැයි සලකා බැලිය යුතුය. ඉතිහාසයේ ගතිකත්වය තේරුම් ගැනීමේදී වරද්දගැනීම ක්‍රියාකාරිත්වයේදී බරපතළ වරද්දා ගැනීම්වලට මග පාදයි. විශේෂයෙන් දේශපාලන ක්‍රියාකාරිත්වයේදී මතුවන එවැනි වරද්දාගැනීම් බරපතළ ප්‍රතිඵල අත්කර දෙයි.



ඉතිහාසයෙන් පමණක් නොව පුවත්පත් කලාවේදීන්ගෙන් පවා මගේ මිතුරා රැකදෙනු.

**චේ වෙනුවෙන් කැස්ත්‍රෝ**

# ජ.වි.පෙ. යළි ගමන් අරඹයි!



1994 මහ මැතිවරණය ජ.වි.පෙ.ට තීරණාත්මක දේශපාලන කඩඉමක් විය. සතුරා විසින් විනාශ කිරීමට උත්සාහ කළ ජ.වි.පෙ. යළි ගොඩනැගිය යුතුව තිබිණි. සියලුම සංවිධාන විසිරී තිබූ තත්වයක් තුළ, පක්ෂයේ නායකයින් සාතිශය බහුතරය ඝාතනය කර තිබූ තත්වයක් තුළ, හා මර්දනකාරී වටපිටාවක් පවතින තත්වයක් තුළ එය ඉමහත් දුෂ්කර කාර්යයක්ව තිබිණි. එබැවින් ජ.වි.පෙ. ප්‍රසිද්ධ දේශපාලනයට කඩා වැදිය යුතුව තිබුණි. සීමිත ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය අත්පත් කරගත යුතුව තිබිණි. ඒ සඳහා ජ.වි.පෙ.ට ඉඩකඩ විවර කිරීමට කිසිවෙකු සූදානම් නොවූ තත්වයක් තුළ ජ.වි.පෙ. තමන් විසින්ම එම ඉඩකඩ අත්පත් කරගත යුතුවිය. 1994 මහ මැතිවරණයට ඉදිරිපත් වීම සාතිශය වැදගත් වූයේ ඒ නිසාය.

මේ වනවිටද රට තුළ සංවිධාන මධ්‍යගතභාවයක් ගොඩනැගී තිබුණේ නැත. පක්ෂය පැවතියේ විසුරුණු පිරිස් ලෙසය. එම විසිරුණු පිරිස් අතර තාවකාලික ඒකාබද්ධතාවයක් නිර්මාණය කරගනිමින් මැතිවරණයට මුහුණ දීමට පක්ෂයට සිදුවිය. එම කාර්යයට උරදීමට සිදුවූයේ, විදේශගතව සිටිමින් සෝමවංශ අමරසිංහ සහෝදරයාටය.

මැතිවරණයට ඉදිරිපත්වීමේදී තිබූ ඊළඟ බරපතළ බාධකය වූයේ, ජ.වි.පෙ. නිල අයිතිය පිළිබඳව ගැටලුවය. පක්ෂයේ නායකයින් ඝාතනය වීමත් සමඟ පක්ෂයේ නිල අයිතිය පැහැර ගැනීමේ සතුරු කුමන්ත්‍රණයක්ද ක්‍රියාත්මක වෙමින් තිබිණි. එහෙත් විදේශගතව සිටිමින් සෝමවංශ අමරසිංහ සහෝදරයා මැතිවරණ කොමසාරිස්වරයාට ලිපි ලියමින් පක්ෂයේ නිල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව එම දිනවල පක්ෂයේ ප්‍රධාන ලේකම් ලෙස මැතිවරණ කොමසාරිස්වරයා සමඟ කටයුතු කළේ සෝමවංශ අමරසිංහ සහෝදරයාය. මැතිවරණයට නාමයෝජනා බාරදීමේදී ප්‍රධාන ලේකම්වරයා විසින් නාමයෝජනා අත්සන් කළ යුතු වීමත් එහෙත් ආරක්ෂාව මත සෝමවංශ අමරසිංහ සහෝදරයාට ඒ වන විට රටට පැමිණීමේ අනතුරත් ජ.විපෙ. ලෙස තරඟ වැදීමේ දුෂ්කරතාවයක්ද මතුවී තිබුණි. එම දුෂ්කරතාවය හා පවති දේශපාලන තත්වයද සලකා මහමැතිවරණයට ඉදිරිපත්වීම සඳහා පෙරමුණක් ගොඩනැගීමට ජ.වි.පෙ. කටයුතු කළ අතර ආරිය බුලේගොඩ මහතාගේ ප්‍රගතිශීලී පෙරමුණ හා ඒකව ජාතිය ගලවාගැනීමේ පෙරමුණ ගොඩනගන ලදී.

94 මහ මැතිවරණයට ඉදිරිපත්වීමට ගත් තීරණය පිළිබඳවද විවාදයක් පැවතිණි. පවතින දේශපාලන තත්වය හොඳින් විග්‍රහකර නොගත් සමහර සහෝදරවරු එම අවස්ථාවේ මැතිවරණයකට ඉදිරිපත්වීම තුළින් හෙළිදරව් නොවී සිටින සහෝදරවරුන්ද හෙළිදරව් විය හැකි බවත් ඔවුන් වෙතද මර්දනය පැමිණිය හැකි බවත් සඳහන් කරමින් තරඟ වැදීමේ තීරණයට අකමැත්ත ප්‍රකාශකළහ. එහෙත් මහ මැතිවරණය අපට යළි පක්ෂය ගොඩනැගීම සඳහා ප්‍රසිද්ධ දේශපාලනයට පිවිසීමට ලැබී තිබෙන මගහැර යා නොහැකි අවස්ථාවක් නිසා කෙසේ හෝ තරඟ කළ යුතුය යන ස්ථාවරයේ සිටි සෝමවංශ අමරසිංහ සහෝදරයා ඇතුළු සහෝදරවරු තරඟ වැදීමේ තීරණය ක්‍රියාවට නැගූහ. ජ.වි.පෙ. සිය ඉතිහාසය තුළ ගත් ඉතාම නිවැරදි තීරණ අතර 94 මහ මැතිවරණයට තරඟ කිරීම සඳහා ගත් තීරණය ඉදිරියෙන්ම පවතින නිවැරදි තීරණයක් බව පසුව තහවුරු විය.

ඉතාම දුෂ්කර කොන්දේසි යටතේ නාමයෝජනා සකස්කර ගනිමින් ජාතිය ගලවා ගැනීමේ පෙරමුණ නමින් ජ.වි.පෙ. තරඟ වැදුණු අතර මැතිවරණය නිමාවූයේ, ජ.වි.පෙ. හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් මන්ත්‍රී ධූරයක් දිනාගනිමිනි. එය ජ.වි.පෙ. ඉතිහාසයේ ලද පළමු පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය විය. එය ඉතාම වැදගත් ජයග්‍රහණයක් වූ අතර ජ.වි.පෙ. ප්‍රසිද්ධ දේශපාලනය තුළ යළි ගමන් ඇරඹුවේ, එම මන්ත්‍රී ධූරයද සමගිනි. 1989 මහා මර්දනයෙන් පසු සතුරන් ජ.වි.පෙ. පිළිබඳව පළකළ සියලු අනාවැකි බොරු කිරීමට මේ අනුව ජ.වි.පෙ. සමත්විය. 89 රෝහණ සහෝදරයා ඝාතනය කිරීමෙන් පසු එවකට නියෝජ්‍ය ආරක්ෂක ඇමති ධූරය දැරූ රංජන් විජේරත්න මාධ්‍යවලට පවසා තිබුණේ, ''මැච්එක අවසානයි'' කියාය. පංති සතුරා ජ.වි.පෙ. අවසාන බව කියද්දී පක්ෂයේම දුර්වලයින් හා පාවාදුන් අය පක්ෂය යළි ගොඩනැගිය නොහැකි බව විශ්වාස කර තිබුණි. එහෙත් සැබෑ විප්ලවවාදීන් ලෙස කටයුතු කළ සහෝදරවරු රෝහණ විජේවීර සහෝදරයා නැතිව සිටියෙදී පවා යළි පක්ෂය ගොඩනගමින් ජ.වි.පෙ. කෙබඳු දේශපාලන ව්‍යාපාරයක්ද යන්න ඔප්පුකර පෙන්වූහ. ජ.වි.පෙ. මේ වන විටත් අපේ රටේ ප්‍රධාන වමේ ව්‍යාපාරය වන අතර ප්‍රධාන දේශපාලන පක්ෂ තුනෙන් එකක් ලෙස කටයුතු කරමින් සිටී.

ජ.වි.පෙ. ඉතිහාසයේ ප්‍රධාන සංධිස්ථාන කිහිපයක් තිබේ. ඉන් පළමුවැන්න 1965 මැයි 14 නව පක්ෂයකට උපත දෙමින් රෝහණ සහෝදරයා විසින් පැවැත්වූ අක්මීමන සාකච්ඡාවය. ඉන්පසු 1971 අරගලයේ පරාජය සමඟ ජ.වි.පෙ. එක් පරිච්ඡේදයක් නිමාවූ අතර 1977 සිට ජ.වි.පෙ. අලුත් ජවයකින් ගමන් ඇරඹීය. නව දේශපාලන පරිච්ඡේදයක් වෙත පා තැබීය. යළි 1983දී පක්ෂයට ප්‍රජාතන්ත්‍රවාදය අහිමිකරමින් පක්ෂය තහනම් කිරීමත් සමඟ ප්‍රසිද්ධ දේශපාලනයේ පරිච්ඡේදය අවසන්වී රහසිගත දේශපාලනය ආරම්භ විය. දේශප්‍රේමී සන්නද්ධ අරගලය 1987 දී ආරම්භවූයේ, ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරන ලැබ තිබූ එම වකවානුව තුළය. 1989 රෝහණ සහෝදරයා ඇතුළු පක්ෂ නායකයන් ඝාතනය කිරීමත් සමඟ ජ.වි.පෙ. තවත් දේශපාලන පරිච්ඡේදයක් නිමා විය. ඉන්පසු ජ.වි.පෙ. අලුත් දේශපාලන පරිච්ඡේදයකට පා තැබුවේ 1994 මහ මැතිවරණය සමඟය.

1965 සිට ගෙවුණු වසර 46ක කාලය තුළ 1970-71 කාලයේ හා 1983-89 කාලයේ සතුරාගේ මර්දනයට මුහුණ දීමට ජ.වි.පෙ.ට සිදුවිය. එසේම දෙවරක් සතුරු පංතියේ මර්දනයට එරෙහිව මෙන්ම විදෙස් ආක්‍රමණවලට එරෙහිව ජ.වි.පෙ. අවිදැරූ සටන් දෙකකටද නායකත්වය දී තිබේ. එහිදී දහස් ගණනක් විප්ලවවාදී සොයුරු සොයුරියෝ දිවිපිදූහ. වසර 46ක ජ.වි.පෙ. ගමන් මග වැටී තිබුණේ, රෝසමල් ඇතිරූ සුමට මඟක නොවේ. අභියෝග, අර්බුද කමන්ත්‍රණ, පාවාදීම්, ද්‍රෝහීකම්, කල්ලිවාදයන්, මර්දනයන්, ඝාතනයන් මැද ආ එම ගමන අතිශය සංකීර්ණ හා දුෂ්කර එකක් විය. ඒ ගමන්මග තුළ ජ.වි.පෙ. ජයග්‍රහණ මෙන්ම පරාජයන්ද ලැබීය. ඒ ගමන්මග තුළ පක්ෂය පෙන්වූ සාධනීය ලක්ෂණ මෙන්ම නිෂේධනීය ලක්ෂණද විය. හොඳ දේ මෙන්ම අඩුපාඩුද විය. ජ.වි.පෙ. මාක්ස්-ලෙනින්වාදී පක්ෂයක් ලෙස සැමවිටම තම අඩුපාඩු තේරුම් ගනිමින් ඒවා නිවැරදි කරගනිමින් ඉදිරියට ආ පක්ෂයකි.

මේ ගෙවුණු සමස්ත කාලය තුළ ජ.වි.පෙ. විවිධ උපක්‍රම තෝරා තිබේ. ක්‍රියාමාර්ග ගෙන තිබේ. ඒවායේ සාධනීය ප්‍රතිඵල මෙන්ම සමහර විට නිෂේධනීය ප්‍රතිඵලද තිබේ. එහෙත් ජ.වි.පෙ. කිසිවිටකත් පංතිය පාවාදී නැත. පංතියට ද්‍රෝහී වී නැත. මරණය ඉදිරියේදී පවා පංතියත් තම දේශපාලන අරමුණුත් පාවා නොදුන් පක්ෂයක් ලෙස ජ.වි.පෙ.ට හිමි ගෞරවය කිසිවෙකුට කෙළෙසිය නොහැක.

ගෙවුණු ඉතිහාසය තුළ බාහිර සතුරන්ගේ (ධනපති පංතියේ) ප්‍රහාරයන්ට මෙන්ම අභ්‍යන්තර සතුරන්ගේ ප්‍රහාරයන්ට, කුමන්ත්‍රණයන්ට හා පාවාදීම්වලට මුහුණ දීමට ජ.වි.පෙ.ට සිදුවිය. 1970-71 මර්දන සමයේත් 71 අරගලයෙන් පසු සිරගෙවල්වලත් 1983 තහනම් සමය තුළත් 1988-89 මර්දනය තුළත් 1994දීත් මෙවැනි අත්දැකීම්වලට ජ.වි.පෙ මුහුණ දී ඇත. අභ්‍යන්තර කල්ලිවල කුමන්ත්‍රණ, මහා පාවාදීම්, ද්‍රෝහීකම් හමුවේ ඉන් විශාල ලෙස හානි සිදුවෙද්දී පවා ඒ සියල්ල පරාජය කරමින් පෙරට යාමට ජ.වි.පෙ. සමත් වී තිබේ. එය සුවිශේෂී අත්දැකීමකි. දේශපාලන ව්‍යාපාර වර්ධනය වන්නේ, න්‍යාය හා භාවිතය යන දෙපාර්ශ්වයේම ක්‍රියාකාරිත්වය හා ඉන් ලබන අත්දැකීම් තුළය. පහරදීමට මෙන්ම පසුබැසීමටද දේශපාලන පක්ෂ උගත යුතු අතර දේශපාලන පක්ෂ එය ඉගෙන ගන්නේ, තමන්ගේම අත්දැකීමෙනි. මේ පිළිබඳව ලෙනින් වරක් මෙසේ පවසා තිබිණි.

''විප්ලවවාදී පක්ෂවලට ඒවායේ අධ්‍යාපනය සම්පූර්ණ කර ගැනීමට සිදුවිය. ඔවුහු පහර දෙන ආකාරය ගැන උගෙන ගනිමින් සිටියහ. එවැනි දැනුමට අමතරව, ක්‍රමානුකූලව පසුබසින්නේ කෙසේද යන්න ගැනද දැන් දැනුම ලබාගත යුතු බව අවබෝධ කරගැනීමට ඔවුන්ට සිදුවිය. නිසි ලෙස පහර දීමටත් පසුබැසීමටත් යමෙක් උගෙන ගෙන නැතිනම් ජය ගැනුමක් කිසිසේත් නොමැති බව වටහා ගැනීමට ඔවුන්ට සිදුවිය. විප්ලවවාදී පංතිය මෙම කරුණ වටහා ගැනීමට උගෙන ගන්නේ අමිහිරි අත්දැකීම් තුළිනි.''- ලෙනින් තෝරාගත් කෘති 10 වෙළුම138 පිටුව

සිය ඉතිහාසය තුළ ජ.වි.පෙ. අමිහිරි අත්දැකීම් තුළින් ඉගෙන ගත් පක්ෂයක් වී තිබේ. දේශපාලන පක්ෂවල ගමන්මග සකස් වන්නේ, කිසිවෙකුගේ පෞද්ගලික අභිලාෂය මත නොවේ. එය තීරණය වන්නේ විෂයමූල හා මනෝමූල සාධක අනුවය. එය තීරණය වන්නේ, විප්ලවවාදී පංතියේ කැමැත්ත මත පමණක් නොවේ. විප්ලවවාදී පංතියත් සතුරු පංතීනුත් අතර වන ප්‍රතිවිරෝධය තුළය. පංති සටන තුළය. ඉතිහාසයේ සංවර්ධනයේ දයලෙක්තිකය එයයි. එය වටහා ගනිමින් තමන් ඉදිරිපිට නිර්මාණය වන අභියෝගයන්ට විසඳුම් සෙවීම, උපක්‍රම තේරීම හා තීරණ ගෙන එය ක්‍රියාවේ යෙදවීම පක්ෂයේ වගකීම වෙයි. ජ.වි.පෙ. ගෙවුණු ඉතිහාසය එවැනි සජීවී ඉතිහාසයකි. පංති සටන් ඉතිහාසයකි. අප මේ ලිපිපෙළ පුරා කෙටියෙන් සාකච්ඡා කළේ, එම ඉතිහාසයේ ප්‍රධාන සංධිස්ථානයන් ගැනය. එම ඉතිහාසය ගලා ආ ආකාරය පිළිබඳවය. එහිදී අප සාකච්ඡා කළේ, 1965 සිට 1994 දක්වා පක්ෂයේ ඉතිහාසයේ ගමන් මග පිළිබඳවය.

ඉතිහාසයක් අවසන් වන්නේ නැත. එය අතීතයට අත්දැකීම් එකතු කරමින් නොනැවතී ගමන් කරයි. ඒ නිසාම ඉතිහාසය ලියා අවසන් කිරීමටද නොහැක. පක්ෂයක ඉතිහාසය සම්බන්ධයෙන්ද සත්‍යය එයයි. කෙසේ වෙතත් ජ.වි.පෙ. ඉතිහාසය දෙස කෙටියෙන් විමසා බැලූ මෙම ලිපි මාලාව මෙයින් අවසන් කරමු. ඒ යළිත් 1994 සිට ගෙවුණු ඉතිහාසය පිළිබඳ සාකච්ඡා කිරීමේ බලාපොරොත්තුව ඇතිවය.





# දෙවැනි ඉනිමට ලකුණු එකතු කළ අයවැයක්

රාජපක්ෂ ආණ්ඩුව තම පාලනයේ 7 වන අයවැය පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. අයවැයෙන් පසු ඉදිරි වසර සඳහා ආණ්ඩුවේ වියදම හා එම වියදම පියවා ගන්නා ආදායම් මාර්ග යන් පෙන්වන ලේඛනයයි. ආණ්ඩුවේ ආදායම වියදම පුරෝකථනය කරන්නේ, අයවැය මගින්ය. ආදායමට වැඩි වියදම අයවැය හිඟය වේ. අයවැය හිඟය පියවන්නේ අයවැය යෝජනාවලින්ය. මෙම සරල ආර්ථික විද්‍යාත්මක සිද්ධාන්ත අනුගමනය කරන්නේ නම්, ආණ්ඩුවේ මුළු වියදම හා මුළු ආදායම අයවැය ලේඛනයක පෙන්විය යුතු වුවත් වර්තමානයේ ධනපති ආණ්ඩු ඉදිරිපත් කරන අයවැය ලේඛනයෙහි එවැනි සත්‍ය ආදායම හෝ වියදම් විග්‍රහයක් ඉදිරිපත් නොකරයි. ඒ වෙනුවට ඇත්තේ, සිහින පෙන්වීම හා සහන කැපිල්ලය.

රාජපක්ෂ පාලනයේ 7 වන අයවැයද ජනතාවට සිහින පෙන්වා සහන කැපූ අයවැයකි. එසේම රාජපක්ෂ පාලනය ධනපති ක්‍රමයේ ඉටුකරන රාජකාරිය අකුරටම ඉටු කිරීම අරමුණු කරගෙන සකස්කළ අයවැයකි. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේදී කී නිවැරදි ආකාරයටම පසුගිය අයවැය හා බැඳුණු අයවැයකි. පසුගිය අයවැයෙන් ආණ්ඩුව නව ලිබරල් ධනවාදයේ දෙවැනි ඉනිම, රනිල් වික්‍රමසිංහ පාලනය නතර කළ තැනින් දෙවැනි ඉනිම ඇරඹීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කළේය. මෙවර අයවැයද එහිම ඉදිරි පිම්මකි. ආණ්ඩුව සහන කපා ඇත්තේ, පොදු ජනතාවගේය. සහන ලබා දී ඇත්තේ, සංචාරක කර්මාන්තය මුවාවෙන් ආර්ථිකය ආක්‍රමණය කරන බහුජාතික ප්‍රාග්ධනයටය. සංචාරකයාගේ හැඳි ගෑරුප්පුවේ සිට තෝප්පිය දක්වා බදු සහන දීමට මතක් වෙන ආණ්ඩුවට රජයේ සේවකයාගේ සිට හැත්තෑලක්ෂයක් වන පෞද්ගලික අංශයේ වැඩ කරන ජනතාව අමතක වන්නේ එබැවිනි. සංචාරක කර්මාන්තයේ ප්‍රයෝජනයට ගෙන්වන විශාල බස් රථයේ බදු අඩුකරන අතරේම ත්‍රීරෝද රථයේ බදු වැඩිකරන්නේද ඒ නිසාය. කතාවෙන් දේශප්‍රේමී ආණ්ඩුවේ ජනතා ද්‍රෝහී ක්‍රියාමාර්ග අයවැය මගින්ද ප්‍රකාශයට පත් කර ඇත.

ජනතාවගේ අපේක්ෂාව අයවැයෙන් වෙන්කරන ප්‍රතිපාදන, ඉදිරිපත් කරන යෝජනා එලෙසම ජනතාවට සහනයක් දෙන්නේය යන්නය. නමුත් ධනපති ආණ්ඩුවේ අපේක්ෂාව එසේ වෙන් කරන ප්‍රතිපාදනවලින් ජනතාවට සහන ලබා දීම නොවේය. ආණ්ඩුව ක්‍රියාත්මක වන්නේ පාර්ලිමේන්තුවේ සම්මත කරන අයවැයට අනුව නොවේ. දුබල ධනපති ආණ්ඩුවකින් එසේ බලාපොරොත්තු වීම පවා තේරුමක් නැත. මෙවර අයවැය මගින් මෙන්ම පසුගිය අයවැය මගින්ද ඒ බව සක්සුදක් සේ පැහැදිලි වන්නේය.

**රණවිරු රැවටිල්ල**

පසුගිය අයවැය මගින් ආබාධිත හමුදා සෙබළුන්ගේ පවුලක උපදින තුන්වන දරුවාට රු. ලක්ෂයක් ලබාදීමට පොරොන්දු විය. එසේ ලක්ෂය බැගින් හිමි වී ඇත්තේ කාටදැයි පැහැදිලි කිරීමකින් තොරවම මෙවර අයවැයේද හමුදා පවුල්වලට පමණක් නොව පොලීසියේ නිලධාරීන්ගේ තුන්වන දරුවාටද රු. ලක්ෂයක් බැගින් බෙදා දෙන්නට පොරොන්දු දෙන්නේය. පසු ගිය අයවැය මගින් විදේශගතවන ලාංකිකයින් තව විශේෂ රක්ෂණ, විශ්‍රාම අරමුදලක් ලබා දීමට මිලියන 1200ක් වෙන් කෙරිණි. ඒ සඳහා රජය දරන වියදම අයකර ගැනීමේ වක්‍ර ක්‍රමයක් ලෙස ජාත්‍යන්තර දුරකතන බිලට විනාඩියකට රු. 2 බැගින් වැඩි කෙරිණි. එසේ අය කිරීමේ ගාස්තු ඉහළ දමා ආණ්ඩුව ආදායමක් උපයා ගත්තද විදේශගතව රැකියා කරන ලක්ෂ ගණනක් වන වැඩකරන ජනතාවට ලැබුණු යහපතක් නැත. විදේශ ගැන ශ්‍රමිකයන් ගැන මෙවරද අයවැය කතාවේ සඳහන් කරමින් සිදු කර ඇත්තේ, කලින් වසරේ අය කළ දුරකතන ගාස්තුවට තවත් රුපියලක් එකතු කිරීමය.

**වැටුප් රැවටිල්ල**

ආණ්ඩුව අයවැය කතාවේ කියන්නේ, රජයේ සේවකයාගේ මූලික වැටුපෙන් 10%ක් පඩි වැඩිකරන බවය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ අයවැය කතාවෙන්ම උපුටා දක්වන්නේ නම්, ''ගරු කතානායකතුමනි, මෙම අයවැයෙන්ද රජයේ සේවකයින්ට වැටුප් වැඩි කිරීමට අදහස් කරනවා. එබැවින් රජයේ හා ආරක්ෂක සේවාවන් සඳහා මූලික වැටුපෙන් 10% ක් වැටුප් වැඩි කිරීමක් මා යෝජනා කරනවා.'' යනුවෙනි. නමුත් සැබෑවටම මෙය වැටුප් වැඩි කිරීමක් නොව සොච්චම් දීමනාවකින් කරනු ලැබූ රැවටිල්ලකි. ආණ්ඩුව අයවැය මගින් නිෂ්පාදනයේ ප්‍රධාන බලවේගය වන වැඩකරන ජනතාව රවටා ඇත්තේ ඒ ආකාරයටය. රජයේ සේවකයාට දීමනාව වැටුප් වැඩිකිරීමක් සේ පෙන්වන අතරේම, පෞද්ගලික අංශයේ ලක්ෂ 70කට අධික වැඩකරන ජනතාවට වචනයක්වත් අයවැයේ නැත. පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීමක් කිරීමට ආණ්ඩුවකට නොහැකි වුවද අඩු තරමේ එසේ වැඩි කිරීමක ඇති අවශ්‍යතාවය අයවැය ලේඛනයක දැක්වීම පෞද්ගලික අංශයට ශක්තියකි. ආණ්ඩුව ඒ ක්ෂේත්‍රය අතහැර ඇත්තේ හිතාමතාය.

**විරැකියාවේ හැකියාව**

හැකියා ඇති අයට රැකියා දීම ධනපති පාලකයින්ගේ සරල සුලභ සංකල්පයකි. ආණ්ඩුවේ මහ බැංකු වාර්තා අර්ථ කථනය කරන්නේ, ''අවම වශයෙන් සතියකට පැයක්වත් ඵලදායී කටයුත්තක නියැලෙන්නා ශ්‍රමිකයෙකු රැකියා නියුක්තිකයෙකු'' ලෙසටය. එය ඉතාම ප්‍රායෝගික නොවන හා වැරදි විග්‍රහයක් බව බැලූ බැල්මටම තේරුම්ගත හැකිය. නමුත්, ආණ්ඩුවේ විග්‍රහයට අදාල කරගනිමින්ම සකස් කරන සංඛ්‍යා ලේඛන අනුවත් ලංකාවේ තරුණ විරැකියාව ලක්ෂ 15.8කි. ඒ රැකියා විරහිත තරුණ ජනගහනය ගැන ආණ්ඩුවේ අයවැය තුළ වචනයක්වත් සටහන්ව නැත. රැකියා විරහිත උපාධිධාරීන් 40,000කි. ඒ 40,000කගේ අනාගත ඉරණම ගැන ආණ්ඩුවේ වගකීම කුමක්දැයි වචනමාත්‍ර වශයෙන් හෝ අයවැය කතාවෙන්වත් ආණ්ඩුව සඳහන් කර නැත. ගොවි ජනතාව ගැනද එසේමය. පොහොර සහනාධාරයේ ප්‍රමාණය ආණ්ඩුව අයවැයෙන් අඩුකර ඇත්තේය.

**අයවැය අරමුණු හා ආණ්ඩුවේ ගමන**

2010 නොවැම්බරයේදී මහින්ද රාජපක්ෂ පාලනය ඉදිරිපත් කළ 6වන අයවැයේ ඉලක්කය වූයේද ආණ්ඩුව තෝරාගෙන ඇති නව ලිබරල්වාදයේ දෙවැනි ඉනිම ශක්තිමත් කිරීමය. ආණ්ඩුවේ වචනවලින්ම ආයෝජන පරිසරය'' ලෙස සැලකුවේ එම ගමනය. ජාතික ආර්ථික ගමනක් ගැන කියමින් ආණ්ඩුව කැසිනෝ පනතක් සම්මත කළේද ඒ සඳහාය. හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපළ, අධිවේගී මාර්ගය, මෙන්ම සංචාරක කර්මාන්තයද ආණ්ඩුව යොදා ගැනුයේ මේ නව ලිබරල් ධනවාදයේ ගමන ශක්තිමත් කිරීමේ වුවමනාවෙන්ය.

මෙවර අයවැයද ආණ්ඩුව ජනතාව අමතක කර, ජනතාවගේ සහන අවශ්‍යතාවය සිහින කර මාර්ගය සකස් කර ඇත්තේ පසුගිය වසරේදී විවෘත කළ ''ආයෝජන පරිසරය'' තව දුරටත් පුළුල් කිරීම සඳහාය. ආණ්ඩුවට අයවැයේදී රජයේ සේවකයා වැදගත් නොවන්නේ ඒ නිසාය. ලක්ෂ හැත්තෑවක පමණ පෞද්ගලික අංශය අමතක කළ හැක්කේද ඒ නිසාය. විරැකියාවෙන් පෙළෙන උපාධිධාරීන් ඇතුළු ලක්ෂ ගණනක් අමතක කරන්නේද ඒ නිසාය. කෙටියෙන්ම දක්වතොත්, නිෂ්පාදන ආර්ථිකය අමතක කළ, ආයෝජන ආර්ථිකයක් මතම විශ්වාසය තබන අයවැයක් මෙවරද ආණ්ඩුව ඉදිරිපත් කර ඇත්තේය.

ලංකාව තුළ විවෘත ආර්ථිකය පැවතියදී වුවද ශක්තිමත් සුබසාධන ආර්ථිකයක්ද පැවතියේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව ප්‍රමුඛ අධිරාජ්‍යවාදී ව්‍යූහයන් දිගින් දිගටම ආණ්ඩුවලට බලපෑම් කළේද මෙම ජනතාව අවම වශයෙන් හෝ භුක්ති විඳින ප්‍රතිලාභ කප්පාදු කිරීමටය. සෞඛ්‍ය, අධ්‍යාපනය, ප්‍රවාහනය වැනි සේවාවන් මෙසේ වසරින් වසර කප්පාදුවට ලක්වී ඇත. පසුගිය වසරේ අයවැය මගින් රජය පවත්වා ගෙන යන මාතෘ හා ළමා සායන රජයේ වගකීමෙන් අත් හැරිය යුතු බවත් පෞද්ගලික අංශයට සම්බන්ධ වීමට ඉඩ දිය යුතු බවත් පැවසිණි. මෙවර අයවැය මගින්ද ජනතාවට අවම සහනයක් හෝ දෙනවා වෙනුවට පෞද්ගලික රෝහල්වලට ගෙන්වන උපකරණ මෙන්ම එම රෝහල්වලින් අය කරන අදායම් බදු ගාස්තුද 12%ක් දක්වා අඩු කර ඇත්තේය.

පෞද්ගලික අංශයේ ඖෂධ නිෂ්පාදන දිරිගැන්වීම අරමුණු කරගෙනම ආයෝජන මණ්ඩලය මගින් වෙනම ආයෝජන කලාපයක්ද පිහිටුවීමට අයවැයේ යෝජනා කරන්නේ. රාජ්‍ය අංශයේ හා පළාත් සෞඛ්‍ය සේවාවන් මරණාසන්න තත්වයට ඇද වැටී තිබියදීය.

**හැඳි ගෑරුප්පු බදු නිදහස**

සාමාන්‍යයෙන් ආහාර මිල ඇතුළු පාරිභෝගික භාණ්ඩ මිල ඉහළ යන්නේ අයවැය මගින්ම නොවේය. මෙවරද අයවැයට පෙර සිටම ගෑස්, ඩීසල්, භූමිතෙල් හා පෙට්‍රල් මිලද ඉහළ ගියේය. වෙනදා අයවැයෙන් වැඩි වන මත්පැන් හා සිගරට් මිලද අයවැයට කලින්ම වැඩි විය. ඛනිජ තෙල් මිල ඉහළ යාමත් සමඟ එළවළු ඇතුළු ආහාර ද්‍රව්‍ය මිල ඉහළ ගියේ එකවරම දෙතුන් ගුණයකින්ය. දැනටමත් බස් ගාස්තු හා විදුලි ගාස්තු වැඩි වීමේ අවදානමක් ඇත. මේ සියලු ජීවන බරේ ඉහළ යාම හමුවේ ජනතාව අපෙක්ෂා කළේ වැඩිවන ජීවන බරට සහනයකි. රජයේ සේවකයාගේ වැටුප් ඉල්ලීම වූයේ වැඩිවන ජීවන අංකයට සරිලන ලෙස අවම වශයෙන් රු. 10,000කින්වත් පඩි වැඩි වීමක්ය. පඩි වැඩිකර ගත නොහැකි සාමාන්‍ය ජනයා බඩු මිල පහළ බහින තරමක බදු සහනයක් අපේක්ෂා කළේය. නමුත්, අන්තිමේදී ආණ්ඩුවේ සහනය ලැබුණේ ආණ්ඩු පත් කිරීමට දරදිය අදින ජනතාවට නොවේය. සංචාරක කර්මාන්තයේ ආයෝජකයින්ටය. ආණ්ඩුවේ විවෘත ආර්ථික උපායමාර්ගයට අවනතව, කීකරුව එය ක්‍රියාවට නගන

11 වැනි පිටුවට



අද විවෘත ආර්ථිකය නමින් මෙන්ම ජාතික ආර්ථිකය ලෙස වෙස්වලාගෙන පැමිණෙන්නේද ලෝකය අඛණ්ඩ අර්බුදවලට ගොදුරු කළ අධිරාජ්‍යවාදී ආර්ථික උපාය මාර්ගයමය. ඒ නිසා විවිධ නම්වලින් පැමිණෙන ජනතා විරෝධී ආර්ථිකයන් වෙනුවට විකල්ප විසඳුමක් අවශ්‍ය වී තිබේ.

**ලෝක ආර්ථික අර්බුදය පිළිබඳ වෙනස් කියවීමක්**

# රාජ්‍යය යනු කුමක්ද?

ප්‍රසුගිය කලාපයේදී අපි දේශපාලන විද්‍යාවේ විෂය පථය ගැන කතා කළෙමු. එහි අවසානයේදී මාක්ස්වාදී දේශපාලන විා්‍යාවේ මූලික අදහස පිළිබඳවද සාකච්ඡා කළෙමු.

මාක්ස්වාදයට අනුව,

**''දේශපාලනය යනු පංති අතර සබඳතාවයය. රාජ්‍ය කටයුතු සඳහා සහභාගීවීම, රජය මෙහෙයවීම, රාජ්‍ය ක්‍රියාවන්ගේ ස්වරූපයන්, කර්තව්‍යයන් සහ හරය ආදිය පිළිබඳ අර්ථ දක්වීමයි.''**

**-ලෙනින්/සම්පූර්ණ කෘති 33 වෙළුම - 340 පිටුව-**

එසේනම් අපට මෙහිදී රජය යනු කුමක්ද? යන ප්‍රශ්නය නිතැතින්ම පැන නගී. රජයක අංග ලක්ෂණ මොනවාද? එය බිහිවූයේ කෙසේද? එහි කාර්යභාරය කුමක්ද? එහි ඓතිහාසික ගමන්මග කුමක් වන්නේද? ආදී ප්‍රශ්න පැනනගී.

**''රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය තරම්, ධනපති විද්‍යාව, දර්ශනය, නීති විද්‍යාව, දේශපාලන අර්ථ ශාස්ත්‍රය හා පුවත්පත් කලාව විසින් සිතා මතාම සහ නොදැනුවත්වද ව්‍යාකූල කරන ලද වෙනත් ප්‍රශ්නයක් ඔබට සොයාගත නොහැකි වනු ඇත.''**

**-ලෙනින් 1919 ජූලි 11 ස්වර්ද්ලොව් විශ්වවිද්‍යාලයේදී-**


රාජ්‍යයන් තුළ අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු අංශ සැලකෙන්නේ භූමිය, ජනගහනය, ආණ්ඩුව හා ස්වාධිපත්‍යයයි.


ඕනෑම රාජ්‍යයක් නිශ්චිත දේශසීමාවක් තුළ පිහිටා ඇත. එමගින් රාජ්‍යයේ භෞතික පදනම නිරූපනය කරන අතර වර්තමානයේදී එයට හුදු භූමිය පමණක් නොව එකී භූමිය වටා ඇති මුහුදු තීරයද භූමිය වටා ඇති අවකාශයද ඇතුළත් වේ.


රාජ්‍යය යනු සියලු මානව සංවිධාන අතුරින් ඉහළම මානව සංවිධානය ලෙස ධනේශ්වර දේශපාලන විා්‍යාවේදී හඳුන්වාදී ඇත, එනම් ඕනෑම රාජ්‍යයකට ජනගහනයක් තිබිය යුතුවේ.

රාජ්‍යයේ කැමැත්ත ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීම උදෙසා ආණ්ඩුවක් පවතී. ආණ්ඩුව යනු රජය ඇතිවීමෙන් පසු ඇතිවූ ආයතනයකි. එනිසා ආණ්ඩුවක් නොමැතිව වුවද රාජ්‍යයක් තිබිය හැකිය. එසේම ආණ්ඩුවේ ස්වභාවය තීරණය කරනුයේ රජයේ දේශපාලන දෘෂ්ටිය විසිනි.

රජයේ සීමාව තුළ වාසය කරන පුද්ගලයින්, සියලු සංවිධානවලට නීතිරීති පැනවීමේ, ඒවා ක්‍රියාත්මක කිරීමේ, ඒ සඳහා බලය යෙදීමේ සහ විදේශීය රාජ්‍යයන්ගේ බලපෑමෙන් නිදහස්ව කටයුතු කිරීමට ඇති අයිතිය ස්වාධිපත්‍යය වේ. ධනේශ්වර දේශපාලන චින්තනයට අනුව රාජ්‍යයකට තිබිය යුතු අනෙක් අත්‍යවශ්‍ය කොන්දේසිය වන්නේ, ස්වාධිපත්‍යයයි. අනෙක් සමාජ සංවිධානවලට වඩා







ඉහළින් රාජ්‍යය පිහිටන්නේත්, අනෙකුත් රාජ්‍යයන්ගෙන් එය වෙනස් කොට හඳුනා ගත හැක්කේත් ස්වාධිපත්‍යය නිසාය. එබැවින් රාජ්‍යයේ ජීවනාලිය ස්වාධිපත්‍යය ලෙස හැඳින්වේ. සැබැවින්ම එය කිසියම් පංතියක බලහත්කාරය විනා අන් යමක් නොවේ.


### රජයේ උපත


මීළඟට අප හමුවේ පැන නැගෙන ප්‍රශ්නය වන්නේ රජය සැමදා පැවතියේද යන්නයි. මිනිසාගේ බිහිවීමත් සමග එය ඇතිවීද? එසේත් නැතිනම් ඊට පසු කලෙක ඇතිවීද?

රාජ්‍යයේ උපත පිළිබඳ දාර්ශනික, ආගමික, ආදී විවිධ මතවාද පවතී, මෙම එක් එක් මතවාදයන් පැන නැංගේ විවිධ සමාජ ඓතිහාසික වටපිටාවන් තුළය. රජයේ උපත පිළිබඳ පවතින එකී මතවාදයන් පිටුපස විවිධ පංති අරමුණු පවතී.

කෙසේ වෙතත් රජයේ උපත පිළිබඳ වන එකී මතවාදයන් කිහිපයක් තේරුම් ගැනීම වැදගත්ය.

දේශපාලනය පිළිබඳ මුල්ම අදහස් දක්වීම ආරම්භ වන්නේ, ග්‍රීක යුගයේදීය. ග්‍රීක මහා දාර්ශනික සොක්‍රටීස් එහිදී මූලික වෙයි. රටක පවත්නා





පාලනය පිළිබඳ කතා කරමින් සොක්‍රටීස් වරෙක ප්‍රශ්න කළේ ආණ්ඩුව විහිළුවක් බවට පත්වී ඒ තුළම අර්බුද ඇති වී තිබෙනම් නායකත්වයකින් තොරව රට පාලනය වන්නේ නම් එබඳු වූ ආණ්ඩුවක නීතිවලට ගරු කරන ලෙසටත් රටේ පොදු යහපත තුළ තමන්ගේ පුද්ගලික අභිවෘද්ධිය සලසා ගන්නා ලෙසටත් ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ කෙසේද? යන්නයි.

පාලනය පිළිබඳ ප්‍රශ්න කිරීමෙන් ඇරඹි මෙම සංවාදය සොක්‍රටීස්ගේ ශිෂ්‍ය ප්ලේටෝ තවත් ඉදිරියට ගෙනයමින් තමන්ගේ රිපබ්ලික් (Republic) ග්‍රන්ථය තුළ පරමාදර්ශී රාජ්‍යය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කරයි.

දේශපාලන විද්‍යාවේ පියා ලෙස සලකනු ලබන, ප්ලේටෝගේ ශිෂ්‍ය ඇරිස්ටෝටල් රාජ්‍යයේ සම්භවය පිළිබඳ ප්‍රථම මත දැක්ම ඉදිරිපත් කළ පුද්ගලයා වේ. තම ගුරුවරයාගේ පරමාදර්ශී පාලන තන්ත්‍රය විවේචනය කරන ඔහු පවසන්නේ, අප විසින් සොයා බැලිය යුත්තේ හුදෙක් හොඳම පාලන තන්ත්‍රය කුමක්ද යන්න පිළිබඳ පමණක් නොව පවත්නා තත්වයන් යටතේ බිහිකර ගත හැකි පහසුම මෙන්ම ප්‍රායෝගික වූද පාලන තන්ත්‍රය කුමක්ද යන්න බවයි. සමාජයීය සත්වයෙකු වශයෙන් උපත ලැබූ මිනිසා මෙලොව පහළ වූ දා පටන්ම රාජ්‍ය නැමැති සංවිධානය තුළ ජීවත් වීමට පුරුදු වූ බව ඔහුගේ මතයයි.

ග්‍රීක යුගයෙන් පසු රෝම යුගයේදී රජය පිළිබඳ මත පළ කරන සිසේරෝ රාජ්‍යය වනාහී පොදු භුක්තියක් බව පවසයි. එසේම එහි බලය රැඳී තිබෙන්නේ, ජනතාවගේ පරමාධිපත්‍යය තුළ බවද ඔහු පවසයි.

> **"අනෙක් සමාජ සංවිධානවලට වඩා ඉහළින් රාජ්‍යය පිහිටන්නේත්, අනෙකුත් රාජ්‍යයන්ගෙන් එය වෙනස් කොට හඳුනා ගත හැක්කේත් ස්වාධිපත්‍යය නිසාය. එබැවින් රාජ්‍යයේ ජීවනාලිය ස්වාධිපත්‍යය ලෙස හැඳින්වේ. සැබැවින්ම එය කිසියම් පංතියක බලහත්කාරය විනා අන් යමක් නොවේ."**

සිසේරෝගේ මෙම අදහස් එක් අතකින් රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ විවිධ මත ඉදිරිපත් වීමට මග පෑදූ අතර විශේෂයෙන් මධ්‍යගත යුරෝපයේ ආධිපත්‍යය දැරූ ක්‍රිස්තියානි සමාජ දේශපාලන මත වර්ධනයට තදින්ම බලපාන ලදී.

### ක්‍රිස්තියානි ආගමෙන් කරනු ලැබූ බලපෑම

ක්‍රිස්තුන් වහන්සේගේ උගැන්වීම්වලින් ලෝකයේදී මිනිසා විසින් අනුගමනය කළ යුතු දිව්‍යමය නීති මාලාවක් ප්‍රකාශයට පත් කර සිටී. එසේම මිනිසාගේ එකම යටහත්භාවය ඔවුන්ගේ මැවුම්කරුවා වූ දෙවියන් වහන්සේ වෙත පමණක් හිමිවිය යුතු බවත් මිනිසා තම විමුක්ති උදෙසා උන්වහන්සේ පමණක් ඇදහිය යුතු බවත් ප්‍රකාශ කර තිබේ.

ක්‍රිස්තුන් වහන්සේගේ මෙම ඉගැන්වීම් රෝම ආධිරාජ්‍යයේ බල අධිකාරයට මෙන්ම රාජ්‍ය කෙරෙහි ජනතාව මෙතෙක් දක්වූ යටහත්භාවයට හා පක්ෂපාතීත්වයට ද ප්‍රබල තර්ජනයක් විය. ඉන් කලබල වූ රෝම පාලකයෝ ක්‍රිස්තුන් වහන්සේත් ඔහු සරණ ගිය සියලු දෙනාත් මරා දැමූහ. ක්‍රිස්තුන් වහන්සේ පිහිට වූ ආගමික සභාවත්, පූජකවරුනුත් විනාශ කිරීමට සෑම උත්සාහයක්ම ගත්හ. එනමුදු මෙම මර්දන ක්‍රියා මගින් ක්‍රිස්තියානි ආගමේ ව්‍යාප්තිය වළකාලීමට නොහැකි විය.

කෙසේ වෙතත් ක්‍රිස්තුන් වහන්සේගේ මරණයෙන් අවුරුදු 400ක් ගතවීමට ප්‍රථම රෝමයේ රාජ්‍ය ආගම බවට ක්‍රිස්තියානි ධර්මය පත්වී කොන්ස්තන්තීනු අධිරාජ්‍යයා ප්‍රථම ක්‍රිස්තුභක්තික රෝම අධිරාජ්‍යයා බවට පත්විය.

ක්‍රි:ව 400 සිට 1400 දක්වා පැතිරුණ මධ්‍යතන යුගයේ (අඳුරු යුගයේ) පහළ වූ ක්‍රිස්තියානි චින්තකයින් අතුරින් ශ්‍රේෂ්ඨතම චින්තකයින් දෙදෙනා ලෙස සලකනුයේ ශාන්ත ඔගස්ටියන් සහ ශාන්ත තෝමස් ඇක්වයිනාස්ය. ශාන්ත ඔගස්ටියන්ගේ අදහස වන්නේ, සාධාරණත්වයත් යුක්තියත් නැති තැන රාජ්‍යයක්ද නැති බවයි. ඔගස්ටින් සාධාරණත්වය කුමක්දැයි විස්තර කර ඇත්තේ, ප්ලේටෝගේ යුක්තිය යන සංකල්පය ඔස්සේය.

රාජ්‍යය පිළිබඳ අදහස් දක්වන ඇක්වයිනාස් රාජ්‍ය වැනි පාලක සංවිධානයක් බිහි වූයේ, මිනිසාගේ ජන්ම පාපයේ ප්‍රතිඵලයක් ලෙස බව පෙන්වා දෙයි.

ක්‍රිස්තියානි දාර්ශනිකයන්ට අනුව මිනිසා රාජ්‍යයන් දෙකක අධිකාරියට යටත් වී ඇත. එනම් ලෞකික රාජ්‍යය හා දේව රාජ්‍යය යන දෙකටය. ක්‍රිස්තියානි දාර්ශනිකයින් විසින් මතු කරනු ලැබූ මෙකී සංවාදය රාජ්‍යයේ උපත පිළිබඳ ඉදිරිපත් වූ පසුකාලීන මතවාදවලටද බලපෑම් කළේය.

### ඩාන්ටේ

ඉතාලියේ ප්ලෝරන්ස් නුවර, 1265 දී උපත ලැබූ ඩාන්ටේ ඇලිගියර් මධ්‍යතන ක්‍රිස්තියානි දේශපාලන චින්තනය හා නූතන චින්තනය හා නූතන චින්තනය සම්බන්ධ කළ පුරුක ලෙස සැලකීමට පුලුවන. ඩාන්ටේගේ ශ්‍රේෂ්ඨතම කෘතිය වන්නේ, ඩී මොනාකියා (De Monarchia) හෙවත් රාජාණ්ඩු ක්‍රමය පිළිබඳ ලියවුණු ග්‍රන්ථයයි.

එක් රජෙකු යටතේ පාලනය වන විශ්වාසනීය රාජ්‍යය ඩාන්ටේගේ සංකල්පය විය. ඉහත ලෞකික හා අධ්‍යාත්මික පාලකයින් දෙදෙනා අතරින් පාප් වහන්සේ ප්‍රමුඛයාය යන අදහස ඩාන්ටේ පිළිගත්තේ නැත. රෝම අධිරාජ්‍යයකු මෙලොව පහළ වූයේ, පල්ලිය පහළ වීමට පෙර නිසා අධිරාජ්‍යයේ බලය පල්ලියෙන් ලැබුණත් පසුව කෙලින්ම දෙවියන්ගෙන් ලැබුනක් බව ඩාන්ටේගේ මතයයි.

පල්ලිය දේව වරම්වාදයෙන් මුදවා ගැනීම ඩාන්ටේ සිදුකළ වැදගත් මෙහෙයකි. රාජ්‍යයේ සම්භවය පිළිබඳ දේවවරම්වාදයට මෙලෙස ඩාන්ටේ ගේ ඉගැන්වීම් මග පෑදුවේය.

ඩාන්ටේ පිළිබඳ අගය කරමින් එංගල්ස් මෙසේ පැවසීය.

**''ප්‍රථම ධනවාදී ජාතිය ඉතාලිය විය. රදළවාදී මධ්‍යම යුගයේ අවසානයත්, සමකාලීන ධනපති යුගයේ ආරම්භයත් එක් මහා පුද්ගලයෙකුගෙන් සටහන් වී ඇත. හේ ඉතාලි ජාතික දාන්තේය. මධ්‍යකාලීන යුගයේ අවසන් කිවියාත්, නව යුගයේ ප්‍රථම කවියාත් ඔහුය. දැන් 1300 දී මෙන් නව ඓතිහාසික යුගයක් එළඹෙමින් පවතී. එම නව නිර්ධන පංති යුගයේ උපත සනිටුහන් කරන නව දාන්තේ කෙනෙකු ඉතාලිය අපට ප්‍රදානය කරන්නේද? ''**

**එංගල්ස් - කොමියුනිස්ට් ප්‍රකාශනය-**

1893 ඉතාලි සංස්කරණයට ලියන ලද සංඥාපනය

මීළඟ කලාපයෙන් අපි රජයේ බිහිවීම පිළිබඳ පෙරදිග මත කිහිපයක් පිළිබඳ සලකා බලමු.

# ආපදා කළමණාකරණය
## මහ පොළොවට යට කිරීම

පසුගිය දිනවල ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් විවිධාකාරයේ විග්‍රහයන් මෙන්ම පැහැදිලි කිරීම්ද අසන්නට දකින්නට ලැබිණි. විශේෂයෙන් 2004 සුනාමි ආපදාවත් සමග ලංකාව තුළ ආපදා සම්බන්ධයෙන් තිබූ කතා බහ වඩාත් පුළුල් තලයකට ගෙන එන්නට සමත් විය. ආපදාවන් සම්බන්ධයෙන් ඇති වූ එම කතාබහ අවසානයේ දේශපාලන ව්‍යාපෘති මගින් ජනතාව තුළ තම ස්ථාවරය තහවුරු කර ගැනීම සඳහා යොදා ගන්නට ආණ්ඩුව කටයුතු කරන ලදී. ඒ නිසා ආපදා කළමනාකරණ සම්බන්ධයෙන් ඇමතිවරයෙක් මෙන්ම අමාත්‍යාංශයක් ද ස්ථාපිත වූ අතර එවැනි කටයුතු නිරීක්ෂණය සඳහා වෙනම මධ්‍යස්ථානයක්ද ඇති කරන ලදී. ඒ අනුව ආණ්ඩුවේ ප්‍රකාශනය වූයේ මින් මතු ආපදාවක් සිදුවන්නේ නම් එය පූර්ව දැනුවත් කිරීමකට භාජනය කළ හැකි බවත් එමගින් සිදුවිය හැකි විනාශයන් අවම කර ගත හැකි බවත්ය. ආණ්ඩුවට එසේ පැවසීමට සිදුවූයේ සුනාමි අවස්ථාවේ දී එම ව්‍යවසනය පූර්වයේ දැන ගැනීමට ජනතාවට හැකි වූයේ නම් සිදුවූ විනාශය අවම කර ගත හැකිව තිබූ බව පොදු ජනතාවගේ මතය බවට පත්වූ බැවිණි. එහෙත් එතැන් පටන් සිදුවූ ස්වභාවික ආපදාවන් කිසිවක් සම්බන්ධයෙන් ආණ්ඩුවට පූර්වයේදී ජනතාව දැනුවත් කළ නොහැකි විය. එහි ආසන්නතම සිදුවීම වූයේ පසුගිය දිනවල දකුණු පළාත මූලික කර ගනිමින් හමා ගිය දැඩි සුළං කුණාටුවයි. අවසානයේ මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් බිලිගනිමින් දේපළ විශාල ප්‍රමාණයක් විනාශ කරමින් හමා ගිය සුළි කුණාටුව පිළිබඳ ජනතාවගේ දැඩි විරෝධයක් ආණ්ඩුවට එල්ල විය. එහි ප්‍රධානම විරෝධය ප්‍රකාශයට පත්වූයේ ඒ සම්බන්ධයෙන් පූර්වයේ දැනුවත් කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට නොහැකි වූ බවයි. ඒ හරහා එහි ඇමතිවරයාද සෙසු නිලධාරීන් ද ජනතාවගේ දැඩි දෝෂ දර්ශනයට ලක්විය. නමුත් අනෙක් සෑම කරුණක දී මෙන්ම මෙහිදී ද ඇමතිවරයා නිදොස් වී නිදහස් විය. සියළු චෝදනාවන්හි වැරදිකරුවන් බවට පත්වූයේ නිලධාරීන් පමණි. පවතින දේශපාලන බලාධිකාරිය කවදත් මෙවැනි ප්‍රශ්නවලදී තමන් බේරීම සඳහා නිලධාරීන් බිල්ලට දීම සාමාන්‍යයෙන් සිදුවන්නකි. එහෙත් කවුරු බිල්ලට දී කවුරු බේරුණත් ජනතාවට සිදුවූ ඛේදවාචකයට වගකියන්නට කිසිවෙකුටත් නොහැකි විය.

### ස්වාභාවික ආපදාවක් යනු

ස්වභාවික ආපදාවක් යනුවෙන් අර්ථ දක්වා ඇත්තේ මිනිස් ජීවිත වලට රටේ ආර්ථිකයට හා පරිසරයට ස්වභාවික ක්‍රියාවලියකින් යම් හානියක් සිදුවීම ස්වභාවික ආපදාවක් යන්නයි. ඒ අනුව ආපදාවක් සිදුකරන ස්වභාවික ක්‍රියාවලීන් ලෙස සුළිසුළං වාසුළි, නායයෑම්, නියඟ, ගිණිකඳු, භූමිකම්පා, සුනාමි, උෂ්ණත්ව ධාරාවන්, ලැව් ගිණි ආදිය හඳුනාගත හැකිය. මෙම ස්වභාවික විපත්වලින් බොහෝ විපත් සඳහා මිනිසාට කිසිදු බලපෑමක් ස්වභාවයෙන් සිදුකළ නොහැක. එහෙත් ඇතැම් ස්වභාවික විපත් සඳහා මිනිසාගේ ක්‍රියාකාරකම්වලින් යම් උද්දීපනයක් සිදුකරන බව ඉතා පැහැදිලිය. ධනේශ්වර ආර්ථික රටාව ආරම්භයේ සිට එහි පැවැත්ම උදෙසා සිදුකරන විවිධ අත්තනෝමතික ක්‍රියාවන් නිසා මෙම තත්වය වඩ වඩාත් තිව්‍ර වන බව පැහැදිලිය. අප රට තුළද බටහිර අධිරාජ්‍යවාදීන් විසින් මධ්‍යම කඳුකරයේ වනාන්තර එළි පෙහෙළි කොට ඇතිකරන ලද වතු වගාවන් හේතුවෙන් වර්තමානයේ නායයෑම් සිදුවන බවත් ඇතැම් ප්‍රදේශවලට ජලය නොමැතිකම මෙම සැලසුම්වල අසාර්ථකත්වය විසින් ඇතිකරක ලද තත්වයක් බවත් භූ විද්‍යාඥයින්ගේ මතයයි. වනාන්තර එළි පෙහෙළි කොට ඇතිකරන ලද වතු වගාවන් මගින් රටට ලැබුණු ආර්ථික වාසියත් මෙවැනි විපත් තුළින් අහිමි වන බව සැලසුම්ගත ආර්ථික ක්‍රියාවලියකට අවධානය යොමු නොකරන ධනේශ්වර පාලකයන් තේරුම් නොගන්නා සත්‍යයකි.

### ආපදා හඳුනාගැනීම

ඕනෑම ආකාරයක ස්වභාවික විපත් අධ්‍යනය සඳහාත් ජනතාවට එවැනි විපත් පිළිබඳව දැනුවත් කිරීම සඳහාත් සඳහා පිහිටුවා ඇති ආපදා කළමණාකරන මධ්‍යස්ථාන අතර සහ සම්බන්ධතාවය පවත්වා ගනිමින් එහි ප්‍රධාන භූමිකාව ඉටු නරනු ලබන්නේ කාලගුණ විද්‍යා අධ්‍යයන ආයතනයයි. අපේ රටේ එහි වගකීම ඇත්තේ කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවටය. මේ ආකාරයේ ආයතන ලෝකයේ සෑම රටකම පාහේ පිහිටුවා ඇත. ඔවුන්ගේ කාර්යභාරය වන්නේ එවැනි ස්වභාවික විපත් ගැන අධ්‍යයන කොට ඒවා සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමයි. අපේ රටේ 2004 සුනාමි ව්‍යවසනයත් සමග ආපදා කළමනාකරණ පනතක්ද සම්මත කරන ලදී. අංක 13/2005 යටතේ සම්මත කර ඇති එම පනත 2006 පෙබරවාරි 20 වන දින ගැසට් නිවේදනයක් මගින් ද තහවුරු කර තිබේ. එහෙත් ඒ කිසිවකකින් මෙතෙක් රටේ ජනතාවට සිදුවූ සහනයක් නැත. එහෙත් සැබෑවටම සිදුවී ඇත්තේ මෙම මධ්‍යස්ථානය මගින් සිදුවන ස්වභාවික විපත් පිළිබඳ අධ්‍යනය කොට ජනතාව දැනුවත් කරනවා වෙනුවට මෙම මධ්‍යස්ථානය හරහා බොහෝ පිරිස් විදෙස් සංචාර ලබාගැනීමයි. එමගින් තහවුරු වන්නේ මෙවැනි විපත් සම්බන්ධයෙන් ජනතාවගේ මානයෙන් අවධානය යොමුකරනවා වෙනුවට තමන්ගේ බඩගොස්තරයේ පරිමාවෙන් එයට මැදිහත්වීමයි. එය කිසිසේත්ම එකී පුද්ගලයන්ගේ අඩුපාඩුවක් නොව ඔහුන් එවැනි තත්වයට පත්කරන ලද මෙම ක්‍රමය එහිදී වගඋත්තරකරුවා වනු ඇත.

ආපදා කළමනාකරණ ආයතනයක ප්‍රධාන කාර්යභාරය වන්නේ ආපදාවන් කලින් හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කොට එයට මුහුණ දීම සඳහා සූදානම් වීමයි. එමගින් සිදුවන අනතුර අවම කර ගත හැකිවනු ඇත. දියුණු යැයි සලකණු ලබන ධනේෂවර රජයන්වල මෙය යම් තරමක් ක්‍රියාත්මක වුවද සම්පූර්ණයෙන් එහි ප්‍රතිලාභය ලබාගැනීම සඳහා ඔවුන්ට සැලැස්මක් නැත. පසුගියදා ඇමරිකාව හරහා හමා ගිය කැත්‍රිනා සුළි කුණාටුව ඊට ඇති හොඳම උදාහරණයයි. එමගින් ඇමරිකාවේ ෆ්ලෝරිඩා ප්‍රාන්තයේ ජනතාව විශාල ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත්වූ අතර දේපළ වලට සිදුවූ හානිය ඉතා විශාලය. එමගින් තහවුරු වන්නේ දියුණු ධනේෂවර රාජ්‍යකට පවා ඒ සම්බන්ධයෙන් වන විධිමත් සැලැස්මක් නොතිබෙන්නේ නම් එහි ප්‍රතිලාභ ලබාගත නොහැකිය යන්නයි.

### ආපදාවන් අලෙවි කිරීම.

ධනේශ්වර ආණ්ඩුවලට මෙවැනි විපත් සම්බන්ධයෙන් සැලැස්මක් නොමැතිවීම හුදු එම කාර්යට අදාල කරුණක් පමණක් නොවේ. ඔවුන් සෑම විටම උත්සාහ දරන්නේ ජනතාවගේ පැත්තෙන් සිට ජීවිතවල වටිනාකමට ඉඩක් වෙන්කිරීමට නොව තමන්ගේ ලාභ පංගුව වඩා වැඩිකර ගැනීම සඳහා උත්සාහ කිරීමටයි. ඒ අනුව අපේ රටේ සිදු වූ ස්වභාවික විපත් සම්බන්ධයෙන් අවධානය යොමුකරන විට ද පෙනීයන එක් පැහැදිලි කරුණක් වන්නේ ජනතාවට සිදුවන ආපදාවන් පිළිබඳව මෙම පාලකයන් තුළ කිසිදු අනුකම්පාවක් ජනිත නොවීමයි. ඔවුන්ගේ උත්සාහය වන්නේ සිදුවන ආපදාව තුළින් තමන්ගේ දේශපාලන බලය තහවුරු කරගන්නේ කෙසේද යන්නයි. වර්තමාන රාජපක්ෂ ආණ්ඩුව සෑම දෙයකදීම මෙන්ම ස්වභාවික විපත්වලදීද ජනතාවට සිහින පෙන්වා බලාපොරොත්තු දල්වා ඔවුන්ගේ වේදනාවේ අපේක්ෂාවන් තම දේශපාන උවමනාවන් වෙනුවෙන් මහ දවාලේ මංකොල්ල කනු ඇත. එය පසුගිය සුළි සුළං අවස්ථාවේදීද දක්නට හැකිවිය. මිනිසුන් දැඩි ආපදාවකට ලක්වී පීඩාවට පත්වී සිටින මොහොතකදී ජනාධිපතිවරයාගේ කාර්යය වූයේ එම ජනතාවට සහන



සැලසීම සඳහා මැදිහත්වීම නොව අධිවේගී මාර්ගය විවෘත කිරීමේ උත්සවයට සහභාගීවීමයි. තමන් කාලාන්තරයක් තිස්සේ ඒකරාශී කරන ලද සියළු දේපළ විනාශයට ලක්වෙද්දී ඒ දෙස දැඩි වේදනාවෙන් යුතුව බලාසිටි ජනතාවත් තම ඥාතීන් අහිමිවීමෙන් අතිශය වේදනාවට පත් ජනතාවත් අමතක කොට ජනාධිපතිවරයාගේ ප්‍රමුඛ කාර්යය වූයේ අධිවේගී මාර්ගය විවෘත කිරීම වුවත් එහිදී එම ජනතාව සම්බන්ධයෙන් වචනයක් හෝ ප්‍රකාශ කරන්නට කටයුතු නොකිරීම තුළින්ද තහවුරු වන්නේ මෙවැනි පාලකයන් සෑම කෙනෙකු තුළම දෘශ්‍යමාන වන නරුම යථාර්ථයයි.

මේ සියළු තත්වයන් තුළින් තහවුරු වන්නේ ධනේෂ්වර රාජ්‍යන්වලට ආපදාවන්ට මුහුණ දීම සඳහා සැලසුම් සහගත ක්‍රියාවලියක් නොමැති බවයි. විශේෂයෙන් අප වැනි සංස්කෘතික වශයෙන් ඉතාමත් නොදියුණු ඒ නිසාම ධනේෂවර ක්‍රමයේ බොහෝ ක්‍රියාකාරකම් ස්ථාපිත නොවී පවතින ආර්ථික දියුණුව තවමත් සිදු නොවී පවතින රාජ්‍යන්වල ස්වභාවික ආපදාවන්වලින් සිදුවන හානිය වළක්වාගැනීම සඳහා පාලකයන්ට කිසිදු දැක්මක් හෝ සැලැස්මක් නොමැති බව ඉතා පැහැදිලිය. එයින් ගම්‍ය වන්නේ ඔවුන්ගේ නොහැකියාවේ ප්‍රකාශනයයි. එය හුදු මහින්ද රාජපක්ෂගේ වර්තමාන ආණ්ඩුවේ නොහැකියාවක් නොව ඔවුන් නිපදවා තිබෙන මෙකී ආර්ථික ක්‍රමයේ නොහැකියාවයි. එය තේරුම් ගන්නට ජනතාව සමත්කම් දක්වන කාලයේ වේගය අනුව එවැනි ආපදාවන්වලට මුහුණ දීමේ මෙන්ම එයින් බේරීමේ හැකියාවේ කාලය තීරණය වනු ඇත.

''අති උදාරත්වයේ සිට තකතීරුකම දක්වා ඇත්තේ එක් පියවරක දුර පමණි.''

- රුසියානු කියමනක්. -



# මාක්ස්වාදය ජීව වායුව කරගත් කෲප්ස්කයාගෙන් ඉගෙන ගනිමු

අප ජීවත් වන සමාජය තුළ අයහපත් දෙය වළක්වාගැනීමටත් යහපත් දේ වර්ධනය කර ගැනීමටත් මිනිසුන් වන අපට අවශ්‍යය. එහෙත් එම අවශ්‍යතාවය බොහෝ මිනිසුන්ගේ සිත් සතන් තුළ තිබූ පමණින් සාක්ෂාත් කර ගැනීමට නොහැකි අතර එය කළ හැකි වන්නේ සක්‍රිය ලෙස මැදිහත්වීමක් තුළ පමණි. එය වටහාගෙන නව සමාජයක් ඇති කිරීම වෙනුවෙන් තම ජීවිත කාලයම කැප කළ පුද්ගලයන් ඉතිහාසය දෙස බැලීමේදී අපට හමුවේ. 1917 ප්‍රථම වරට රුසියාවේ සිදුවූ ඔක්තෝබර් විප්ලවයේදී සමාජවාදී සමාජය යථාර්ථයක් කිරීම උදෙසා විශාල කාර්යභාරයක් ඉටුකළ එවැනි විප්ලවවාදීන් අතර නදේස්ද්‍රා කොන්ස්තන්තිනව්නා කෲප්ස්කයාට හිමිවන්නේ, සුවිශේෂී ස්ථානයකි.

ඔක්තෝබර් විප්ලවයේ නියමුවා වූ විප්ලවීය නායක ලෙනින්ගේ දේශපාලන ව්‍යාපාරයේ ක්‍රියාශීලී සටන් සගයෙක් සේම ඔහුගේ ජීවන මගේ සහකාරියද වන වූ කෲප්ස්කයා 1939 පෙබරවාරි 27 දින මිය යන තෙක්ම සමාජවාදය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කළ තැනැත්තියක් ලෙස ඉතිහාසය තුළ නමක් තැබීමට සමත් වී ඇත.

**කෲප්ස්කයාගේ ළමාවිය**

නව යොවුන් වියේදීම විප්ලවවාදී දේශපාලනයට දැඩිව බැඳීමට ඈ ජීවත් වූ සමාජ වටපිටාව විශාල බලපෑමක් විය. 1869 පෙබරවාරි 26 දින රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් නගරයේ උපත ලැබූ කෲප්ස්කයාට, සාර් රජුගේ පාබල හමුදාවේ සෙබළෙක් වූ ඇගේ පියාත් වංශවත් පවුල්වල දරුවන්ට උගන්වන ගුරුවරියක් වූ ඇගේ මවත් ඒකාධිපති සාර් රජුගේ ක්‍රියාකලාපය දැඩිව විවේචනය කිරීම නිසා සහ සාර් පාලනයෙන් කම්කරු ජනතාව පීඩාවට පත්වන අයුරු කුඩාකළ සිටම දකින්නට ලැබුණු නිසා කම්කරුවන්ගේ ජීවිත පිළිබඳව ඔවුන්ගේ ප්‍රශ්න පිළිබඳවත් යම් අවබෝධයක් ලබා ගැනීමට හැකිවිය. ඒ සම්බන්ධයෙන් කෲප්ස්කයා පසුකලෙක මෙසේ සඳහන් කර තිබුණි. ''මගේ පවුල ඇතුලේ විප්ලවවාදී අදහස් කතාබහට ලක්වුණා. නිතරම මගේ කණට ඇසුණේ ඒ කතාබහ තුළ තිබූ අදහස්. ඇත්ත වශයෙන්ම මගේ අදහස් ඒ විප්ලවවාදී අදහස්වලින් පිරුණා.

**මගේ පාසලේ මගේ පස්වසර**

එකල පසුගාමී රුසියාවේ පැවැති නීතිරීතිවලට අනුව තෘතීය අධ්‍යාපනය ලැබීමට කාන්තාවන්ට ඉඩක් විවෘතව නොතිබූ හෙයින් තම අධ්‍යාපනය ද්විතීයික පාසලෙන් හමාර කිරීමට කෲප්ස්කයාට සිදුවිය. ඉගෙන ගැනීමට දස්කම් පෑ ඇය ද්විතීයික පාසලෙන් පිටවූයේ දක්ෂතම ශිෂ්‍යයාට හිමි පදක්කමද දිනාගනිමිනි. ද්විතීයික අධ්‍යාපනය හමාර කිරීමෙන් පසු ශාන්ත පීටර්ස්බර්ග් නගරයේ කර්මාන්ත හිමිකරුවෙක් විසින් ඔහුගේ කර්මාන්ත ශාලාවල



සේවය කරන කම්කරුවන්ට ලිවීම කියවීම සහ ඉගැන්වීම සඳහා සන්ධ්‍යාකාලයේ පවත්වාගෙන ගිය පාසලක ගුරුවරියක් ලෙස කෲප්ස්කයා සේවයට බැඳුණි. වයස අවුරුදු 17 දී (1886) එසේ සේවයට බැඳුණු ඇය එම පාසලේ වසර 05ක් සේවය කළ අතර 20 වන වියේදී ඇයට එම පාසල තුළ රහසිගතව සංවිධානය කරන ලද මාක්ස්වාදී අධ්‍යන කවයකට සහභාගී වීමේ අවස්ථාව උදා විය. එම අධ්‍යයන කවයට සහභාගී වීමෙන් පසුව මිනිසුන් සඳහා වඩාත් හොඳ ජීවිතයක් ගොඩ නැගිය හැකි එකම මග මාක්ස්වාදය බව ඇයට අවබෝධ වූ ඇයට මාක්ස්වාදය සම්බන්ධව වැඩිදුරටත් ගැඹුරින් හැදෑරීමේ ආශාවක් සිත තුළ ජනිත විය. එහෙත් එම කටයුත්ත වඩාත් පහසු කාර්යයක් නොවූයේ සාර් පාලනය විසින් මාක්ස්වාදී පොත් පත් තහනම් කර තිබූ බැවිනි. කෙසේ වෙතත් උත්සාහය අත් නොහළ ඇය රහසිගතව හුවමාරු කරගත් මාක්ස්, එංගල්ස් විසින් ලියන ලද පොත් පත් කියවමින්ද රහසිගතව පවත්වාගෙන ගිය මාක්ස්වාදී අධ්‍යයන කව සඳහා සහභාගිවෙමින්ද මාක්ස්වාදය සම්බන්ධ තම දැනුම වැඩිදියුණු කර ගැනීමට කටයුතු කළේය.

කම්කරු පංතිය සමාජවාදය වෙනුවෙන් පෙළගැස්විය හැක්කේ වැඩවර්ජන හා දේශපාලන සංවිධාන කටයුතුවලින් බවත් වැඩකරන ජනතාවට කරුණු අවබෝධකර දීම හා උපදෙස් දීම තම මූලික කර්තව්‍යයක් බව වටහාගත් ඇය, විප්ලවවාදීන් සමග එක්වී කම්කරු අයිතීන් සහ සාධාරණ වැටුපක් වෙනුවෙන් වැඩවර්ජන මඟින් කම්කරුවන් පෙළ ගැස්වීමෙත් පත්‍රිකා මුද්‍රණය කර බෙදාහරිමින් කම්කරුවන් තම අයිතීන් පිළිබඳ දැනුවත් කිරීමේත් කාර්යභාරයට උර දුන්නාය. මාක්ස්වාදී බලපෑම ඇගේ ජීවිතය වෙනස් කළ ආකාරය 'මගේ පාසලේ මගේ පස්වසර' මෙලෙස සටහන් කර ඇත. ''මාක්ස්වාදය මගේ ජීව වායුව වුණා. සත්තකින්ම වැඩකරන පංතියට මා ඇද බැඳ තබාගැනීමට සමත් වුණේ පාසලේ ගත වූ ඒ පස් වසරයි.''

**ලෙනින් හමුවීම හා සයිබීරියාවට පිටුවහල් කිරීම**

1894 දී කෲප්ස්කයාට ලෙනින් පළමු වරට දකගැනීමට හැකිවූයේද රහසිගතව සංවිධානය කරන ලද මාක්ස්වාදී අධ්‍යයන කවයකට සහභාගී වීම සඳහා ලෙනින් පැමිණි මොහොතකදීය. ඒ වනවිට ලෙනින් පිහිටුවාගෙන තිබූ සටන්කාමීන්ගේ සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාවක් බවට පත්වීමට 25 හැවිරිදි වියේ පසුවූ කෲප්ස්කයාට එම හමුවීම මග පෑදිය.

සාර් පාලනයට එරෙහිව කරන අරගලයේදී වැඩකරන පංතිය සිය පංති විඥානයෙන් සන්නද්ධ කළ යුතු බව වටහා ගත් කෲප්ස්කයා ඒ සඳහා ලෙනින් සමග එක්වී වැඩකිරීමට පටන් ගත්තාය. ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරිත්වය සාර් පාලනයට කොතරම් තදින් දැනුණේද යන්න 1895 වසරේදී ලෙනින් හා කෲප්ස්කයා අත්අඩංගුවට ගැනීමෙන්ම පැහැදිලි වේ. කෙසේ වෙතත් ලෙනින් රඳවාගෙන කෲප්ස්කයා නිදහස් කෙරුවද 1896 දී නැවතත් ඇය අත්අඩංගුවට ගැනිණ. සාර්ට එරෙහිව කම්කරුවන් සංවිධානය කිරීමේ වරදට 1898 වසරේ මැයි මාසයේදී වසර 03ක කාලයකට කෲප්ස්කයා සයිබීරියාවට පිටුවහල් කරන විට ඊට පෙර වසරේ එම චෝදනා යටතේම වසර 03 කට ලෙනින්ව සයිබීරියාවේ සුෂෙන්ස්කොයේ ප්‍රදේශයට පිටුවහල් කර තිබුණි.

එකම අරමුණක් වෙනුවෙන් එකට වැඩකිරීම තුළ ගොඩනැගුණු සමීපකම ලෙනින් හා කෲප්ස්කයා අතර දැඩි බැඳීමක් දක්වා වර්ධනය වී තිබීම නිසාම ඔවුන් විවාහවීමට තීරණය කළ අතර එම විවාහය ඉතාමත් දුෂ්කර ජීවත්වීමට අපහසු වටපිටාවක් තිබෙන සයිබීරියාවේදී 1898 ජූලි මාසයේදී සිදුවිය.

**ලෙනින්ට ලබාදුන් සහයෝගය**

පිටුවහල් කර සිටි කාලසීමාවේදී ලෙනින් පොත් 30ක් පමණ ලියූ බව පැවසේ. පොත් ලිවීමේදී ඒ සඳහා සමහර කරුණු සොයාදෙමින් කෲප්ස්කයාද නිරන්තර අධ්‍යනයක යෙදුණු අතර සමහර පොත් පරිවර්තනය කිරීමට ලෙනින්ට සහාය විය. ලෙනින් පොත් ලියන විට ගෙදර තුළ නිහඬතාවය රකිමින් ඔහුට විශාල සහයෝගයක් ලබාදීමට ඇය කටයුතු කළාය. පිටුවහල් කාලසීමාවෙන් පසුවද ලෙනින් පසුපස නිරන්තරව රහස් පොලිසිය ලුහුබැඳීම හේතුවෙන් රහසිගතව සැඟවී විදේශගතව දේශපාලන කටයුතු කිරීමට සිදුවූ තත්වයක් තුළ ලෙනින් හා පක්ෂයේ සාමාජිකයින් අතර පණිවුඩ හුවමාරු කිරීමේ කටයුතු ද කිරීමට ඇයට භාර විය. ඇතැම් විටෙක වෙස්වළාග නිමින් ගමින් ගමට නගරයෙන් නගරයට යාමටත් රාත්‍රී කාලයේ කැළෑ මාර්ගවලින් තනිව ගමන් කිරීමටත් විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දීමටත් සිදුවූ අතර කෲප්ස්කයා එම අවස්ථාවන්ට නොබියව ධෛර්යෙන් යුක්තව මුහුණ දුන්නාය. තම ජීවිත ආරක්ෂාව වෙනුවෙන් රුසියාවෙන් පලා ආ හා දේශපාලන කටයුතු හේතුවෙන් රටින් පිටුවහල් කර සිටි බෝල්ෂෙවික් කම්කරුවන් සඳහා මාක්ස්වාදය ඉගැන්වීමට ලෙනින් හා කෲප්ස්කයා එක්ව 1911 වසරේදී පැරිසියට ආසන්නයේ පක්ෂ පාසලක් ආරම්භ කළ අතර එම පාසල පවත්වාගෙන යාමටත් එහි ගුරුවරියක් ලෙසත් ඇයට විශාල වගකීමක් පැවරී තිබුණි. එසේම පුවත්පත් පත්‍රිකා මුද්‍රණය කර රහසිගතව ඒවා රුසියාවට ගෙන ගොස් බෙදාහරිමින් වැඩ කරන ජනතාව දැනුවත් කිරීමටද ඇය මැදිහත් වූවාය.

නූගත්කමට සාපකළ කෲප්ස්කයා පාලක පන්තිය විසින් දරුණු ලෙස පොදු ජනතාව රවටනු ලබන බව හා පාලකයින් වුවමනාවෙන්ම පොදු ජනතාව නූගත්බවේ ගිල්වා තබන බව හොඳින් තේරුම්ගෙන සිටියාය. 1917 විප්ලවයෙන් පසුව කෲප්ස්කයා මහජන අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිධුරයක් දරමින් ගුරුවරුන් පුහුණු කරමින් පුස්තකාල ගොඩනග මින් වැඩිහිටි අධ්‍යාපනය ඉහළ තලයකට ගෙන ඒමට දායක වූවාය. ජනතාවගේ සාක්ෂරතාවය වැඩිකිරීමට ඇය විසින් දියත් කරනු ලැබූ සැලසුම් කොතරම් සාර්ථක වූයේද යන්න 1920-40 කාලය අතරතුර මිලියන 60ක වැඩිහිටි ජනතාවක් ලිවීමට කියවීමට හැකියාව ලැබීමෙන්ම පැහැදිලි වේ.

''නූගත්කම ශාපයකි. එවන් නූගත්කම මකා දැමීම සෝවියට් අධ්‍යාපන ක්‍රමයේ මූලික පරමාර්ථයක් විය යුත්තේ මන්ද? අපේ ජනතාව තුළින් නූගත්බවේ අන්ධකාරය දුරු කිරීමටත් ඔවුන් ආර්ථිකව හා සංස්කෘතිකව නගාසිටුවීමටත් අත්‍යාවශ්‍යම පළමුවෙනි කාරණය නම් නූගත්කමේ ශාපය දුරු කිරීමයි.'' මෙලෙස පැවසූ කෲප්ස්කයා ඇගේ ජීවිත කාලය තුළ ජනතාව වෙනුවෙන් පොත්, ලිපි ලේඛන විශාල ප්‍රමාණයක් ලියූවාය. අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දැක්වූ ඇය 1917 විප්ලවය සිදුවන විටද අධ්‍යාපන විද්‍යාව පිළිබඳව ශබ්ද කෝෂයක් සකස් කරමින් සිටි බව පැවසේ. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකාවක් ලෙසින්ද කටයුතු කරමින් විශාල කාර්යභාරයක් ඉටුකළ කෲප්ස්කයා ධනපති පංතියට එරෙහිව අරගලයේදී අධ්‍යාපනය මඟින් මතවාදීමය වශයෙන් විශාල කාර්යයක් කළ හැකි බව අවබෝධ කරගනිමින් ඒ සඳහා ක්‍රියාශීලී වැඩ කොටසක් කළ ආදර්ශමත් විප්ලවවාදී නායිකාවක් ලෙසින් ජනතා හදවත් තුළ සනිටුහන් වී ඇත.

**''අද වුවත් අප අතර කාන්තාව ගැන අයහපත් අදහස් කීපයක් රැව් පිළිරැව් දෙයි. සමාජය තුළ විප්ලවවාදීනියන් වශයෙන් තමා සතු කාර්යභාරය තමා ඉටුකර ඇතැයි සිතන්නේ නම් එය බලවත් වරදකි. මට හිතෙන්නේ කාන්තාව තවදුරටත් සටන් කළ යුතු බවය. තමන්ට නියම විදියට සමාජයේ හිමි ස්ථානය අයිතිකර ගැනීම සඳහා මහත් සේ මහන්සි විය යුතු බවය. අතීතයේදී අපේ රටේ කාන්තාව දෙයාකාරව සූරාකෑමටත් නින්දා අපහාසයටත් ලක්වූවා නම්, එසේම ඇය අද සිදුවන සමාජමය විප්ලවය තුළ දෙයාකාරව විප්ලවවාදී විය යුතුය.''**

ෆිදෙල් කස්ත්‍රෝ




# අරාබි විප්ලවය

## අදේශපාලනික 'දේශපාලනයේ' ඉරණම

80 දශකයේ අග බටහිර අධිරාජ්‍යවාදී රටවල සහය ලැබූ 'විප්ලවයක්' සිදුවෙමින් තිබුණා. ඒ, සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී රටවල පාලකයන්ට එරෙහිවයි. පෝලන්තය වැනි තැනක වෘත්තීය සමිති නායකත්වයෙනුත් සෙසු බොහෝ තැන්වල රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සංවිධානවල නායකත්වයෙනුත් මෙම 'විප්ලවයන්' දියත් වුණා. රෝස්, ඔරේන්ජ්, ටියුලිප් රෙවලූෂන් ලෙස නාමකරණය කරන ලද මෙම ජන නැගිටීම් විසින් ඉල්ලා සිටින ලද්දේ, බටහිර ප්‍රජාතන්ත්‍රවාදය තම රටවල ස්ථාපිත කරන ලෙසයි. සැලකිය යුතු ජන කොටසක සහය ඇතිව ඉදිරියට තල්ලු කරවන ලද මෙම විප්ලව ජයග්‍රාහීව නිමා වූයේ, එම සමාජවාදී රාජ්‍ය පද්ධතිය සම්පූර්ණයෙන්ම බිඳවට්ටවමිනුයි. තමන් සිදුකරගෙන ඇත්තේ, විශාල වරදක් බවත් තම රටවලට සමාජවාදී යුගයේ තිබූ සවිමත් ආර්ථික තත්වය පවා අහිමි වී ඇති තවත් බර්ලින් තාප්ප පෙරලූ ජනතාවට තේරුම් යන්නට තවත් දශකයක් පමණ ගත වුණා.

### වර්ණගැන්වූ විප්ලව

මේ ප්‍රවේශය ලබා ගත්තේ එම රාජ්‍ය පද්ධතිය පිළිබඳව හෝ ඒ 'විප්ලව' පිළිබඳ සාකච්ඡාවකට නොවෙයි. එහෙත් ඒ හා සමානකම් ඇති 'විප්ලව' රැල්ලක් අද අපි නැවතත් දකිමින් සිටිනවා. ඒ, මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු රටවලිනුයි. මෙම 'විප්ලවයන්ද' දියත්වෙමින් ඇත්තේ, බටහිර අධිරාජ්‍යවාදී රටවල සෘජු හෝ වක්‍ර සහයෝගය ඇතිවයි. වර්ණ ගැන්වූ විප්ලව හෙවත් Cloured Revolution ලෙස නාමකරණය කරනු ලැබ ඇති මෙම 'විප්ලව' ලිබියාව, සිරියාව, වැනි කොතැනකදී බටහිර යුධමය සහය ඇතිවත් ටියුනීසියාව, ඊජිප්තුව, ඉරානය, යේමනය, වැනි තැනක මතවාදී සහය ඇතිවත් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ටියුනීසියාව, ඊජිප්තුව හා ලිබියාව යන රටවල 'වර්ණ විප්ලවයන්හි' පළමු අදියර දැනටමත් සම්පූර්ණයි. එනම් පාලකයන් එළවා දමා හෝ ඝාතනය කර අවසන්. සිරියාව, ඉරානය බිඳ දැමීම සඳහා කඳවුරු බඳිනු ලැබෙමින් තිබෙනවා. දණ ගස්සවනු ලැබ ඇති යේමන පාලක අබ්දුල්ලා සලේ බලය පැවරීමට සූදානමින් සිටිනවා. ඉරානය හැරෙන්නට අන් සියලු රටකම පාහේ දීර්ඝ කාලයක් පාලනය කළ පාලකයින්ට එරෙහිව සැබෑ ජනතා විරෝධයක් එල්ල වෙමින් තිබූ බව අමතක කළ නොහැකියි. මේ විරෝධය ආණ්ඩු පෙරළීම් ඇති කරවන බලවේගයක් බවට විකාශනය වීමේදී මේ රටවල දේශපාලන පක්ෂවල මැදිහත්වීම සාපේක්ෂ වශයෙන් අවම මට්ටමක පැවතුණා. වැඩි දායකත්වයක් ඒ සඳහා ලැබෙනුයේ රාජ්‍ය නොවන සංවිධානවලින් හා සිවිල් සමාජ සංවිධාන මගිනුයි. මේ හේතුව නිසාම 'විප්ලව' ලෙසට නාමකරණය ලැබුවද පෙරළියක් සිදුවීමකින් තොරවම 'විප්ලවය' හමාර වීමේ අවදානමකට මේ රටවල ජන නැගිටීම් පාත්‍ර වී තිබෙනවා. පැන නැගි ජන අරගල තමන්ට අවශ්‍ය ලෙස කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාව අධිරාජ්‍යවාදී රටවල් මනා ලෙස තේරුම්ගෙන තිබෙනවා. ලෝකයේ ඛනිජතෙල් හා ස්වාභාවික වායු සංචිතවලින් 60% කට හිමිකම් කියන මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ රටවල් සම්බන්ධයෙන් බටහිර අධිරාජ්‍යවාදයේ උනන්දුවත් ඒවායේ දේශපාලන චලනයත් පිළිබඳ සංවේදීතාවයක් තේරුම්ගත හැකියි.




### 'විප්ලවයට' බටහිර සහය

අරාබිකරයේ ජනරැල්ලට බටහිර සහය පළවන්නේ පුළුල් අර්ථයෙන් කිරා මැන බැලීමකින් පසුව බව පැහැදිලියි. මෙය කරුණු තුනක් ඔස්සේ සලකා බැලිය හැකියි. ඉරානය වැනි තැනක හැරෙන්නට අන් සියලු රටවල දිගු කාලයක් බලයේ රැඳි දැඩි මර්දනකාරී පාලනයන් පවත්වාගෙන ගිය හා තවමත් පවත්වාගෙන යන පාලකයින් රැකීමට ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී රටවල් ඉදිරිපත් වුණේ නැහැ. මෙම බොහෝමයක් රටවල නායකයින් දීර්ඝ කාලයක් බටහිරට හිතවත්ව හා අධිරාජ්‍යවාදයේ න්‍යාය පත්‍රය තුළ සිටියද ඒ සියල්ල නොසලකා හැරීමට බටහිර කටයුතු කළා. ඒ පළමු කරුණයි. දෙවැන්න මෙම ජන අරගලවල නායකත්වය තමන්ගේ පාලනයේ පවතින බවට ඔවුන් තුළ පවතින විශ්වාසයයි. ඇතැම් සටන් පාඨයක් අධිරාජ්‍යවිරෝධී ඒවා ලෙස පෙනී ගියත් සමස්ත සටන තමන්ගේ පාලනයේ බව ඔවුන් දන්නවා.

තෙවැනි කරුණ ඒ හා බැඳී පවතින්නක්. එනම් යම් අවස්ථාවක ජන අරගලවල නායකත්වය තමන්ගෙන් ගිලිහී ගියද ඒවා ක්‍රමයට එරෙහි වාමාංශික සමාජ ව්‍යාපාර අතට පත්වීමේ අවදානමක් අධිරාජ්‍යවාදී රටවලට නොපැවතීමයි. බොහෝ දෙනා සැක කළේ, මෙම ජන අරගල සිදු වූ රටවල් මුස්ලිම් රටවල් වූ බැවින් මුස්ලිම් අන්තවාදී කොටස් මේ අරගල පිටුපස සිටිය හැකි බවත් නායකත්ව භූමිකාවක් අත්පත් කර ගත හැකි බවත්. එහෙත් බටහිර අධිරජ්‍යවාදය මුස්ලිම් අන්තවාදය සමග දැන් මතුපිට ප්‍රකාශිත තලයේ යුධමය ප්‍රතිරෝධයක සිටියත් අවසාන විග්‍රහයේදී ක්‍රමයට අභියෝගයක් විය හැකි වාමාංශික දේශපාලනයට තරම් බිය ගන්නේ නැහැ. ලිබියාවේ ගඩාෆි පාලනය, යුද්ධය කෙරීගෙන යන අතරතුර බටහිරින් රහසිගතව කැරලිකරුවන්ට ලැබෙන අවි අල් කයිඩාවරුන් අතට පත් වන්නේය යන කරුණ පෙන්වා දීමට උත්සාහ කළද ඒ පිළිබඳව බටහිර කිසිදු තැකීමක් කළේ නැහැ.

### 'විප්ලවයෙන්' උපන් මාෂල්

ලිබියානු විප්ලවය තවමත් ලිබියානුවන්ට උණුසුම් බැවින් අත්දැකීම් සමාලෝචනයට කල් වැඩියි. එහෙත් අධිරාජ්‍යවාදයේ සහය ලද වර්ණ විප්ලවයන්හි ප්‍රතිඵල විමසීමට හොඳම නිදසුන වන්නේ ඊජිප්තුවයි. 2011 පෙබරවාරියේ හොස්නි මුබාරක් බලයෙන් පහවීමෙන් පසු විප්ලවය සම්පූර්ණයැයි සිතූ ඊජිප්තු වැසියන්ට නැවතත් කයිරෝවේ ටාහිර් චතුරස්‍රයට රැස්වී උද්ඝෝෂණය කිරීමට සිදුව තිබෙනවා. ඒ මුබාරාක්ගෙන් පසු බලයට පත් හමුදා කවුන්සිලයට එරෙහිවයි. දේශපාලන ප්‍රතිසංස්කරණ පමාවීමට එරෙහිවූ ඔවුන් එතනින් ඉවත්කිරීමට හමුදා පාලනය ගත් උත්සාහය තුළ විරෝධතාකරුවන් 50කට වැඩි පිරිසක් දිවි දුන්නා. හමුදා කවුන්සිලයේ (SCAF) අණදෙන නිලධාරී හුසේන් ටන්ටාවි මේ තත්වය තුළ ජාතිය අමතමින් කියා සිටියේ, තමන් කඩිනමින් බලය භාරදීමටත් මවුබිම ආරක්ෂා කිරීමේ මුල් වගකීම වෙත ආපසු යාමටත් සූදානම් බවයි. ටන්ටාවි බලය බාරදීමට අපේක්ෂා කරන්නේ, ජනතාවට නොවන බව උද්ඝෝෂකයන්ට වෙඩි තැබීමෙන් පැහැදිලියි. අනෙක් අතට මවුබිම ආරක්ෂා කරන බව ප්‍රකාශ කළද ආරක්ෂා කරන්නේ, ප්‍රාග්ධනයේ හිමිකම බව ජනතාවට තුවක්කු එල්ලකිරීමෙන් පෙනීයනවා. සැබවින්ම 'විප්ලවයක්' කළ ඊජිප්තු වැසියන්ට අද සිදුවී ඇත්තේ, එක් ඒකාධිපති මුබාරක් කෙනෙකු වෙනුවට හමුදා ඇඳුමින් සැරසුණු මුබාරක්ලා 16 දෙනෙකුගේ පාලනයට මුහුණදීමටයි.

ඊජිප්තු ජනතාවගේ ඉරණම මෙයට වඩා වෙනස් නොවන තැනට සීමාකර ගැනීම සඳහා අධිරාජ්‍යවාදී මැදිහත්වීම් සිදුවූ බවට තොරතුරු හෙළිදරව් වෙමින් තිබෙනවා. සර්බියාවේ මලොසෙවික් පාලනය පෙරළා දැමීම සඳහා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ආධාර ලද Otpor නම් රාජ්‍ය නොවන සංවිධානය (දැන් CANVAS) ඊජිප්තු රාජ්‍ය නොවන සංවිධාන නායකයින් පුහුණුකිරීමේ කටයුත්තේ යෙදී සිටි බව හෙළිදරව් වී තිබෙනවා. අප්‍රේල් 6 ව්‍යාපාරය ඉන් එක් සංවිධානයක්. එහි නායකයෙකු වන මෙහොමඩ් අඩෙල් CANVAS යටතේ සර්බියාවේ පුහුණුව ලබා ඇති අතරම එම සංවිධානය එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේනතුව අනුග්‍රහය දක්වන සමුළුවක් සඳහා 2008දී නිව්යෝක් බලා යාමෙන්ද, මෙම කරුණ තහවුරුවෙනවා.

### 'විප්ලව' අත්පොත

රාජ්‍ය නායක මාරුකිරීම් කිරීම සඳහා මෙම බිම් මට්ටමේ සංවිධානවල අත්පොත බවට පත්කරගෙන ඇත්තේ, හාවඩ් මහාචාර්ය ජීනේ ෂාප්ගේ 'ඒකාධිපතිවාදයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට' (From Dictatorship to Democracy) නම් කෘතියයි. ඔහුගේ ඇල්බට් අයින්ස්ටයින් ආයතනය, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවට අනුබද්ධ ආයතන මගින් ආධාර ලබන්නක්. 2000දී සර්බියාවේ Otpor (වත්මන එය හැඳින්වෙන්නේ CANVAS ) සංවිධානයේ නායකත්වයෙන් දියත්වූ 'විප්ලවය' සඳහා උපයෝගී කරගත් මෙම ආකෘති අද මැදපෙරදිගදී අත්හදා බැලෙමින් තිබෙනවා. වමේ දේශපාලන මගපෙන්වීමක් නොමැතිව මෙම සංවිධාන වටා ඒකරාශීවන ජන කොටස්වලට ඒ සංවිධානවල නායකත්වයන් පිළිබඳව හෝ ඒවායේ අරමුණු පිළිබඳ ගැඹුර සොයාබැලීමක් කෙටිකාලීනව කරගත නොහැකියි. ඔවුන්ගේ සහභාගිත්වය අවංක ලෙස සිදුවුවද ඔවුන්ගේ දායකත්වයෙන් සිදුවන පෙරළිවල අවසන් ප්‍රතිඵලයන්ට ඔවුන්ට වගකිව නොහැකිවී තිබෙනවා. සැබැවින්ම මෙම තත්වය මැදපෙරදිගට පමණක් සීමා වී නැහැ. අරගල බිමට ජනතාව කැඳවන බිම් මට්ටමේ සිවිල් සංවිධාන බොහෝමයක් එක්කෝ දැනුවත්ව හෝ නොදැනුවත්ව තම ප්‍රහාරකයාගේම ගොදුරු බවට පත්වීමේ ප්‍රවණතාවයක් දැකිය හැකියි. මෙය මෑත කාලීනව පැනනැගි තත්වයක්ද නෙමෙයි. විප්ලවීය ව්‍යාපාරවල දුර්වලයින් සතුරා වෙතට දිනාගැනීමේ සිට ව්‍යාජ 'විප්ලවකාරීන්' හා 'විප්ලවයන්' නිර්මාණය කිරීම දක්වා අධිරාජ්‍යවාදයේ මැදිහත්වීම් පිළිබඳ අත්දැකීම් ලෝක දේශපාලනය තුළ හිඟ නැහැ. විශේෂයෙන් ජනගැගිටීම් වළක්වා ගතහැකිනම් වළක්වා ගන්නටත් නොහැකිනම් ඒවා තමන් විසින් දිගේලි කරන මට්ටමකට රඳවා ගැනීමටත් අධිරාජ්‍යවාදීන් උත්සාහ ගන්නවා. 1968 කාලයේ ආර්ථික අර්බුදයට එරෙහිව යුරෝපයේ පැතිර ගිය ශිෂ්‍ය හා තරුණ කැරලි යුරෝපා දේශපාලනයට කිසිදු එකතුවක් නොකරම අවසන් වුණා. එවා නිවැරදි දේශපාලනික මග පෙන්වීමකින් තොරව පැන නැගී නිසාම ධනවාදයට අභියෝගයක් එල්ල කිරීමට අසමත් වුණා. එවායේ නායකයින් ධනේශ්වර දේශපාලනය විසින් අවශෝෂණය කර ගැනුණා.

මෑතකාලීනව එක්සත් ජනපදයේ දිගහැරෙන වොල් ස්ට්‍රීට් අත්පත් කරගැනීම (Occupy WallStreet) නම් ව්‍යාපාරයේ ඉරණමද ඊට නොවෙනස්වනු ඇති බවට සැක නැහැ. මන්ද ඊට නිවැරදි දේශපාලන දැක්මකින් මගපෙන්වීමක් ලැබෙන බවට සාධක නොමැති අතරම CANVAS වැනි සැක කටයුතු සංවිධාන සමග සබඳතා ඇති ඇතැම් සංවිධාකයින්ගේ අවිශ්වාස සහගත හැසිරීම්ද එයට බලපානවා. 2007 දී ඇමරිකාවේ මතුවූ එක් සමාජ ව්‍යාපාරයක් වූයේ ටී පාටි (Tea Party Movement) ව්‍යාපාරයයි. එහි අවසානය රිපබ්ලිකන් පක්ෂයේ 2008 ජනාධිපතිවරණ ප්‍රචාරක සටන සමග සිදුවුණා. වෝල් ස්ට්‍රීට් අත්පත්කරගැනීමේ ව්‍යාපාරයේ පළමු කැඳවීම වෝල් ස්ට්‍රීට්හි කුප්‍රකට කෝටිපතියෙකු වන ජෝර්ජ් සෝරොස්ගේ පදනමකින් ආධාර ලබන Adbusters නම් මාධ්‍ය ආයතනයක් මගින් සිදුවූ බව ප්‍රකාශ වෙනවා. එහෙත් එක්සත් ජනපදයේ ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් ක්‍රමවිරෝධී සැලකිය යුතු ජන ප්‍රජාවක් ආකර්ෂණය කර ගැනීමට එම ව්‍යාපාරය සමත් වුණා. එහෙත් සැක ඇති මූලයන් සහිත සහ නිවැරදි දැක්මකින් තොරව ක්‍රියාත්මක මෙම ව්‍යාපාරයට ගොනුවන ජන බලය 2012 වසරේ ඩිමොක්‍රටික් පක්ෂයේ ජනාධිපතිවරණ සටනට බැරවීමේ වැඩි ඉඩක් තිබෙනවා.

ඒ අනුව බලන විට මෙවැනි අදේශපාලනික 'දේශපාලන' මැදිහත්වීම්වල ඉරණම ඉතාම පැහැදිලියි. සහභාගිවන්නගේ හා ප්‍රේක්ෂකයින්ගේ සද්භාවයට පමණක් වෙනස් කළ නොහැකි ඒවායේ ගමන්මග, බිඳවැටෙන ධනවාදයටම කෙටි කාලයකට හෝ සක්කයක් බවට පත්වීමෙන් අවසන් වනු ඇති. මේ තත්වය තුළ ලොව පුරා වඩ වඩාත් අවධාරණය වන්නේ, අපතේ නොයන හා අතරමං නොවී අවසන් ජයග්‍රහණය අත්පත්කරගත හැකි නිවැරදි දේශපාලන දැක්මක් වටා පෙළගැසෙන ජන බලවේගයක අවශ්‍යතාවයයි. එමෙන්ම දියුණු මාක්ස් ලෙනින්වාදී දැක්මකින් හා සංවිධානාත්මක දේශපාලන පක්ෂයක මගපෙන්වීමකින් තොරව ධනවාදය පෙරළා දැමීමට හා නව සමාජ පරිවර්තනය යථාර්ථයක් බවට පත්කිරීමට නොහැකි බවයි.



'දිලිසෙන' ඇඳුමෙන් සැරසී ඕනෑවට වඩා 'ව්‍යාජ සුහද ගති පාමින්' හැසිරෙන මිනිසෙකු දකින සාමාන්‍ය ව්‍යවහාරික බුද්ධියක් හා අත්දැකීම් ඇති මිනිසා ''මූනම් හොර තක්කඩියෙකු විය යුතුය'' යි නිවැරදිව තීරණය කරන්නාක් මෙන්ම, අපේ කාලයේ පංති හැගීම් ඇති කම්කරුවෝ හා ගොවියෝ ධනපති බුද්ධිමතුන්ගේ ගර්විත වාග්පාඨවල ගැබ්වී ඇති වංචා සහ කූටෝපාය ලෙහෙසියෙන්ම බැහැර කරති.

**ලෙනින්**
**සමාජවාදී දෘෂ්ටිය හා සංස්කෘතිය**

කවුළුව හැරමී තබමි

# ආසියාවේ ආශ්චර්යයේ නිරුවත දුටිමි



කොළඹ දේශපාලනය කිරීමට පාතාලය අත්‍යවශ්‍ය බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා පැවසුවේ යැයි ඝාතනයට ලක්වූ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතාගේ දියණිය ප්‍රකාශ කර තිබේ. භාරත ඝාතනයේ සැකකරුවෙක් වන දුමින්ද සිල්වා බැලීමට ගෝඨාභය රාජපක්ෂ මහතා මෙන්ම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාද ජයවර්ධනපුර රෝහලට යාමත් අධිකරණය දුමින්ද සිල්වා සැකකරුවෙකු ලෙස නම් කිරීමට ප්‍රමාද වීමත් හදිසියේම දුමින්ද සිල්වා ප්‍රතිකාර සඳහා විදේශයට රැගෙන යාමත් භාරත ඝාතනයේ තවත් සැකකරුවෙකු වන පාතාල ලෝකයේ නමක් තිබෙන කරාටේ ධම්මික හදිසියේ අතුරුදහන් වීමත් එකිනෙක ගෙන සලකා බලන විට ආරක්ෂක ලේකම්වරයාගේ ඉහත ප්‍රකාශය මේ සිද්ධීන් සමග යම් සම්බන්ධතාවයක් තිබේදැයි කෙනෙකු සැක සිතුවහොත් එහි වරදක් නැත.

ආසියාවේ ආශ්චර්යය බවට ලංකාව පත් කරන බව ආණ්ඩුව පුන පුනා සඳහන් කරමින් සිටී. ඒ වෙනුවෙන් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වලට වැඩි ප්‍රචාරයක්ද ලබා දෙමින් තිබේ. මිනිසුන් ආසියාවේ ආශ්චර්යය විඳගැනීම සඳහා දෑස් දල්වා බලා සිටී. එසේ සිටින මිනිසුන්ට ජනාධිපතිවරයාගේ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ අධ්‍යක්ෂක භාරත මහතා මහ දවාලේ මිනිසුන් බලා සිටියදී ජනාධිපතිවරයාගේම ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයකු පිරිවර සමග පැමිණ වෙඩි තබා මරා දමනු බලා ගත හැකි විය. මෙයද ආසියාවේ ආශ්චර්යයක් යැයි අවශ්‍ය නම් කෙනෙකුට තර්ක කළ හැකිය. මක් නිසාද යත් මෙම සිදුවීම ආසියාව සමග සසඳන කල ආශ්චර්යයක් වන බැවිනි. එහෙත් මෙවන් පාලකයින් සෑම විටම තමන්ගේ බලය රැක ගැනීම සඳහා කරනු ලබන මෙවැනි ක්‍රියාකාරකම් අඩු නොමැති බව ඉතා පැහැදිලිය. එබැවින් දුමින්ද සිල්වාට හෝ ආරක්ෂක ලේකම්වරයාට හෝ ජනාධිපතිවරයාට හෝ මිය ගිය භාරත ලක්ෂමන් මහතාට හෝ මෙහි දොසක් පවසා වැඩක් නැත. කළ යුතු එකම කාර්යය වන්නේ, මෙවැනි මිනිසුන් නිර්මාණය කරන මෙන්ම මෙවැනි මිනිසුන්ගේ පැවැත්මට ඉඩ හැදෙන පාලන ක්‍රමයන් අහෝසි කිරීම සඳහා අපේ රටේ සබුද්ධික ජනතාව පෙරමුණ ගෙන කටයුතු කිරීමයි. එය ඉටු නොවන තාක් මෙවැනි ක්‍රියාදාමයන් අපගේ දෑස් ඉදිරිපිට යළි යළිත් දෘෂ්‍යමාන වනු ඒකාන්තය.

# නීතියේ තරාදිය බිම හෙළීම



තරාදිය යනු තුලනය හෙවත් සමබරතාවය ප්‍රකාශයට පත්වන සංකේතයකි. එම නිසාම නීතියට අදාලවද තරාදිය සංකේතයක් ලෙස යොදා ගෙන තිබේ. නීතියේ මූලික පිළිගැනීම වන්නේ ස්වභාවික යුක්තියයි. (Natural Justice) එනම් දෙපාර්ශවයේ කරුණු සැලකිල්ලට ගෙන තීන්දුව ප්‍රකාශයට පත් කිරීමයි. එය සංකේතවත් කිරීම සඳහා දෑස් බැඳගත් කාන්තාවක් තරාදියක් අතින් ගෙන සෑම අධිකරණ ශාලාවකම ප්‍රසිද්ධියේ ලැගුම් ගෙන සිටිනු දැකිය හැක. අගතියට පත්වන ඕනෑම පාර්ශවයක් තමන්ට නීතිය හමුවේ යුක්තිය ඉටු වනු ඇතැයි බලාපොරොත්තුවෙන් සිටී.

එහෙත් තරාදිය බිම වැටුණු පසු තුලනය අහිමි වනු ඇත. එවිට යුක්තිය ඉටු වන්නේ, සමබරතාවයෙන් නොවේ. වත්මන් ලංකාව තුළ එය බිම වැටෙමින් තිබෙනු දැකිය හැකිය. එහෙත් අප ඒ ගැන පුදුම විය යුතු නැත. මක්නිසාද යත් නීතිය යනු ඒ මොහොතේ පාලකයින්ගේ කැමැත්ත වන්නේ යැයි කාල් මාක්ස් විසින් මීට වසර 150 කට ප්‍රථම පැහැදිලි කර ඇති බැවිනි. එබැවින් කළ යුතු කාර්යය වන්නේ නීතියෙන් යුක්තිය ඉටු කර ගැනීම සඳහා නීතියේ ආධිපත්‍යය හිමි පාලකයින් වෙනස් කිරීමයි. එසේ නොවන තාක් නීතියේ තරාදිය බිම පතිත වීම වළකාලිය නොහැකි වනු ඇත.

# ජන ජීවිත දෙකට බෙදූ අධිවේගී මාර්ගය



ලෝකයේ බොහෝ අධිවේගී මාර්ග ඉදිවන්නේ, මිනිස් ගමනාගමනය පහසු කරලීම සඳහා පමණක් නොවේ. එහි මුඛ්‍ය පරමාර්ථය ආර්ථික ක්‍රියාවලිය වේගවත් කිරීමට අදාල ප්‍රවාහන පහසුකම සම්පූර්ණ කිරීමයි. එනම් ඒ සඳහා ගෙවන කාලය අවම කොට ආර්ථික ක්‍රියාවලියට අදාල දායකත්වය වේගවත් කිරීමයි. එම නිසාම අධිවේගී මාර්ගයක් ඉදි කිරීමේදී සැලකිල්ලට ගනු ලබන ප්‍රධානම සාධකයන් අතර ඉදිරියෙන්ම තිබෙන්නේ එමගින් මිනිස් ජීවිතයට වන සාධනීය මෙන්ම නිෂේධනීය බලපෑම කොපමණද යන්නයි. එසේම එය ඉදිකිරීම මගින් පරිසරයට සිදුවන බලපෑමේ ප්‍රමාණයද විශේෂයෙන් සැලකිල්ලට ගනී. නමුත් පසුගියදා විවෘත කරන ලද දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී මේ කිසිවක් සැලකිල්ලට ගෙන නොමැති බව තහවුරු වේ. එය ඉදිකිරීම සඳහා තෝරාගත් භූමිය ඍජුවම ජන ජීවිතය හා ඓන්ද්‍රීයව බැඳුණු එකකි. උදාහරණයක් ලෙස සඳහන් කළහොත් එම ප්‍රදේශවල ජනතාවගේ කුඹුර සහ වාසය කරන නිවස අධිවේගී මාර්ගය නිසා වෙන් වී තිබේ. නිවසේ සිට කුඹුරට යාමට අවශ්‍ය ගොවි මහතකුට සැතපුම් ගණනක් දුර ගෙවා පිවිසුම් මාර්ගයකින් යෑමට සිදුවී තිබේ.

පාසල් යන දරුවන්ටද මේ තත්වයට මුහුණ දීමට සිදුවී ඇත. පොදු මගී ප්‍රවාහනයේ පහසුව ලබන දෛනිකව රැකියාවට යන ජනතාවද මෙකී අපහසුතාව භුක්ති විඳිමින් සිටී. එපමණක් නොව බරපතළ පාරිසරික ප්‍රශ්න ගණනාවක්ද මේ හේතුවෙන් මතු වෙමින් තිබේ. සත්ව ගණ රාශියක් මෙම ප්‍රදේශවල වාසය කළද ඔවුන්ගේ වාසභූමි මෙමගින් අහිමි වී තිබේ. එසේම මෙහි ඇති අනෙක් ප්‍රධානම කරුණක් වන්නේ, අධිවේගී මාර්ග ඉදිකිරීමේදී පස් පුරවා ඒ මත පාරවල් ඉදිකිරීමක් ලෝකයේ කිසිදු රටක දක්නට නොමැති වීමයි. එහි තාක්ෂණික ප්‍රශ්ණය වන්නේ, පුරවන ලද පස උඩින් අඛණ්ඩව යෙදෙන ගමනාගමනය නිසා පරිසරයේ සිදුවන කාලගුණික බලපෑම නිසාත් එය යම් බැසීමකට ලක් විය හැකි බවයි. අධිවේගී මාර්ගයක එසේ සිදුවුවහොත් එයින් සිදුවිය හැකි හානියට ජීවිතවලින් වන්දි ගෙවීමට සිදුවීම අනිවාර්යය වනු ඇත. එම නිසාම අධිවේගී මාර්ග තැනීමේදී කොන්ක්‍රීට් කණු මත එය ඉදිකිරීම පිළිගත් ප්‍රමිතියයි. මේ සියල්ලෙන් තහවුරු වන්නේ, ලංකාවේ ධනේශ්වර ක්‍රමය ඔවුන්ගේ සංවර්ධනයේ පරිමාවටවත් ගෙන ඒමට මෙකී පාලකයින් අසමත් වී ඇති බවයි.

# ආපදා කළමනාකරණය හා සුළි සුළඟ

සුනාමිය යනු අපේ රටේ ආපදාවන්ගේ තීරණාත්මක බේදවාචකයක් එක් කළ සංසිද්ධියකි. එය සිදු වූ මොහොතේ පටන් මිනිස් මනස තුළ ගොඩ නැගෙන භයංකාර සිතුවිල්ල සමනය කිරීම සඳහා ආපදා කළමනාකරණය නමින් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීමටත් ඒ සඳහා වූ මධ්‍යස්ථානයක් ඉදි කිරීමටත් පාලකයින් විසින් කටයුතු කරන ලදී. රට තුළ සිදුවන ලොකු කුඩා ඕනෑම ආපදාවක් සම්බන්ධයෙන් එම අමාත්‍යාංශය වගකීම භාර ගන්නා බවත් එවැනි තත්වයන් වැළැක්වීම සඳහා පූර්ව සැලසුම් සකස් කර ඇති බවත් ජනතාවට මින් පසු ඒ සම්බන්ධයෙන් කිසිදු බියක් ඇති කර ගත යුතු නැති බවත් ආණ්ඩුව පුන පුනා පවසන ලදී. එහෙත් පසුගියදා සිදුවූ සුළි සුළඟ ආපදා කළමණාකරන මධ්‍යස්ථානයට හෝ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට හෝ පූර්වයේ නොදනුණු බවත් එම නිසාම එහි අනතුර සම්බන්ධයෙන් ජනතාව දැනුවත් නොවූ බවත් එසේ වූවා නම් සිදු වූ ජීවිත හානි සහ දේපළ හානි අවම කර ගත හැකිව තිබූ බවත් විපතට පත් ප්‍රදේශවල ජනතාව සඳහන් කරති. මෙහි සැබෑව වන්නේ, ජනතාවගේ ජීවිත සම්බන්ධයෙන් කිසිදු වටිනාකමක් නැති මෙබඳු පාලකයින්ගෙන් එවැනි සැලැස්මක් බලාපොරොත්තු විය නොහැකි බවයි. ඔවුන්ට වටිනාකම් පිළිබඳව තක්සේරුවක් හෝ අවබෝධයක් නැත. ඔවුන් කටයුතු කරන්නේ මිල ගැන පමණක් සිතමිනි. ඕනෑම දෙයක වටිනාකම නොදන්නා මිල පමණක් දන්නා තැනැත්තා නරුමයෙක් වනු ඇති බවට ඇති ප්‍රසිද්ධ කියමන මෙවන් පාලකයින්ට මනා සේ ගැලපෙනු ඇත.

# පොලිටිකල් පංතිය




පොලිටික්කා අද ටිකක් වෙනස්. ක්ලාස් එකට ආව වෙලාවේ ඉඳන් කළබල ගතියකින් තමයි ඉන්නේ.

අද ආණ්ඩුවේ අයවැය ඉදිරිපත් කරන දවස. ඒකයි මෑන් ඔය කලබල වෙලා ඉන්නේ කියලා වසන්ති චමියගේ කනට කරල කිව්වා.

පොලිටක්කගෙ පෙනුම මටනම් පේන්නේ අයවැය ඉදිරිපත් කරනකන් බලාගෙන හිටිය ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් වගේ. බැලූ බැල්මට තේරුමක් නැහැ වගේ ප්‍රකාශ කරන අමරයා එහෙම කිව්වේ චමියගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න වගේ.

ඒක හරියට පැහැදිලි නැහැ. වසන්ති තමන්ගේ ප්‍රකාශය වෙනුවෙන් පෙනී හිටියා.

නෑ බං ආණ්ඩුවේ මන්ත්‍රීවරු ඉන්නේ අයවැයේ මොකවත් නැති බව හොඳටම දැනගෙන වුනත් එලදායි දේවල් තියෙනවා කියල කතාකරන්නයි ඒ වෙනුවෙන් පෙනී ඉන්න වුනාම ඇතිවන මනෝ බ්‍රෂ්ටය හිතේ දරාගෙන. එතකොට උන්ව අපිට පෙනුනේ දැන් ඔය පොලිටික්කා පේන විදියට තමයි. අමරය හරේන් ප්‍රනාන්දුගේ ප්‍රශ්න වලට උත්තර දෙන දිනේෂ් ගුණවර්ධන වගේ උඩට ඉස්සිලා දෙකට නැමිල පැහැදිළි කළා.

ගුඩ්මෝර්නින් සර්. තවදත් පොලිටික්කගේ පැත්තට ටිකක් බර කමනි ප්‍රමාද වෙලා ආපු එක වහගන්න ලතාවකට එහෙම කිව්වා. මෝරනිං, මෝර්නිං ගිහින් වාඩිවෙන්න. පොලිටික්කා අහක බලාගෙ නම එහෙම කිව්වේ හරියට රනිල් අයි.එම්.එෆ් එක ගැන කරන පැහැදිලි කිරීම්වගේ.

ළමයි, ආණ්ඩුවේ අයවැය ලේඛනය මේ රටේ දැවැන්තම සංවර්ධනය අරමුණු කරගත් එකක් වන බව පැහැදිලිව පෙනෙනවා යනුවෙන් පොලිටික්කා තමන්ගේ දේශනය පටන් ගන්න හැදුවා.

සර් අයවැය ලේඛනය කියන්නේ ඇත්තටම මොකක්ද? අමරයා දැම්මේ ගුග්ලි පන්දුවක් කියලා චමියට තේරුණා.

රටක ආදායම් සහ වියදම් ගණනය කරලා වාර්ෂිකව ඉදිරිපත් කරන වාර්තාවට තමයි අයවැය ලේඛනය කියන්නේ. පොලටික්කා ඉදිරිපාදයේ ආරක්ෂිත පහරක් එල්ල කරා. එතකොට සර් ආදායමට වඩා වියදම වැඩිනම් අයවැය ලේඛණය ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන අරමුණු ඉටුකරගන්නෙ කොහොමද කියල අමරය ප්‍රශන කළේ පාර්ලිමේන්තුව තුළදි ජී.එල්.ගෙන් ප්‍රශ්න අහන සජිත් ප්‍රේමදාස වගේ ටිකක් උඩට ඉස්සිලා.

පොලිටික්ක ඒ පන්දුව නිදැල්ලේ යන්න ඉඩ හැරියේ පිත්ත දැම්මොත් අවුට් වන බව දැනගෙනමයි.

සංවර්ධනය කියන්නෙ රටේ ආර්ථිකයේ ඉදිරි පියවරක්. එය මෙතෙක් අපේ රටට අත්පත්කරගන්න බැරිවුණා. දැන් ඒ සඳහා අවස්ථාව උදාවෙලා තියෙනවා. ඒ වෙනුවෙන් තමයි අයවැය ලේඛණය සකස් වෙන්නේ. ඊට අදාල ඉදිරි දැක්ම තමයි මෙම ලේඛණයේ අකුරු වලින් ලියල තියෙන්නේ. පොලිටික්කගේ දේශනය හරියට ගුණසමරු කථාවක් වගේ.

සර් සංවර්ධනය මනින දර්ශක මොනවද? ඒ ගමන අමරගෙ සහයට පියලුත් එකතුවුණා. ඒ වුණාට පොලිටික්කා සැලැන්ඩර් වුණේ නැහැ. ආර්ථික වර්ධන වේගය, ඒක පුද්ගල ආදායම, මිලදී ගැනීමේ හැකියාව, දරිද්‍රතාවයේ මට්ටම, රැකියා විරහිතභාවයේ ප්‍රමාණය පොලිටික්කා නිකං ජනාධිපතිට පේන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරු විපක්ෂයට බනිනව වගේ. කියාගෙන කියාගෙන යනව.

සර් කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්තයා ඉදිරිපත් කරන අයවැය ලේඛණය ගැනනම් මට එක පේලියකින් ඒ ගැන කියන්න පුළුවන්. මෙතෙක් වෙලා නිහඬව හිටපු සමනය එක පාරටම එහෙම කිව්වාම මුළු පංතියම සමන් දිහා බැලුවා. පොලිටික්කාටත් කරගන්න දෙයක් නැතිවුණා.

ඔව් සමන් කියන්න බලන්න.

පොලිටික්ක ටිකක් ගාම්භීර විදියට කිව්වේ අයවැය ගේන වෙලාවේ ජනාධිපතිගේ පිටුපස අසුනේ හිටපු පවිත්‍රා ඇමතිතුමිය වගේ.

මේ අයවැය ගමරාලගේ වට්ටක්කා ගෙඩිය වගේ.

මුලු පංතියටම සමනයගේ පැහැදිළි කිරීමට හිනහවක් මතුවුණා. නමුත් පොලිටික්කට ටිකක් කේන්ති ආවා. ඒත් කේන්තිය පිට නොකරම ඒකට හේතු මොනවද කියල පොලිටික්ක සමන්ගෙන් ඇහුව.

මෙහෙමයි සර්,

ගමරාලගේ එළවලු කොරටුවේ වට්ටක්ක ගෙඩියක් හැදිල තියෙනවා. ඒක ටිකක් ප්‍රමාණයෙන් විශාල එකක් නිසා ගමරාල හිතුවලු මේ වට්ටක්ක ගෙඩිය ඇතුලෙ මොනව හරි විශේෂ දෙයක් තියෙනව කියල. වට්ටක්ක ගෙඩිය ඇතුලෙ තියෙන් දේවල ගැන විවිධ කථා හදල වට්ටක්ක ගෙඩියට වටිනාකමක් හදාගන්න ගමරාල ඇඩ්වටයිසින් වැඩකුත් කරලා. ඒ නිසා වට්ටක්ක ගෙඩිය කඩන දවසේ මුලු ගමටම එන්න කියල උත්සව ශ්‍රීයෙන් වට්ටක්ක ගෙඩිය කපන්න කටයුතු කළාලු. හැමෝම අත්පුඩි ගහන්න පටන් ගත්තහම ගමරාල වට්ටක්ක ගෙඩිය හිල් වෙන්න කැත්තෙන් කෙටුවලු. නමුත් වට්ටක්ක ගෙඩිය ඇතුලේ තිබිල තියෙන්නේ අනෙක් ඒවගේ වගේම ඇටයි මදයි විතරයි. අපේ ජනාධිපතිතුමත් අයවැය ඉදිරිපත් කරන්න ඉස්සර වෙලත් ඊට පස්සෙත් කියන්නේ ගමරාලගේ කතාවම තමයි. සමන් දිගටම කියාගෙන යන්න උත්සාහ කළත් හැරිල බලනකොට පොලිටික්ක පේන්න හිටියේ නැහැ. බැලින්නම් මිනිහ හිමින්ම මාරු වෙලා.

ආදායම් වියදම් සමාන වෙන්න ඇති. ඒකයි මිනිහ මාරු වුණේ. අමරය කිව්වේ ඔලොක්කුවට වගේ.

## 3 පිටුවෙන් ධනවාදයේ ...

කෙසේ වෙතත් මතුවෙමින් තිබෙන මෙම තත්වය තුළ ලාංකේය සැබෑ වමේ ව්‍යාපාරය ලෙස ජ.වි.පෙ.ට අභියෝගයක් තිබේ. එසේම අවස්ථාවක්ද තිබේ. පහසුවක්ද තිබේ. මෙහි ඇති අභියෝගය වන්නේ, මෙම ඊනියා පොදු හා වමේ මධ්‍යස්ථාන මගින් පොදු ජනයා නොමග යැවීමේ අනතුරත් ධනවාදයට එරෙහි අරගලයේ දිශානතිය අවුල් කිරීමේ ඉඩකඩත් විවිධ, කුමන්ත්‍රණ මගින් හා අතිධාවනකාරී ක්‍රියාමගින් විප්ලවවාදී ව්‍යාපාරයට හානිකර තත්වයක් නිර්මාණය කිරීමේ අනතුරක් පැවතීමය. මේ පිළිබඳව අවදියෙන් සිට ඉතාම නිරවුල් දේශපාලන දැක්මක සිට කටයුතු කිරීම මගින් මෙම අභියෝගය ජයගත හැක.

ඒ සමඟම මේ මගින් මතුවන අවස්ථාව වන්නේ, ධනපතින් හා අවස්ථාවාදීන් තමන්ගේම කඳවුරු ගොඩ නගන විට වමේ ව්‍යාපාරයට සැබෑ වමේ මධ්‍යස්ථානයක් ගොඩනැගීම පහසුවන බැවිනි. ඒ සඳහා ඉඩක් විවරවන බැවිනි. තම අරගලයේ ගමන්මග හරියටම පෙළගැස්වීමට මේ මගින් අමතර වාසියක් ලැබේ. දක්ෂිණාංශයේ කඳවුරක් මෙන්ම අවස්ථාවාදයේ ප්‍රගාමිත්වයේ කඳවුරක්ද එකවිට දෙපස පවතින විට ඒ දෙටම නොවැටී නිවැරදි මග යාමට අමතර පහසුවක් නිර්ධන පංති ව්‍යාපාරයට ලැබේ. එම අවස්ථාව හා වාසිය තම අරමුණ වෙනුවෙන් යොදාගැනීම නිර්ධන පංති ව්‍යාපාරයේ වගකීම වේ.

පොදුවේ ගත්කල අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයට අනුව කටයුතු කිරීම හැර, තව තවත් ණය ගැනීම හැර, රටේ ඉඩම් ටික විකුණා දැමීම හැර අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීම හැර, මහජන සේවා දුර්වල කිරීම හැර, ජනතාව මත බර පැටවීම හා ජනතාව මර්දනය කිරීම හැර වෙනත් යමක් කිරීමට මහින්දගේ පාලනයට නොහැකි බව පැහැදිලිය. එබැවින් වත්මන් ආණ්ඩුවේ බිඳවැටීම අනිවාර්යයක් වේ. ඇත්තේ කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණි. වත්මන් ආණ්ඩුව බිඳවැටෙන විට ඊට එ.ජා.ප. ආණ්ඩුව ආදේශ කිරීමට එ.ජා.ප. උත්සාහ කරන අතර එම අවස්ථාව වමේ ව්‍යාපාරය අතට යාම වැළැක්වීම ප්‍රතිගාමිත්වයේ අරමුණ වේ. ව්‍යාජ වමේ මධ්‍යස්ථානයක් සියලු අවස්ථාවාදීන් එකතුකර ගොඩනැගීමට අවශ්‍ය වන්නේ ඒ සඳහාය. එබැවින් සමාජවාදය සඳහා කරන සටනේදී ධනවාදයට එරෙහි අරගලය තරම්ම දැඩි අරගලයක් අවස්ථාවාදයට හා ප්‍රතිවිප්ලවකාරී රංචු ගැසීම්වලට එරෙහිවද කළ යුතු වේ. ජනතා විමුක්ති පෙරමුණ ඉදිරියේ දැන් ඇත්තේ එම අභියෝගයයි.

## 4 පිටුවෙන් කිලිනොච්චියේ...

ගොඩැලිවලිනුත් අපව බේරා ගැනීමට මහත් වෙහෙසක් දරමින් සිටියි. ''සහෝදරයා කිලිනොච්චියේ අපි ගියපු එක පාරක නම සිල්වා ලේන් නේද? කිලිනොච්චියේ පාරවල්වලට සිංහල නම් වැටුණේ කොහොමද? ඒවා දිගටම තිබුණේ කොහොමද? ''අනෝරා වර්ෂාවේ සද්දය කපාගෙන තවත් ප්‍රශ්නයක් නැගේ. ප්‍රශ්නය පාරක නමක්ම නොවන බව කාටත් පැහැදිලිය. මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නේ අරගල තුළින්ය. වැඩ තුළදීය. ''සිල්වා ලේන් යන නම වැටුණේ ඉඩම් නිලධාරී මහත්තයෙක් නිසා. එයා සිංහල, එයාගෙ නම සිල්වා. එයා ඉතා සාධාරණව දුප්පත් මිනිස්සු ඉඩම් බෙදලා දුන්න. ඒ නිසා පාරකට එයා ගියාට පස්සේ එයාගේ නම දැම්මා. මිනිස්සු එයාට ආදරය කළා. එල්.ටී.ටී.ඊ. ය කොතරම් බලවත් වුණත් සිල්වා මහත්තයා සිංහල කියලා එයාගේ බෝඩ් එක ගලවල දාන්න හයියක් තිබුනේ නැහැ. ඔය වගේම තවත් මාවතක් තියෙනවා ස්ටැන්ලි මාවත කියල. මිනිස්සු යම් අදහසක් විශ්වාස කරන්න පටන් ගත්තම ඒක මහ බලයක් වෙනව සහෝදරය, එක පරද්දන්න අමාරුයි. ඒක එදා එල්.ටී.ටී.ඊ.යටත් බැරි වුණා. අපි හැම ජාතිවාදයෙන්ම බැට කාපු මිනිස්සු. අපිට ඕන ජාතිවාදය නැති දේශපාලනයක් .

වෙලාව රාත්‍රී 11.30 වී තිබුණි. අපි අවසානයේ ඉලක්කය කරා ලඟා වීමු. ඉතා දිගු දුර ගෙවා අප සොයා පැමිණි මිනිසා එහි විය. එය නිවසක් නොව කූඩාරමකි. සින්නතම්බි සහෝදරයාද ඔහුගේ පවුලද වසර 3 1/2ක් තිස්සේ කූඩාරම්වල දිවි ගෙවමින් සිටිති.

යුද්දයෙන් පසු උතුර ගොඩනැගෙන්නේ එලෙසය! අනෝර වැස්සේ ඔහු හමුවට ආ අප පිළිබඳ ඔහුගේ මුහුණේ වූ දීප්තිය අපි දුටුවේ, ඔහු පත්තු කළ කුප්පි ලාම්පු එළියෙනි. අපි අළුයම තෙක් සාකච්ඡා කළෙමු. අත්දැකීම් බෙදා ගතිමු. නිදිමතත් මහන්සියත් මරාගෙන සහෝදරත්වයේත් පංති ප්‍රේමයේත් සුවඳ කූඩාරම තුළ දෝරෙ ගලා ගියේය. තිස් වසරක් එක්ව සටන් කිරීමට ඉඩක් නොලද පංති සගයන්ට එකට මුණ ගැසී ධනේශ්වර දේශපාලනයට එරෙහිව එකට ඉලක්කය සිතා එකට එක් වී කතා කරන්නට අවස්ථාවක් ලැබී තිබුණි.

වැස්සෙන් පසු කිලිනොච්චියේ පස තවත් සරුසාරය. කුමක් සිටෙව්වද දළුලා වැඩෙන බව නිසැකය. සින්නතම්බි සහොදරයාගේ සහෝදරත්වයෙන් ඔහුගේ පැල්පතේ සිටවූ 'පැලය' හෙට මහා ගසක්ව දළුලා වඩෙන බව පසක් කරනා හිමිදිරියක අපි ඔහුගේ පැල්පතින් සමුගෙන අලුත් වූ මිනිසුන් ලෙස පසු ගමන ඇරඹුවෙමු.

**ආනයන වටිනාකම**

| | 2010 | 2011 |
|---|---|---|
| ආනයන වටිනාකම (ඇමරිකන් ඩොලර් මිලියන) | 13451 | 19484 |
| වර්ධනය % | 32.4 | 44.9 |

**ආනයන සංයුතිය**

| | 2010 | 2011 |
|---|---|---|
| පාරිභෝගික භාණ්ඩ | 21.2% | 20.2% |
| අනිකුත් භාණ්ඩ | 55.5% | 57.0% |
| ආයෝජන භාණ්ඩ | 23.3% | 22.8% |

## 9 පිටුවෙන් දෙවැනි ඉනිමට...

පාර්ශ්වයන්ට සහන දී ඇත.

පනත භාණ්ඩ ආනයනයේදී පැනවූ බදු අඩුකර /ඉවත්කර ඇත.

1. රූපලාවණ්‍ය උපකරණ
2. ක්‍රීඩා භාණ්ඩ ගමන් මළු, අත්බෑග්, බඳපටි
3. ඇඟළුම්
4. පාවහන්
5. තොප්පි
6. පෝසිලේන් සහ පිඟන් මැටි විසිතුරු භාණ්ඩ
7. වීදුරු භාණ්ඩ
8. හැඳි, ගෑරුප්පු සහ රේසර්
9. සෙල්ලම් බඩු

හැඳි ගෑරුප්පු බදු අඩුකරන ආණ්ඩුව, යතුරු පැදියක් ලියාපදිංචි ගාස්තුව 1500 සිට 2000 දක්වාත්, ත්‍රීවීලරයක් ලියාපදිංචි ගාස්තුව රු. 2000 සිට 2500 දක්වාත් වැඩිකර ඇත්තේය. ඊට අමතරව යතුරු පැදි හා ත්‍රීවිලර් සඳහා දැනට පවතින වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුවද රු. 150කින් වැඩිකර ඇත. හැඳි ගෑරුප්පුවේ බදු අඩුකරන ආණ්ඩුව දුප්පතාගේ ප්‍රවාහන සේවයේ ගාස්තුව ඉහළ දැමීමේ අර්ථය තේරුම් ගැනීමට අසීරු නැත. රටේ පොදු මහත් බහුතර ජනතාවක්ම නොසලකා හරිමින්, ආණ්ඩුව උත්සාහ කර ඇත්තේ විවෘත ආර්ථිකයේ දෙවැනි ඉනිමට ගැලපෙන අයවැයක් ඉදිරිපත් කිරීමය.

අවප්‍රමාණයට ෂඵ්ත සතුටුවීම

අයවැය මගින්, ආණ්ඩුව රුපියලේ අගය අවප්‍රමාණය කරන විට ඊට ප්‍රතිචාර දක්වමින් ඉතාම සතුටු වන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලය. මූල්‍ය අරමුදල ආණ්ඩුවේ කටයුත්තක් ගැන සතුටු වනවිට අපි ඒ ගැන සැලකිලිමත් විය යුත්තෙමු. මේ වන විටත්, හෙළ උරුමය ඇතුළු ආණ්ඩුවේම පාර්ශ්ව අයවැයට පක්ෂ වන අතරේම අවප්‍රමාණය විරුද්ධ වී ඇත. මූල්‍ය අරමුදල ඇතුළු රටම ණය උගුලක ගැට ගසන බලවේගයන්ට මෙනි යෝජනාවන්ට සතුටු විය හැකි හැක්කේ, අන් කිසිවක් නිසා නොව එම යෝජනාද ඔවුන්ගේම නිසාය. රුපියල 3%කින් අවප්‍රමාණයන් සමගම දැනට ඩොලර් ලෙස අපි ලබාගෙන ඇති ණය හා පොලී වාරික වෙනුවෙන් රටක් ලෙස ලංකාව ගෙවිය යුතු ප්‍රමාණයද රුපියල්වලින් ඒ ප්‍රමාණයෙන්ම වැඩිවේ. එය රුපියල බාල්දු වීමේ ස්වාභාවික ප්‍රතිඵලයකි. ඊට අමතරව, ආණ්ඩුව අපනයන ආදායම් වැඩි වන්නේ යැයි කයිවාරු ගැසුවද සිදුවන්නේ එහි අනිත් පැත්තය.

ලංකාව අපනයන ආදායමට වඩා තුන්ගුණයක පමණ ආනයන වියදම සහිත රටකි. එම අපනයනවලිනුත්, ඛනිජ තෙල්, ගෑස්, බෙහෙත්, රසායනික ද්‍රව්‍ය, යන්ත්‍ර උපකරණ කිරිපිටි, වැනි දෑ අනම්‍ය-වෙනස් කළ නොහැකි, නිශ්චිත ලෙසම මිලදී ගත යුතු භාණ්ඩ වන්නේය. අපගේ අපනයන වෙළඳපොළ අස්ථාවරව තිබියදී අනම්‍ය භාණ්ඩ ආනයනයට එක්කෝ ණය විය යුතුය. නැතිනම් රටේ ආදායමින් ගෙවිය යුතුය. එම නිසා අවසාන ප්‍රතිඵලයේදී රුපියල අවප්‍රමාණයෙන් රටට හානියක් මිස යහපත් ආර්ථික ප්‍රතිඵල ගෙන නොදේ.

ණය උගුලේ තවදුරටත්

ආණ්ඩුවේ අයවැය ලේඛනයේම දක්වන පරිදි 2012 වසර සඳහා ණය ගැනීමේ අවශ්‍යතාවය රුපියල් බිලියන 1139කි. 2011 වසරේදී බිලියන 1029.7කි. ඉන් බිලියන 570ක්ම ණය ආපසු ගෙවීමට ගන්නා ණය වේ. එසේම 2011 ජූලි වන විට ලංකාව ගෙවිය යුතුව තිබූ මුළු ණය ප්‍රමාණය ඩොලර් බිලියන 20142.96කි. 2010 වසර හා සැසඳූ විට 2011දී 14.7%ක වැඩිපුර ණය ලබාගෙන ඇත.

ආණ්ඩුවේ මෙම ණය වාර්තා අපට වැදගත් වන්නේ ආර්ථිකයේ හැසිරීම සිදුවන්නේ ජාතික අවශ්‍යතාවයන් උදෙසා නොවන බව තේරුම් ගැනීමයට. ඒ නිසාම මෙවර අයවැයද සම්පූර්ණයෙන්ම රාජපක්ෂ පාලනය බාරගෙන ඇති විවෘත ආර්ථිකයේ දෙවැනි ඉනිම සඳහා ලකුණු රැස්කරන වැඩපිලළිවෙලක් බව තේරුම් ගත යුතුය. ඒ නිසාම වැඩකරන ජනතාව ඇතුළු නිර්ධන පංති බලවේගයන්ගේ වගකීම වී ඇත්තේ මේ ආර්ථිකය විනාශ කරන අයවැයට පමණක් නොව අයවැය මගින් තම අර්බුදය වසා ගැනීමට උත්සාහ දරන මේ දුබල සමාජ ක්‍රමයද වෙනස් කිරීමේ නව මාවත සඳහා අරගල කිරීමය. ඒ සඳහා පෙළ ගැසීමය.

**ණය ආපසු ගෙවීම -ඇ.ඩො.මිලියන**

| | 2010 | 2012 |
|---|---|---|
| ණය ආපසු ගෙවීම | 637.9 | 1273.6 |
| පොළිය | 380.0 | 493.3 |
| එකතුව | 1017.9 | 1766.9 |

මෙම ණයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දුන් ඩොලර් බිලියන 2.6 ක සමීපස්ථ ණය ඇතුලත් නොවේ.

**ණය දීමට ඇති එකඟතාවය (2011ජන-සැප්)**

| | | |
|---|---|---|
| චීනය | 44% | 784.72 |
| ජපානය | 29% | 520.48 |
| ආසියානු සංවර්ධන බැංකුව | 13% | 231.16 |
| ලෝක බැංකුව | 6% | 103.57 |
| එක්සත් ජාතීන්ගේ ආයතනය | 4% | 79.52 |
| ඩෙන්මාර්කය | 3% | 5452 |
| වෙනත් | 2% | 28.44 |
| එකඟතාවයට පත් ණය | 1802.05 | |

**ආනයන වියදම්-ඇ.ඩො. මිලියන**

| | 2010 | 2011 |
|---|---|---|
| සීනි | 363.3 | 420.1 |
| අනෙකුත් ආහාර | 962.3 | 1207.4 |
| අනිකුත් පාරිභෝගික භාණ්ඩ | 1228.5 | 1953.9 |
| එයින්-වාහන | 544.5 | 969.8 |
| ඛනිජ තෙල් | 3018.7 | 4698.4 |
| පොහොර | 240.5 | 366.5 |
| රෙදිපිළි | 1723.3 | 2221.2 |
| අතරමැදි භාණ්ඩ | 2114.5 | 3143.1 |

## 5 පිටුවෙන් නිදහස් අධ්‍යාපනය.....

ඕනෙ දේකට ඔළුව නවන



පාර්ලිමේන්තුවේ 2/3 පාවිච්චි කරලා පනත සම්මත කරගැනීම තමයි ආණ්ඩුවේ අපේක්ෂාව. එදා ජේ.ආර්. කළා වගේම පෞද්ගලික විශ්වවිද්‍යාල දාන කොට රාජ්‍ය විශ්වවිද්‍යාල දුබල කිරීමේ අරමුණින් මෙදා එම්. ආර්. ගේ අයවැයෙනුත් අධ්‍යාපනයට වෙන් කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට දෙකට වඩා අඩු කරල තියෙනව.

ඒ නිසා මේ සියලු ගැටලුවලට මූලය අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතන වල ප්‍රතිපත්ති අනුව හැසිරෙන නව ලිබරල් ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියයි. පෞද්ගලික විශ්ව විද්‍යාල බිහිවීම වළක්වන්න නම් මේ ආර්ථික ප්‍රතිපත්තිය කරපින්නාගෙන යන ආණ්ඩු පැරදවිය යුතු බව අපේ රටේ ජනතාව තේරුම් ගත යුතුයි.

**නියමුවා**

***ආණ්ඩුව අයවැය මගින් අධ්‍යාපනය සඳහා වෙන්කරන මුදල් කප්පාදු කිරීම ප්‍රවණතාවයක් බවට පත්වෙලා. මෙකී තත්වය ඔබ හඳුනාගන්නේ කොහොමද?***

**නලින්ද සහෝදරයා**

දියුණු වෙමින් පවතින රටවල අධ්‍යාපනය උදෙසා අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හයක්වත් වෙන් කළ යුතු බව ලෝකයේ පිළිගත් සම්මුතියයි. එහෙත් අප ගතකරමින් සිටින ආර්ථික ප්‍රතිපත්තිය තුළ කිසිදා සීයයට හයක් තබා ඊට ආසන්න ප්‍රමාණයක්වත් වෙන්වුණේ නැහැ. නිතරම එම අගය සියයට දෙක වටා තමයි තිබුණේ. ඒ නිසා විශ්වවිද්‍යාල තුළ නිරන්තරයෙන්ම භෞතික පහසුකම්වල හිඟය, ආචාර්යවරුන්ගේ හිඟය, මහපොළ/ශිෂ්‍යාධාර වාරික ප්‍රමාණවත් නොවීම අත් විඳින්නට ලැබුණා. පසුගිය කාලෙ ආණ්ඩුව කිව්වෙ යුද්ධෙ නිසා අධ්‍යාපනයට මුදල් වෙන්කරන්න බැහැ කියලා. යුද්දෙ ඉවර වෙලා මාස 30 ක් ගත වුණාට පස්සෙ ඉදිරිපත් කරපු මෙවර අයවැයෙන් යුධ වියදම් ලෙස රුපියල් කෝටි 22,000 ක් වෙන් කරද්දි අධ්‍යාපනයට වෙන්කරල තියෙන්නෙ ඒ ප්‍රමාණයෙන් සියයට දහයයි.

පාසල් පද්ධතිය තුළත් ගැටලු ගණනාවක් තියෙනවා. මේ වන විට දින හතරකට වතාවක් රටේ කොහේ හෝ පාසලක් වැහෙනවා. අධ්‍යාපනය නොමිලයේ දෙනවා යැයි 'ආඩම්බරකාර තාත්තා' පම්පෝරි ගැහුවාට අධ්‍යාපනයේ බරින් සැලකිය යුතු වියදමක් දරන්නේ දෙමව්පියන්. ඒ ඔවුන් ගෙවන බදු කන්දට අමතරව. දැන් ලෝක බැංකුව හා පර්සි මහේන්ද්‍ර ජනාධිපතිවරයා අතර ඇතිවූ එකඟතාවයන් අනුව ඩොලර් කෝටි 60ක ලෝක බැංකු ණයක් සඳහා රටපුරා පාසැල් 4000ක ප්‍රාථමික අංශ වහන්න ආණ්ඩුව සූදානම්. 'සපිරි පාසැල් දහස' කියා ආණ්ඩුව කියන්නෙ මේ ව්‍යාපෘතියටයි.

තමන්ගේ බලය පවත්වාගෙන යන්න ජනතාව රැවටීම මේ ධනපති පාලකයන්ගෙ උපන්ගෙයි ලක්ෂණයක්. රට රවටන සාස්තරේ වර්තමාන ජනාධිපතිවරයා හොඳින් ප්‍රගුණ කර තිබෙනවා. ඔහු මේ රටේ ඉහළම බුද්ධිමය සම්පත වන විශ්වවිද්‍යාල ආචාර්යවරුනුත් රැවැට්ටුවා. අධ්‍යයන කාර්යයට අවශ්‍ය මානසිකත්වයක් පවත්වාගෙන යන්න බැරි තරමට විශ්වවිද්‍යාල ආචාර්යවරු පහළට ඇද වට්ටලා, ඔවුන් ස්වේච්ඡාවෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල අතහැරල යන තැනට පත්කිරීම ආණ්ඩුවේ අරමුණයි. පර්සි මහේන්ද්‍ර ජනාධිපතිවරයාට IMF එකට එකග වූ කොන්දේසි ඉටුකරන්න - එනම් රාජ්‍ය විශ්වවිද්‍යාල බෙලහීන කරල පෞද්ගලික විශ්වවිද්‍යාල ශක්තිමත් කරන්න - එවිට අවස්ථාව ලැබෙනව.

**නියමුවා**

***සමස්ත ප්‍රශ්නවලට එරෙහිව ලාංකේය ශිෂ්‍ය ප්‍රජාව පෙළගැස්වීමට සමාජවාදී ශිෂ්‍ය සංගමයට ඇති වැඩපිළිවෙළ පැහැදිලි කළොත්..***

**නලින්ද සහෝදරයා**

අධ්‍යාපනය පෞද්ගලීකරණයට එරෙහිව සටන් කරනකොට ශිෂ්‍ය ව්‍යාපාරයට ආණ්ඩුවේ මර්දනයටත් මුහුණ දෙන්න සිදුවෙනවා. මර්ධනය ධනපති ආණ්ඩුවල ස්වභාවය. ඒ අනුව මේ ආණ්ඩුවත් විශ්වවිද්‍යාල තුළ 'රක්නා ලංකා' කුලී චරපුරුෂ සේනාංක පිහිටුවන්නත් විශ්වවිද්‍යාල තුළ පොලීසි පිහිටුවන්නත් තමන්ට ගැති පාලන අධිකාරීන් යොදවල ශිෂ්‍ය සංගම් සීල් තියන්නත් ශිෂ්‍යයින්ගෙ පංති තහනම් කරන්නත්, ඔවුන් අත්අඩංගුවට ගෙන හිරේ දාන්නත් යාපනයේ දී නම් මැර ප්‍රහාර එල්ල කරන්නත් තමන්ගේ පච මාධ්‍ය යොදාගෙන ශිෂ්‍ය ව්‍යාපාරයට අවලාද ගහන්නත් කටයුතු කරලා තියෙනව.

අධ්‍යාපන පෞද්ගලීකරණයට එරෙහි සටන ශිෂ්‍ය ව්‍යාපාරයේ හුදෙකලා සටනක්නොවෙයි.හුදෙකලාභාවය ධනපති ආණ්ඩුවේ මර්දනයට පාර කපනවා. සටන්කාමී බලවේග අසමගි කරලා, හුදෙකලා කරල අරගල මොට කිරීම අධිරාජ්‍යවාදයේත් ධනපති පංතියේත් වුවමනාවයි. ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරයේ කීර්තිමත්ම සංධිස්ථානය වන 'උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කිරීමේ අරගලය' ජයග්‍රහණය කළේ හුදෙකලා ශිෂ්‍ය අරගලයකින් නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණේ පැහැදිලි නායකත්වය, ප්‍රගතිශීලී සටන්කාමී බලවේගවල ඒකාබද්ධතාවය හා බහුජනතාවගේ අඛණ්ඩ සහයෝගීතාවය නිසයි.

අධ්‍යාපන පෞද්ගලීකරණය පරදවා නිදහස් අධ්‍යාපනය රැකගත හැක්කේ, සමාජවාදී සමාජ ක්‍රමයක් තුළ පමණයි. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ දිගු දුර අරමුණ සමාජවාදයයි. වැඩකරන ජනතාවට බලය ලබා ගැනීම සඳහා යන ගමනේදී ශිෂ්‍ය බලවේග සංවිධානය කිරීම අපට පැවරී ඇති වගකීමයි. ඒ සඳහා යන ගමනේ දී ධනපති පංතිය ශිෂ්‍ය ව්‍යාපාරය මර්දනය කිරීමට උත්සාහ කරාවි., නිර්ධන පංති ව්‍යාපාරයේ අභ්‍යන්තර සතුරන් ශිෂ්‍ය ව්‍යාපාරය හුදෙකලා කිරීමට, අසමගි කිරීමට, භේද කිරීමට උත්සාහ කරාවි. එහෙත් ඒ සියලු බාධක මැඩගෙන අපගේ අවසන් අරමුණ දක්වා නිර්ධන පංති පක්ෂයේ - ජනතා විමුක්ති පෙරමුණේ - නායකත්වය යටතේ ශිෂ්‍ය ව්‍යාපාරය පෙළ ගැස්වීමට සමාජවාදී ශිෂ්‍ය සංගමය සූදානම්.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත



464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## අර්බුද විසඳීමද? ඒ මත ජීවත්වීමද?

ජනතාව මුහුණ දී සිටින ලොකු කුඩා කිසිදු අර්බුදයකට විසඳුම ලබාදීමට ධනවාදය අසමත් බවත් එයට කළ හැක්කේ, අර්බුද නිර්මාණය කිරීම හා ඒ මත සිය පාලනය පවත්වාගෙන යාම පමණක් බවත් මේ වන විට ධනවාදය ඇති තරම් ඔප්පු කර තිබේ. එසේ වුවද තවදුරටත් අර්බුද සිය පැවැත්ම කරගැනීම හැර අර්බුදවලට විසඳුම් සොයන බව හඟවමින් ''දවස ගෙවා ගැනීම'' හැර අන් විකල්පයක් ධනවාදයටත් ධනපති ආණ්ඩුවලටත් නැත.

ලංකාවේ ජාතික ගැටලුවට විසඳුම් සෙවීම සඳහා පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවක් පත්කිරීමට රාජපක්ෂ ආණ්ඩුව තීරණය කර තිබේ. දැනගන්නට ලැබෙන ලෙසට එහි මුළු සාමාජික ප්‍රමාණය 31ක් වන අතර ආණ්ඩු පක්ෂයෙන් මන්ත්‍රීවරු 19කින් හා විපක්ෂයේ මන්ත්‍රීවරු 12කින් එය සමන්විත වේ. මෙම සටහන ලියන මොහොත වන විටත් එ.ජා.ප.ය හෝ දෙමළ ජාතික සන්ධානය මීට සහභාගි වන්නේද යන්න තීරණය කර නැති අතර මෙම ප්‍රෝඩාවට හවුල්වීම ප්‍රතික්ෂේප කරන ජ.වි.පෙ. ඊට සහභාගි නොවීමට තීරණය කර තිබේ.

ලංකාවේ ජාතික ගැටලුවට විසඳුම් සෙවීම සඳහා යයි පත්කළ කමිටු, සභා හා පැවැත්වූ සාකච්ඡා ගණන අපමණය. මෑත ඉතිහාසය ගත්විට 1985 තිම්පු සාකච්ඡාවල සිට, වටමේස සාකච්ඡාවල සිට පසුගිය කාලයේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කැඳවූ සර්වපාක්ෂික සමුළුව හා සර්වපාක්ෂික කමිටුව දක්වා මේ ප්‍රමාණය අතිවිශාලය. හැම ආණ්ඩුවක්ම එවැනි 'සාකච්ඡා' හා 'කමිටු' මගින් ප්‍රශ්නය මත ජීවත් වූව මිස, තම දවස් ගෙවා ගත්තා මිස, තම වගකීමෙන් ඇඟ බේරා ගැනීමට උත්සාහ කළා මිස ජාතික ගැටලුවට විසඳුමක් ඉදිරිපත් කළේ නැත.

පංතිමය හේතුමත ඇතිවූ ප්‍රශ්නවලට, ඇත්තේ පංතිමය විසඳුම්ය. ප්‍රතිවිරුද්ධ පංති සහිත සමාජයක, සියලු දෙනාටම එකඟවිය හැකි විසඳුම් නැත. එවැන්නක් තිබියද නොහැක. ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන්ද එය එසේමය. එය ධනපති ආණ්ඩු නොදන්නවා නොවේ. මේ පිළිබඳව ධනපති කණ්ඩායම් අතර පවා වෙනස්කම් පවතී. එසේ තිබියදී ජාතික ගැටලුව විසඳීමට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කරනුයේ ප්‍රශ්නයට සැබෑ විසඳුමක් සොයාගැනීමට නොව ආණ්ඩුව තම වගකීමෙන් ගැලවීමටත්, අර්බුදයේ වගකීම අන් අය මත පැටවීමටත් සාකච්ඡා පවත්වමින් කාලය ගතකිරීමටත් දවස ගෙවා ගැනීමටත්ය. රාජපක්ෂ ආණ්ඩුව මේ සඳහා දැන් තේරීම් කාරක සභාවක් පත්කර ඇත්තේ මීට පෙර තමන් විසින්ම කැඳවූ සර්වපාක්ෂික සමුළුව හා ඊනියා සර්ව පාක්ෂික කමිටුව (එම කමිටුව සර්ව පාක්ෂික වූයේ නැත) සකස්කළ යෝජනා හා වාර්තා ගැන කිසිදු පැහැදිලි කිරීමක්ද නැතිවය.

පසුගිය ජනාධිපතිවරණය සමයේ මහින්ද රාජපක්ෂ මහතා පැවසුවේ තමන්ට ජාතික ප්‍රශ්නය සඳහා විසඳුමක් තිබෙන බවත් තමන් යළි ජනාධිපතිධුරයට පත්කළ විට එය ක්‍රියාවට නගන බවත්ය. ඉන් පසු පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ආණ්ඩුවේ නායකයින් කියා සිටියේ ජාතික ගැටලුවට විසඳුමක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සතුව තිබෙන බවත් එය ක්‍රියාවට නැගීමට 2/3 ක බලයක් අවශ්‍ය බවත් එය ලබාදෙන ලෙසත්ය. දැන් ආණ්ඩුවට කෙසේ හෝ 2/3 බලයද තිබේ. එහෙත් ජනාධිපතිවරයාගේ හෝ ශ්‍රීල.නි.ප.යේ 'විසඳුම' තවම ඉදිරිපත් වූයේ නැත. දැන් ඒ වෙනුවට යළි 'කතා සාප්පුවක්' හැදීමට තීරණය කොට තිබේ. සැබවින්ම දැන් වහාම කළ යුත්තේ, ආණ්ඩුව සතුව ඇතැයි කියන 'විසඳුම' රටට ඉදිරිපත් කිරීමය. එය ඉදිරිපත් නොකොට 'හොරගල් ඇහිලීම' තේරුමක් නැත.

තම පංති අරමුණු හෝ ආණ්ඩුවේ වුවමනාවන් සඳහා අවශ්‍ය වන තීරණවලදී නම් ආණ්ඩුවට තේරීම් කාරක සභා හෝ සංවාද අවශ්‍ය වන්නේ නැත. එවිට පාර්ලිමේන්තුවේ 2/3 පාවිච්චි කරගෙන එවැනි නීති සම්මත කර ගනියි. විධායක ජනාධිපති ක්‍රමයේ වාර දෙකේ සීමාව ඉවත් කරගැනීමට වුවමනා වූ විට ඒ සඳහා පාර්ලිමේන්තුවේ 2/3 යොදාගෙන 18 වන සංශෝධනය සම්මත කර ගැනීමට ආණ්ඩුව කටයුතු කළේය. ඒ, ජනතා විරෝධයද නොතකාය. එසේම පසුගියදා සම්මත කරගත් පාඩු ලබන ව්‍යාපාර පවරා ගැනීමේ පනත සම්මත කරගැනීමේදීද ආණ්ඩුව පුදුමාකාර හදිසියක් පෙන්නුවේය. එවැනි අවස්ථාවල ඇති හදිසිය හා වුවමනාව ජාතික ප්‍රශ්නය විසඳීමට තම විසඳුම ක්‍රියාවට නැගීම සඳහා ආණ්ඩුවට නැත. එය සත්‍ය වශයෙන්ම ආණ්ඩුවට මේ සඳහා පැහැදිලි විසඳුමක් නැති කමත්, ආණ්ඩුවේ ඊනියා විසඳුම 'බලය බෙදීම' වන බැවින් එය ඉදිරිපත් කිරීමට තරම් ධෛර්යයක් ආණ්ඩුවට නොතිබීමත් නිසාය.

මේ මොහොතේ උතුරේ හා නැගෙනහිර ජනතාව මුහුණපා සිටින තවමත් විසඳා නැති ඉතාම බරපතළ ගැටලුවලට විසඳුම් ලබාදීමට තේරීම්කාරක සභා අවශ්‍ය වන්නේ නැත. අවශ්‍ය වන්නේ ක්‍රියාත්මක වීම පමණි. උතුරේ අවතැන්වූවන් යළි පදිංචිකිරීමට, ඔවුන්ගේ ජීවන තත්වය නඟා ලීමට යුද්ධයෙන් විපතට පත්වූවන්ට වන්දි ලබාදීමට, දේශපාලන සිරකරුවන් නිදහස් කිරීමට, උතුරේ සිවිල් පරිපාලනය ස්ථාපිත කිරීමට තේරීම්කාරක සභා අවශ්‍ය වන්නේ නැත. ඒවා යුද්ධය නිමාවීමෙන් පසු මේ වන විට විසඳා අවසන් කළ යුතුව තිබූ ගැටලුය. එවැනි අත්‍යාවශ්‍ය සරල ගැටලුවලට පවා විසඳීම් නොදී හිතුවක්කාරී ලෙස කටයුතු කරන ආණ්ඩුව ජාතික ප්‍රශ්නයට විසඳුම් සෙවීමට යයි තේරීම්කාරක සභා පත්කරනුයේ අවංක චේතනාවෙන් නොවන බව ඉතා පැහැදිලිය. එබැවින් ආණ්ඩුවේ මෙම ප්‍රෝඩාවට කිසිවෙකු දායක වියයුතු නැත.

දැන් සිංහල දෙමළ මුස්ලිම් සියලු ජනතාව කළ යුත්තේ, ආණ්ඩුවේ මෙම ප්‍රෝඩාවට තේරුම් ගැනීමත් එය ප්‍රතික්ෂේප කිරීමත් උතුරු හා නැගෙනහිර ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට වහාම විසඳුම් ලබාදෙන ලෙස ආණ්ඩුවට බලකිරීමත් ජාතික ගැටලුව සඳහා 'ආණ්ඩුවේ විසඳුම' වහා ඉදිරිපත්කරන ලෙස ආණ්ඩුවට බල කිරීමත්. ජාතික ප්‍රශ්නය පංති ප්‍රශ්නය තුළ විසඳීම සඳහා ධනවාදයට එරෙහිව පෙළගැසීමත්ය.

## බාධක දමා නවතාලිය නොහැක රළ...

රැකියා විරහිතව මහ මඟට වැටුණු උපාධිධාරීන්, තරුණ තරුණියන් සහ කම්හල් වසා දැමීම නිසා රැකියා අහිමි වූ කම්කරුවන් ජීවත්වීම සඳහා දරන අරගලය ආණ්ඩුවට ඇසෙන්නේ හෝ පෙනෙන්නේ නැත. නොඑසේනම් නොඇසූ නොදුටූ විරුව සිටිනවා විය යුතුය. ආණ්ඩුවේ තක්කඩි පිළිවෙතට එරෙහිව වීදියට බැසීමට තරුණ තරුණියන් තීරණය කරන්නේ, තම හඬ යවුලක් කොට ඇණ ආණ්ඩුවේ කන් පාදන්නටය. කඳුළු ගෑස්, පොලු ප්‍රහාර, ජල ප්‍රහාර එල්ලකර යකඩවැට දමා ඒ හඬ යටපත් කරන්නට ආණ්ඩුව ගත්තේ නිරර්ථක උත්සාහයකි. මේ ඡායාරූප කියාපාන්නේ,



පසුගිය නොවැම්බර් 30වැනි දින සමාජවාදී තරුණ සංගමය විසින් කොළඹදී සංවිධානය කරන ලද විරෝධතා උද්ඝෝෂණයේ අවස්ථා කිහිපයකි.

## ජ.වි.පෙ. හා සයිප්‍රස් කොමියුනිස්ට් පක්ෂය අතර සබඳතා තරවෙයි



ඉල් සමරු කිහිපයක් සඳහා විදෙස් ගත වූ ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා 2011 නොවැ. 24 දින සයිප්‍රසයේ පාලක පක්ෂය වන ප්‍රගතිශීලී කම්කරු පක්ෂයේ (ඒකැබ) ප්‍රධාන ලේකම් දිමිත්‍රෝස් කිප්‍රියානෝ සහෝදරයා සමග විශේෂ හමුවකට සහභාගි වූ අතර එහිදී ජාත්‍යන්තර දේශපාලන තත්වයන් ඇතුළු තවත් විෂයන් ගණනාවක් පිළිබඳව සාකච්ඡා පැවැත්වා තිබේ.

විශේෂයෙන්ම සයිප්‍රස් ජාතික ප්‍රශ්නය නායකයන් දෙදෙනාගේ දීර්ඝ සාකච්ඡාවට භාජනය වූ අතර වෙන් වුණු සයිප්‍රසය යළි එක්කිරීම සඳහා සයිප්‍රසයේ ජනාධිපති 'ඒකැබ පක්ෂයේ හිටපු ප්‍රධාන ලේකම් ක්‍රිස්තෝනියාස් සහෝදරයා විසින් දියත් කරනු ලැබ ඇති ධෛර්යමත් වැඩපිළිවෙළ සෝමවංශ අමරසිංහ සහෝදරයාගේ අගය කිරීමට ලක්විය. බෙදුණු සයිප්‍රසය එක්කිරීම සඳහා ක්‍රිස්තෝනියාස් සහෝදරයා විසින් යෝජනා කරනු ලැබ ඇති සන්ධීය ක්‍රමය මත පදනම් වූ ක්‍රමයට ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් සෝමවංශ අමරසිංහ සහෝදරයා පූර්ණ සහාය පළකළේය. ලෝක ආර්ථික අර්බුදය පිළිබඳවද නායකයන් දෙපළ අතර සාකච්ඡා විය.

මීට අමතරව සයිප්‍රසයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා සාකච්ඡා කළ අමරසිංහ සහෝදරයා සයිප්‍රසයේ රැකියා කරන ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු කළේය. එයට අමතරව ශ්‍රී ලංකාවේ දෙමව්පියන්ගේ සයිප්‍රසයේ උපන් දරුවන්ට අඩු වශයෙන් වයස අවු. 18 ගෙවෙන තුරු හා ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු අවසන් කරගන්නා තුරු ඔවුන්ගේ දෙමව්පියන්ට සයිප්‍රසයේ රැඳී සිට රැකියා කිරීමට ඉඩ දෙන ලෙස අමරසිංහ සහෝදරයා ඉල්ලා සිටියේය. මෙම ප්‍රශ්නය සානුකම්පිත පදනමක පිහිටා සලකා බැලීමට අමාත්‍යාංශය එකඟ විය.

## විදෙස් ඉල් සමරු ඉහළින්


















**නියමුවා නවතම ප්‍රකාශනය**




ආධාරය රු. 100.00


## වත්කම් පනත ගෙනා විදිහත් වැරදියි අඩංගුවත් වැරදියි

**- අනුර දිසානායක සහෝදරයා**




ආණ්ඩුවේ බහුතර බලය උපයෝගී කරගෙන 'ඌන සංවර්ධන හා ඌන උපයෝජන වත්කම් රජයට පවරාගැනීමේ පනත' සම්මත කර ගැනීම හිතුවක්කාරී තක්කඩි ක්‍රියාවක් බවත් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීමේ ක්‍රියාමාර්ගයත් පනතේ අන්තර්ගතයත් යන අංශ දෙකම ජ.වි.පෙ. විසින් හෙළාදකින බව දේශපාලන මණ්ඩල සභික, පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

ඔහු මේ බව පැවසුයේ, එම පනත පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා පසුගිය 6වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකදීය.

පනතේ අඩංගු ''ඌන උපයෝජිත වත්කම්'' යන්න පිළිබඳ පැහැදිලි කරමින් අනුර සහෝදරයා පෙන්වා දුන්නේ, මෙලෙස නම්කරන ඕනෑම වත්කමක් හෝ ව්‍යාපාරයක් ගැසට් කිරීමෙන් රජයට පවරාගෙන තම හිතවතුන්ට පවරාදීමේ අනතුර ඇති බවය. මේ සියල්ල තීරණය කරන්නේ විධිමත් මණ්ඩලයක් විසින් නොව තනි පුද්ගලයෙකු විසින් බවද එය හිට්ලර් පන්නයේ රෝබට් මුගාබේ පන්නයේ ලක්ෂණයක් බවද ඔහු හෙළි කළේය.


කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.